බෙන්තර වලල්ලාවිටි කෝරළේ

ගුරු සඞ්ගමයේ

සභාවාරයන්හි කියවන ලද

# ශාස්ත්‍රීය ලිපි.

---

# Papers On Educational Topics

Read At The Meetings

of

*Bentota Walallawiti Korale*

***TEACHERS' ASSOCIATION.***

---

Printed At The Vidya Vilasa Press

**ALUTGAMA.**

---

***1934.***

## CONTENTS.

1. History of Sinhalese Literature.

2. History of Education in Ceylon.

3. Natural Regions of the World.

4. Usage of ණ and න.

5. Insects.

6, Teaching Through Games.

7. Sinhalese Poetry.

8, Water Supply in Ancient Ceylon.

# සංඥාපනය.

බෙන්තර වලල්ලාවිටි කෝරළයෙහි අධ්‍යාපන කටයුතු දියුණුකාරලීම්වස් එම කොටස භාර පාඨශාලා පරීක්‍ෂක **ඒ. එච්. පී. සී. සිල්වා මැතිතුමන්** විසින් වර්‍ෂ 1930 ක්වූ පෙබරවාරි මස 15 වෙනි දින ආරබ්ධ බෙන්තර වලල්ලාවිටි කෝරළයේ ගුරු සඞ්ගමය යථෝක්ත කොට්ඨාසයෙහි ආචාර්‍ය්‍ය මණ්ඩලයට හා ශිෂ්‍ය සමූහයාට විශේෂ අභිවෘද්ධියක් කළාය යනු ප්‍රකට කරුණකි.

අපගේ එම සංස්කෘතීන් අතර සාමාජික භවතුන් විසින් ඇතැම් සභාවාරයන්හි කියවනලද ශාස්ත්‍රීය ලිපිද ප්‍රමාණවත් ගණනක් වූහ. ඉන් විශේෂයෙන් ප්‍රයෝජනවත්යයි සලකනු ලැබූ ලිපි සමහරක් පොතක් වශයෙන් මුද්‍රණයකොට (චතුර්ථ සාංවත්සරිකෝත්සව දිනයෙහි) බෙදා හැරීම ශාස්ත්‍ර සඞ්ග්‍රහයක් වන්නේයයි තීරණය කරණලද සාමාජික භවතුන්ගේ පරෝප කාරී අධ්‍යාශය මෙම පුස්තකයේ නිෂ්පාදනයට හේතු භූත විය.

මේ ලිපි කර්තෘන් විසින් ඒවායේ උද්දීපනීය ඇතිකරනු වස් නොයෙක් ග්‍රන්ථයන්ගෙන්ද ශිලාලිපිවලින්ද පැරණි ලියවිලිවලින්ද විද්‍යාවිඥයින්ගේ මහගු අදහස් වලින්ද කරුණු උපුටා බහා තිබීම මෙය කියවන්නන්ගේ ප්‍රසාදයට හේතුවන අතරම කනිෂ්ඨ ජ්‍යෙෂ්ඨ ආදී ස්වභාෂා විභාගයන්ට සැරසෙන ආධුනිකයන්ට මහත් ශාස්ත්‍ර සඞ්ග්‍රහයක්ද වනු නොඅනුමානය.

මේ ග්‍රන්ථයේ අන්තර්ගත ලිපි සම්බන්ධ වගකීම් ඒ එකිනෙක සම්පාදිත කර්තෘන්ම මිස සමිතිය නොවන බව මෙහි සඳහන් කරම්හ.

තවද මෙම පොත පිළියෙල කිරීමේදීද මුද්‍රණයේදීද මනා අවවාදානුශාසනා දීමෙන් උපස්තම්භකවූ අප සමිතියේ සභාපති තුමන්ට හා අවශේෂ නිලධාරිමණ්ඩලයටද මුද්‍රණ වැඩ නියමිත කලට නිසි සේ කරදුන් විද්‍යාවිලාස මුද්‍රණාලයෙහි කාර්‍ය්‍යමණ්ඩල යටද අපට සහභාගීවූ අන්‍ය සියලු භවතුන්ටද අපගේ අවංක ස්තුතිය හිම්බැව් අවසානකොට මෙහි ලා සඳහන් කරම්හ.

මීට-අණපරිදි,

**ජී. පී. ඈම්. සිල්වා,**

ගරු ලේකම්.

*1934. 2. 17.*

බෙන්තර.

බෙන්තොට වලල්ලාවිටි කෝරලේ

**ගුරු සඞ්ගමයේ සභාවාරයන්හි**

කියවන ලද

# ශාස්ත්‍රීය ලිපි.

## සිංහල සාහිත්‍යෙතිහාසය.

බෙන්තොට ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේ ප්‍රධානාචාය්‍ය්‍ය

**සී. ජේ. පොන්නම් පෙරුම මහතා විසින්**

සම්පාදනය කරන ලදි.

මෙහි සිංහලය, සාහිත්‍යය, ඉතිහාසය යන ශබ්දත්‍රයක් පැනේ. ඒ මේ ශබ්දත්‍රයගේ සම්බන්ධයෙන් සිංහල සාහිත්‍යෙතිහාස යනු සිඬවේ එහි සිංහල ශබ්දයෙන් එනම් දිවයින (රට) ජාතිය ඝනාදිය ගැනේ. සාහිත්‍යශබ්දයෙන් සම්‍යක් හිතයාගේ භාවය යන අර්ථවිසින් පරස්පර සාපෙක්‍ෂවූ තුල්‍ය රූපවත් එකක්‍රියාන්වයිත්වාදිය ගැනේ ඉතිහාස ශබ්දයෙන්

ධර්මාර්ථ කාම මොක්‍ෂාණාං–මූපදෙශ සමන්විතම්
පූර්වවෘත්ත කථා යුක්ත මිතිහාසං ප්‍රචක්‍ෂතෙ යි.

කියනලද ලක්‍ෂණ ඇති පුරාවෘත්ත ප්‍රකාශක ග්‍රන්ථය යනු ගැනේ.

මෙසේ හෙයින් සිංහලයන්ගේ හෝ සිංහල දිවයිනෙහි හෝ සාහිත්‍යය, සිංහලසාහිත්‍යය නම්. ඒ පිළිබඳ ඉතිහාසය (පුරාවෘත්ත ප්‍රබන්ධය) සිංහල සාහිත්‍යෙතිහාස නම්වේ,

මෙයින් සිංහල සාහිත්‍යයන් පිළිබද ඉතිහාසය නොහොත් භාෂාව පිළිබඳ පුරාවෘත්තය ප්‍රකාශවේ. හේ වනාහි සිංහල රටේ ග්‍රන්ථ ශාස්ත්‍ර දියුණුවද පඬිවරුන්ද පිළිබඳ වේ. සිංහල භාෂාව විජය ආදි කොට ඇති පිරිසගෙන් ආරම්භවූ නිසාත් දඹදිව ඇතැම් රජුන් ගැනද, පඬිවරුන් ගැනද පාලි, සංස්කෘතාදි ග්‍රන්ථයන් ගැනද සඳහන් කරන්ට සිදුවේ.

ශ්‍රී ලංකා ජාතික

විජය රජුගේ පැමිණීමෙන් පෙරපැවති යක්ෂාදී භාෂාවල් විනාශවූ නමුත් සමහරක් මිශ්‍රව අදත් ව්‍යවහාරයෙහි පවත් නේවේ. දෙල්, කොස්. ආදිය නිදර්ශනයි. දෙල් යන්න පාලි යෙහි ලබුජ යනුයි.

ශාස්ත්‍රානුකූල කර්මාන්තද, අන්‍යජාතීන්ගේ සංචාරයද නුගතුන්ද අපේ ශබ්දකොෂය දියුණුවීමට හේතුවිය. මිහිඳුමාහිමි යන්ගේ වැඩම වීමෙන් පසු පාලිභාෂාවේ ව්‍යාප්තියත් ලංකා වාසී න්ගේ දඹදිව් ගමන සහ දඹදිව බ්‍රාහ්මණාදීන් මෙහි ආ ගමනයත්, ඇතිවූ පසු සංස්කෘත ප්‍රාකෘතාදී භාෂාවන්ගේ ව්‍යවහාර වීමත්, මෙයට නිදසුන් වේ.

භාෂාවක් එකවරම සම්පූර්ණ නොවේ. ජපන් භාෂාවද තවමත් සම්පූර්ණනොවූ බව ගෙයක් හැඟවීමට ගෙයක සටහ නක්, බත හැඟවීමට ගෙය සහ සැලියක සටහනක්, යෙදී මෙන් ඔප්පුවේ අපේ සිංහල භාෂාවද එසේම අසම්පූර්ණය ඊට හේතු සලකතොත් විදෙශිකයන්ට මේ දිවයින අත්පත්වූ තැන් සිට රාජකීය භාෂාවක් නොවීමත් ආණ්ඩුකිරීමේ මාර්ගයක් නැතිකමත් සෑම රාජකාර්‍යයන් අන්‍ය භාෂාව කින් කිරීමත් පුරාණ ග්‍රන්ථයන්ගේ පිරිහීයාමත් අභිනව ග්‍රන්ථොත්පාදිතයන් දුලබ වීමත් රාජකීය භාෂාවටම ප්‍රධාන වශයෙන් සැලකීමත් කාරණා වශයෙන් පෙනේ.

"**සිංහල භාෂාව**:– මෙය දඹදිව ලාට රට සිංහපුරයෙහි හෙවත් කාලිනම් නදිය අසබඩ පිහිටි කනෞජ ප්‍රදෙශයෙහි වැඩි දුරටත් කියත්හොත් කාලිංග, වංග, මගධ, යන තුන් රටට සමීප ප්‍රදෙශයේ "සිංපුරම්" නුවර විසූ සිංහබාහු රජකුමර සිංහයා ලානය ආදානය කෙළේනුයි සිංහල නම්විය. ඒ අන්වර්ථනාමොප ලක්ෂිත සිංහබාහු රජුගේ පුත් විජය රජුද සුමිත්‍ර රජුද ඔහු පුත් පඬුවස්දෙව් රජුසහිත ඔහුගේ පරම්පරාව සිංහල නම්විය. එහෙ යින් මේ දිවයින සිංහල විපය නමින්ද එහි ජනිතවූවෝ සිංහල නමින්ද ඔවුන්ගේ භාෂාව සිංහල භාෂාව නමින්ද ප්‍රකට වූහ. මෙය දෙශීය මාගධී භාෂාවට ආසන්න භාෂාවක්ය, යනු ශ්‍රේෂ්ඨ පඬිවරයන්ගේ නිගමනයවේ. කලින් හෙලදිව් පැවති යක්ෂ, නාග, අසුරාදි භාෂාවන් හා මිශ්‍රද වෙමින් රටේ තත්ත්වයට අනුව වෙනස් විය.

විෂ්ණු, සමන්, කතරගම, යන දෙවප්‍රධානීන්ගේද දෙවශස්ත්‍ර හෙවත් දෙශාස්ත්‍ර කළුතර සිට පිහිටි රටදක්වා පරිච්ඡින්න මායා රටෙහි ප්‍රධාන භාරය උසුලන අසුර ප්‍රධානීන්ගේද, රාවණා, කුම්භ,

කාණී, සුපණී, ආදී රාක්ෂස ප්‍රධානීන්ගේද ශ්‍රී වසතුපුර, ලගල, ලොගගල, ආදියෙහි සිටි, යක්ෂප්‍රධානීන්ගේද, චූලොදර, මහොදර, ආදී නාග ප්‍රධානීන්ගේද භාෂාද ක්‍රමයෙන් මාගධිප්‍රාකෘතයට එක්ව සිංහලභාෂා නම්විය.

**මාගධී භාෂාව:**– මගධ රට උපන් හෙයින් එය මාගධි භාෂා නම්විය. දෙශීය මාගධිය හා ශුඩ මාගධියයි විප්‍රභෙදවේ. බුඩ භාෂිතය ශුඩ මාගධියෙන් යුක්තය.

ශුඩ මාගධි පහළවන්නේ බුදු කෙනෙකුන්ගේ පහළ වීමෙනි. එමෙන්ම පරිනිර්වාණයෙන් පසු ශුඩ මාගධියද අතුරුදන් වීය. දඹදිව ප්‍රකෘතිභාෂාව ප්‍රාකෘතනම්. එය ප්‍රචීන මාගධිය සහ ප්‍රතිචීන මාගධියයි සාමාන්‍යයෙන් විභෙදවේ. වංගදෙශීය භාෂාවද මේ ප්‍රාචීන මාගධිය බැවින් විජය රජුගේ භාෂාවත් එයම විය යුතුයි. එබැවින් ලක්දිවට පැමිණි භාෂාවද ප්‍රාචීන මාගධි කොටසක් විය යුතුයි.

**සංස්කෘත භාෂාව:**– කාශ්‍යප බුදුන්ගේ ශාසනාන්තර්ධානයේදී ජීවත්ව සිටි වශිෂ්ඨාදී බාහිර තපසුන් අටදෙනෙක් එකතුව පාලි ධර්මය සංස්කරණය කරනලද යම් භාෂාවක්වේද එය සංස්කෘත නම්වේ ලඞ්කාව, සිංහපුරය, මිදුරාසිය, යන තුන්ප්‍රදෙශයේ සම්මිශ්‍රනයෙන් සිංහල භාෂාව සැදුනේ යනු ඇතම් පඬිවරුන්ගේ මතයයි.

සිංහල භාෂාවේ කොෂය:– සිංහල භාෂාව වනාහි විජය රජු පිරිසේ භාෂාවත් යක්ෂ, නාග, භාෂාවල් සහ රාම රාවණාසාල විසූ රිළවු, වඳුරු, වලස් ආදීන්ගේ භාෂා දහහතකුත් මිශ්‍රනය වීමෙන් සිංහල භාෂාවේ නිෂ්පත්තිය වීයයි සිතිය හැක. පසුකාලවල දඹදිවින් වරින් වර පැමිණි නානා ජාතික යන්ගේ භාෂාද මීට මිශ්‍රවියයි සිතිය හැක.

සිංහල භාෂාව නිෂ්පන්න, තත්සම, තද්භව, යයි තෙවදෑරුම් වේ. විජයාව තරණයටත් ප්‍රථම භාවිතාවූ දෙල්, පොල්, කොස්, කොටියා, හරකා, වලහා, ලිහිණි, ලිඳ යනාදිය නිෂ්පන්න වශයෙනුත් පාලි, සංස්කෘත තෙලිඟු, ද්‍රවිඩාදී භාෂාවන්ගෙන් ලබාගත් වචන තත්සම වශයෙනුත් යථොක්ත භාෂාදියෙන් භින්නව ආ වචන තද්භව වශයෙනුත් සලකනු ලැබේ. සිංහල භාෂාවේ වැඩි වශයෙන් දක්නා ලැබෙන්නේ තද්භව වචනම වේ.

භාෂෙතිහාසය කියනු කැමැත්තේ එහි අක්ෂරොත්පත්තිය ගැනද යමක් සඳහන් කිරීම වටීයයි හැඟෙන බැවින් මෙතැන්සිට සිංහල භාෂාවේ අක්ෂරයන් ගැනද සඳහන් කරන්නෙමි.

අපේ අක්ෂර වනාහි අශෝකාක්ෂර, දෙවනාගරාක්ෂර, ද්‍රවිඩාක්ෂර, යන මෙයින් ප්‍රභව වූ විශේෂයෙකි.

**අශෝකාක්ෂර:–** මේ වර්ගය දම්සෝ රජු විසින් ශිලාලිපිවල කොටවනලද අකුරුයි. එහෙයින්ම අශෝකාක්ෂරයයි නම්වීය. මෙය ප්‍රථමයෙන් "බ්‍රාහ්මී" අක්ෂරනමින් දඹදිව භාවිතාවී තිබේ. එකල ලක්දිව විසූ දෙවන පෑතිස් රජු කල දඹදිවින් පැමිණියවුන් නිසා මෙහිදී ඒ අකුරු ව්‍යවහාර වන්ට විය. ඉන් ඉහත ගල් සන්නස් මෙහි තිබුණු බවක් තවම දැනගෙන නැත. මේ අකුරු ශත වර්ෂයක් පාසාම වෙනස්වීමෙන් දැනට හොඳටම වෙනස්ව පවතී. දැනට ශත වර්ෂයකට ප්‍රථම මාතර වෙහෙරගම්පිට රජමහා විහාරාධිපති **කරතොට ධම්මාරාම ස්වාමීන්ද්‍රයාණන්** වහන්සේ විසින් සිංහල අකුරු පිළියෙල කරන ලද්දේලු.

**අශෝකාක්ෂර භාවිතාවට ආ පරිදි.**

---

දඹදිව පුරාවිද්‍යා ශිලපීන්ට පවා කියවාගන්ට නොහැකිව අත හැර දමා තුබුන අවස්ථාවකදී එනම්, ක්‍රි:ව: 1780, 1790 අතර කාලයේදී "ජේම්ස් ප්‍රින්සැප්" නම් යුධ මූලාදැනිතැන දානං යන්න සිතින් නිශ්චයකර ඊට යෝග්‍ය අකුරුද විනිශ්චයකර ඒ අනුසාරයෙන් අනිත් අකුරුද සොයා ඊට හෝඩියක් පිළියෙල කෙළේය. මේ සඳහා ලංකාවාසියකුගේද උදවු ලැබී තිබේ. ඒනම් මහණව බුරුම රට ගොස් සිටි "**රත්නපාල**" නම් තැනැත්තාය. දානං යන්න වටහා ගත්තෙත් මේ තැනැත්තාවේ. එතැන් පටන් මෙය භාවිතා වට පැමිණියේය. දැනට එංගලන්තයේ විශ්ව විද්‍යාලයන්හි පවා උගන්වනු ලැබේ. නමුත් උතතිය රජුගේ කාලය දක්වා ගල් සන්නස් ලියා නැත. දැනට සොයාගත තිබෙන ඉතා ලොකු පැරණි ලිපිය තිකවැරවියටත් පුත්තලමටත් අතර තෝනිගල ලිපිය වේ.

(කුවේනිය විසින් ලතෝනි ගසනලද බැවින් මේ තොනිගල නම් විලු.)

පුරාණයේදී මේ අකුරු සෘජු රේඛාවිය. ක්‍රමයෙන් ඒවා වක්‍රවී තිබේ. එකල ගල් සන්නස්වල එකාම (1) සෘජුරේඛාවක් පිල්ලම් වෙනුවට යොදා තිබේ.

ලංකාවේ භාෂාව පිළිබඳ කාල මෙසේ කොටස් කළහැක.

එනම්:- 1. පැරණි කාලය, 2. ගද්‍ය සන්නස් කාලය, 3. ගීකාලය, 4. එලිසම කාලය, 5. අලංකාර කාලය, 6. නවීන කාලය යනුයි.

නමුදම - 1. පුරාණ කාලය, 2, අනුරාධපුර රාජධානි කාලය, 3. පොළොන්නරු කාලය, 4. දඹදෙනි කාලය, 5. සීතාවක කාලය, 6. කෝට්ටේ රාජධානි කාලය, 7. පරංගි ඕලන්ද කාලය, 8. නවීන කාලයයයි, අටකටද බෙදේ. මේ අටද ඉහත සඳහන් හයේ අඩංගු බැවින් ඒයටතෙහි කරුණු දක්වන්නෙමි.

**1. පැරණි කාලය:-**

මේ කාලය නම් දැනට අවුරුදු දෙදහසකට පෙරකාලයයි. මේකල ලක්දිව විසූ "වාල්මීකි" වේද පාරගත ඍෂිතෙම ශ්ලෝක විසිපන්දහසකින් යුත් රාමායනය නම් සංස්කෘත ග්‍රන්ථය රචනා කෙළේය. ලෝකයේ මුලින් ශ්ලෝක ඇතිවූයේ මේතුමාගෙන්ලු. ඉන් මුලින්ම ඇතිවූ ශ්ලෝකය මෙසේය.

"මානිෂාද ප්‍රතිෂ්ඨාං ත්ව-මගමඃ ශාශ්වතීඃසමඃ
යත් ක්‍රෞඤ්ච මිථුනාදෙක-මවධීඃ කාම මොහිතම්."

මෙකල සිටි රාවණාද මහාද්‍ර ශාස්ත්‍රාදියෙහිද භූත විද්‍යාවෙහිද ගෘහ නිර්මාන ශාස්ත්‍රයෙහිද ජ්‍යොතිශශාස්ත්‍රයෙහිද රසවිද්‍යා ගණිත විද්‍යා ආදියෙහිද යුද්ධ ශිල්පයෙහිද යනාදී කී කොකී නානා ශිල්ප ශාස්ත්‍රයන්හි නිපුණ වේද පාරගත බහුශ්‍රැත පඬිවරයෙකි. මේ රාවණ පඬිතෙමේ ජ්‍යොතිශශාස්ත්‍රය පිළිබඳ ග්‍රන්ථයක්ද අර්කසංග්‍රහ නම් සංස්කෘත ග්‍රන්ථයක්ද "ඉරාවිනියම්" නම් සංගීත ග්‍රන්ථයක්ද නිෂ්පාදනය කෙළේය. මේ රාවණා රජුගේ ඇමති පඬිවරුද සිටියෝය මින්පසු විජය රජුගේ ගමන වනතුරුත් විජයාභි ගමනයෙන් පසු සිංහල වංශය පිළිියෙළවී කාලක් යන තුරුත් සාහිත්‍යය පිළිබඳ වැදගත් සිඩියක් දැනගන්ට නැත. එසේ නමුත් උන්මාද චිත්‍රාගේ දෙහ ලක්ෂණය බැලූ බ්‍රාහ්මණ පඬිද අභයරජු හා පණ්ඩුල බ්‍රාහ්මණාදී දක්ෂ විචක්ෂණ මහ පඬිවරුන්ද සිටි බැව් පෙනේ.

## 2. ගද්‍ය සන්නස් කාලය.

විජය රජුන්ගේ කාලයේ සිට වර්ෂ 236 ක් ඉකුත් වනතුරු නොහොත් මහින්දාගමනයවූ දෙවන පෑතිස් රජුගේ කාලය වනතුරු

සාහිත්‍යය පිළිබඳ කිසිවක් දැනගන්ට නැත. මිහිඳු මාහිමියාණන් වහන්සේ සිංහලෙන් බුද්ධ ධර්මය දේශනාකළ බැවින් එවකට අපේ ලක්දිව සිංහල භාෂාව එකල ලාට රට භාෂාවට සමාන බැව් සිතිය හැක. මුන්වහන්සේ ත්‍රිපිටක පාලියට අර්ථ කථාවක් ලියා තිබේ. මෙයට මහා අට්ඨකථායයි නම් ඇතිවිය. පණ්ඩරීය, කුරුන්දීය, යන අටුවාද ඒ සමීප කාලයෙහි ඇතිවූවත්, සිංහල ග්‍රන්ථ නිෂ්පාදනයේ මූලස්ථානය මුන් වහන්සේට අත්විය

දෙවන පෑතිස් රජුගෙන් පසු කලක් යනතුරු සිංහල භාෂාවේ දියුණුවක් කියන්ට නැතත් මෙකල සිංහල භාෂාවට බොහෝසේ විෂමවූ වෙනස් වචනයන්ගෙන් යුක්ත ගල්සන්නස් තුබූ බව පෙනේ. මේවායේ අක්ෂරයෝ දෙවනාගරයන්ට සමාන බ්‍රාහ්මණ අක්ෂරයෝය. වර්තමාන පුරා විද්‍යාඥයෝ ඊට අශෝකාක්ෂරයයි නම් කළෝය. එකල භාෂාවේ සමහරක් වචන ගුරුළු ගෝමීන් කළ අමෘත ප්‍රවාහයෙහිද, ධර්මප්‍රදීපිකාවෙහිද දක්නා ලැබෙත්. දෙවන පෑතිස් රජුගේ කාලයට සමීප කාලයෙහි කරනලද පුරාණ සන්නසක වචන **“දෙව රකිතතෙර, අගත, අනගත, චතුදිශ, තිෂශ ලෙනේ, ගහපති නගදුත”** යනාදි වශයෙන් දක්වා තිබේ. මීට සමීප කාලයෙහි සතුරු වියවුල් ඇතිවූයෙන් ශාස්ත්‍රාභි වෘද්ධියක් නොපෙණෙතත් දුටුගැමුණු රජුකල එක් ගමකට නැකැත්තකු, වෙදකු, ධර්මකථිකයකු, තැබීමට තරම් උගතුන් සිටි බවත් තෝනිගල මහා ගල්සන්නස කළ බවත් පෙනේ.

වළගම්බා රජුකල ත්‍රිපිටක ධර්මය පොත්වල ලීවේය. දඹුළු වෙහෙර ගලක් මතුයෙහි කොටන ලද **“දෙවානපිය මහරජස ගමිණිතිසහ මහලෙණෙ අගත අනගත, චතුදිස් සගසදිනෙ”** යන මේ ගල් සන්නසින් එකල භාෂාවේ තත්වය හැඟේ.

ඉන්පසු මහා චූල තිස්ස රජුද ලමෑණිකුල වසභ (වැහැප්) රජුද මහලුනා රජුද කණිට්ඨතිස් රජුද ගල්සන්නස් කළ බැව් පෙණේ. මාතර ප්‍රදේශයෙහි වදගිරියේ සහ යහන් ලෙණේ භාතිය රජු විසින් කරවන ලදැයි සලකන ගල්සන්නස්ද ගොඨාභය රජ මිත්තාභූත මහරහතුන් වහන්සේ වැඩවිසූ මහහිමේ කරවන ලද ගල් ලිපියක්ද විය. එහි මෙසේයි. **“හ (ජ) මිණිග (ල) ෂෙට අ (බ) රජමිතහ මිතතයහ වෙනහකුහාලෙන”** යනාදී වශයෙනි. තවත් ශිලා ලිපියක් මහානාග රජු විසින් රත්න සමීපයෙහි කරවා තිබේ.

වොහාර තිස්ස රජු කල එක්තරා ප්‍රමාණයක ශාස්ත්‍ර දියුණුවක් පෙණෙතත් ග්‍රන්ථ නිෂ්පාදනයක් වූ බැව් දක්නට නැත. සිරිසඟබෝ කුමරු මයිල් ත්‍රිපිටකධාරී තන්ද මහා ස්ථවිරයන් වහන්සේත් මෙකල වැඩ සිටි නමුත් ග්‍රන්ථ රචනාවක් කළ බැව් නොපෙනේ. සිරිසඟබෝ කුමරුදීන්ගේ පදවින්‍යාස (පා තබන ලද) ශබ්දය අසා සාමුද්‍රිකා ලක්ෂණ කියූ බ්‍රාහ්මණයාද එකල ශාස්ත්‍ර දියුණුවට සාක්ෂිවේ. ශ්‍රී සංඝබොධි රජතුමාද මිහින්තලාවෙහි ගල් ලිපියක් පිහිටුවා තිබේ. තවද මූළසික, කුදුසික, සිඛවළඳ විනිස යන ග්‍රන්ථද මෙකල ඇතිවූහයි සිතත් කතීෘවරු අවිනිශ්චිතය සිඛවළඳ ලියූ කාලයෙහි භාෂාව මෙසේය. **"තුන්ලොවට උතුම් රුවන්තිසා පැවිසි මුණි තුන්දෙවින් වැද උපසකුව ලද පැවිජ්ජා පටන් භික්මීය යුතු සරිත් වරිත් සිඛ සැඛවින් කියනෙමු"** මේවා නියම අමිශ්‍ර සිංහල බැව් පෙනේ. මෙකාල භාෂාවෙහි "බ' "ධ" යන අකුරු තුබුනා බැව් සිතිය හැක. මේ සිංහල පොත්පත් ලිවීමේ පිළිගත යුතු මූලාරම්භ යයි සැළ කිය හැක.

ගොඨාභය රජුද "කහටගහ දිගිලිය" නම් ගම සමීපයෙහි ශිලා ලිපිය කරවා තිබේ. මහසෙන් රජු කලද වෛතුල්‍යවාදය ලියූ පොත් ඇතිවූ නමුත් ඒවා විනාශ විය.

බුඩදාස රජුගේ කාලය ශාස්ත්‍රයෙන් දියුණු විය. මේ රජතුමා **"සාරාර්ථ සංග්‍රහය"** නම් ග්‍රන්ථය කොළේය. මෙකල විසූ ධම්කති නම් යතිඳුතුමා සූත්‍රාන්තයන් හෙළු බසින් ලී නමුත් පසුව ඒවා අභාව ප්‍රාප්තවිය.

මහානාම රජු දවස **"ග්‍රන්ථාකර"** නම් පිරිවෙනින්ද බුඩදාස රජතුමා කරවූ මයුර පාද පිරිවෙණින්ද ශාස්ත්‍රාලොකය නිකුත්විය.

## බුඩ ඝොෂ ස්වාමි.

---

මේ **ස්වාමි** වනාහි වෙද පාරගත ත්‍රිපිටකධාරි ශ්‍රෙෂ්ඨ පඬිරුවණකි. මූන් වහන්සේ බුදුන් වදාළ, "දෙලක්ෂ හැත්තෑපන් දහස්" ග්‍රන්ථ ඇති ශ්‍රී සධම්යට "තුන්ලක්ෂ හැටඑක්දහස් හත්සිය පණහක්" පමණ ග්‍රන්ථ සංඛ්‍යාවෙන් යුත් අටුවා කථා ලියූසේක. මින් ලක්දිවදී කරන ලද්දේ i ත්‍රිපිටක සිංහල අර්ථ කථාව මාගධ නිරුක්තියට පෙරළීම ii හෙළු බසින් තුබූ සූත්‍රයන් පාලියට නැගීම iii විශුඩි මාගීය ලිවීම යන මේවායි. මින් බුඩ ධම්යට ප්‍රයෝජනයක් වූවත් සිංහල භාෂාවට හානියක් විනා ලාභයක් වූයේ යයි නොසිතේ.

ඉක්බිති පණස් වසක් යනතුරු මිහා ශාස්ත්‍ර දියුණුවක් නොවීය. බුඩ් වර්ෂ 1005 පමණේදී රජවූ ධාතුසෙන රජුකල මහානාම නම් තෙරණුවෝ "මහාවංශයේ" මුලභාගය පාලිභාෂාවෙන් ලිවූහ මුන්වහන්සේ විසින් "දීපවංශ" නම් ප්‍රකරණය කුදු කරන ලද්දේලු. මෙසේ ක්‍රමයෙන් ශාස්ත්‍රාලොකය පැතිරී යන අතර කුමාරදාස රජතුමා රජවිය. මෙතුමා සංස්කෘත භාෂාව ගැන විශාරද දැනීමක් ඇති මහා පඬිවරයෙකි. එය දියුණු කිරීමටද අනෙක උත්සාහ දැරිය. එකල දඹදිව රජය කරන ලද්දේ ශ්‍රී හර්ෂ (හොජදෙව) රජතුමාය. "සාහිත්‍යතිහාසයක්" ලියන තැනැත්තා මෙතුමා ගැනද යමක් සඳහන් කිරීම යුතුකම යයි හැගේ.

## ශ්‍රී හර්ෂ (හොජදෙව) රජතුමා.

---

කුමාරදාස රජ කාලයෙහිම සිටි මෙතුමා සංස්කෘත භාෂාය පිළිබඳ විශාරද බුඩියක් ඇති එක ශ්‍රැතිධාරී මහා පණ්ඩිත රත්න යකි. මේ නරෙන්ද්‍රයාණන්ගේ අග්‍ර මහෙසිකාවුන් වහන්සේ සහ අග්‍රාමාත්‍යතුමා ද මහා පඬිවරුය. මෙතුමාණන්ගේ රාජ සභා යෙහි අසදෘශ කවිවර පණ්ඩිත රත්නයෝ නිපදෙනෙක්ම වූහ. මින් කෙණෙකුන් විසින් කියන ලද

දෘෂ්ටො ශ්‍රී හොජරාජෙන්ද්‍ර-ගලත්‍රිණිතසෂණාත්
ශාත්‍රොඃ ශස්ත්‍රඃ කවෙඃකණ්ඨඃ-නිර්විබන්ධො මංගීද්‍රශාම්

යන මේ ශ්ලොකයට එක අකුරකට මසුරන් ලක්ෂය බැගින් ත්‍යාග වශයෙන් ලැබුණේලු. එහි සාමාන්‍ය භාවය නම් හොජ රජතුමා දැකීමෙන් සතුරන්ගේ ආයුධ අතින් ගිලිහීම කවිවරයාගේ දුප්පත්කම ගිලිහීම සඳ්‍රියගේ නරුපට ගිලිහීම යන ගිලිහීම් තුනක් වේය යනුයි. මේ සභායෙහි කාලිදාස පඬිතුමාත් කෙනෙකි. සකරජු ගේ පණ්ඩිත සභ යෙහිද හොජ රජුට පසු කාලයෙහිද කාලිදාස නමින්තවත් පඬිවරු දෙදෙනෙක් සිටියෝල. මේ දෙවෙනි කාලිදාස පඬිතුමා ලක්දිව් පැමිණ කුමාරදාස රජු සමග මිත්‍රව සිටියේය.

කුමාරදාස රජු ශ්ලොක 18000 කින් යුත් ජානකීහරන නම් මහා කාව්‍ය ග්‍රන්ථය රචනා කෙළේය. ඊටපසු රජුනතුරෙන් සුළු මුගලන් රජද මහා කවිවරයෙක් විය. නමුත් කරන ලද ශාස්ත්‍ර සංග්‍රහයක් නො මැතියි.

මේ ශත වර්ෂ දෙළහ ගැනම සලකන කල කරන ලද ග්‍රන්ථ යන්ගේ ගණන ඉතා අඩු බවත් සාරාර්ථ සංග්‍රහයත්, ජාණකීහරණ යත් ශාස්ත්‍රිය ග්‍රන්ථ බවත් සැලකිය හැක.

## 3. ශීතකාලය.

අනුරාධපුර රාජධානියේ අවසාන පරිච්ඡේදයෙ නොහොත් අග්‍රබෝධි රජුකල මේ පිළිබඳ කාලයේ මූලාරම්භයසේ සැලකිය හැක. මේ රජු දවස අසහාය ශාස්ත්‍රාදිජනියක් ඇති විය. අසහාය කිවිවරු දොළොස් දෙනෙක්ද වූහ. එනම්:- සක්දමල, අසක්දමල, සාසුප්නොට ඇපා, දාමි, බෑකිරි, දලබිසෝ, අනුරුත් කුමරු, දලගොත් කුමරු, දලසල කුමරු, කිත්සිරි කුමරු, මුරවඩු කුමරු, සූරිය බාහු යනුයි. මේනම් පූජාවලිය, රාජාවලිය, වන්නි රාජාවලිය, සද්ධර්මරත්නාකරය යන පුස්තකවලද වෙනස් වෙනස් ආකාරයෙන් දක්වා තිබේ. මේ කිවිහු විසිතුරු අනේක කාව් ගෙතූහ. අවාසනාවකට මෙන් අද ඒවා ප්‍රකටව නැත. අසක්දකාව සහ පුරාණ මයුර සන්දේශය පමණක් මේරජු කාල කරනලද ග්‍රන්ථවලින් ශෙෂවී යයි සිතිය හැක. මේ රජු දවස ධර්මකීර්ති මහතෙරුන් එළු බසට නැගූ සූත්‍රාර්ථයන්ද සියල් ලක් විනාශයට ගොස් තිබේ.

සිරිසඟබෝ, අග්‍රබොධි, මහානාග යන පිරිවෙන් කරවා ත්‍රිපිටක ධාරී මහා ස්ථවිරයන්ට පූදකරන ලදී. තෑඹිලිතොට පිරිවෙනද මෙකල තුබූ එකකි. මෙසේ නමුත් සෑහෙන තරම් ශාස්ත්‍ර දියුණුවක් නොවූ බැව් පෙනේ ඊට පසු කාලයක රජයලත් තුන්වෙනි අග්බෝ රජු දක්වා මේ සඳහා කියයුතු යමක් නැත. තුන්වෙනි අග්බෝ රජ මිහින්තලේ ශිලාලෙඛණ පිහිටුවා තිබේ. එහි සඞ්ඝයා සහ දායකයන් අතර ඇතිවිය යුතු ව්‍යවස්ථා හතලිස් තුනක් අන්තර්ගතයහ එකල භාෂාව්‍යවහාරය වටහා ගැනීම සඳහා ඉන් කොටසක් මෙහි දක්වනු ලැබේ. "සිරිබර් සෑතකුල කොත් ඔකාවස් රජ්පරපුරෙන් බට් සෑත උසප් අබහයි සලමෙවන් මහරජ්හට එම්කුලෙන් සමසැයි දෙව්ගොත් විසෙව් රජ්න කුසැ ඉපැද ඇපා මහයා සිරිවින්දූ" යනාදී වශයෙනි.

හතරවන අග්බෝ රජුකල පටන් තුන්වන දප්පුල රජුටත් අතර කාලය කාපුරුපිරිවෙණ, කුරුන්දපිල්ල පිරිවෙන, සිරිසඟබෝ පිරිවෙන, මහාකන්ද පිරිවෙන, චූලපන්ථ පිරිවෙන, සේනාල උපරාජ පිරිවෙන, යනාදී බොහෝ පිරුවෙන් මගින් ශාස්ත්‍රාගම දියුණුව ඇතිව තුබුණත් කරනලද ග්‍රන්ථයෝ නැත්තාහ. මීට පසු රජවූ මිහිඳු රජුද දාමවිහාරික පිරිවෙන, මහාලෙඛ පිරිවෙන සහ තෑඹිලිතොට පිරිවෙනත් කරවිය. ඉන්පසු පොළොන්නරු කාලය වනතුරු සෑහෙන යමක් කිය නොහැකිය. මහා කිවිවර iv වන

සේන රජතුමාද කළ පුස්තක අධ්‍යයනය. බුධ වර්ෂ 1059 රජවූ විජයබාහු රජතෙම සවදෙශ කිවිවරුන්ටද විදෙශ කිවිවරුන්ටද ප්‍රවේණි ගම්වර දීමෙන් මහත් ශාස්ත්‍රසංග්‍රහයක් කෙළේය. රජතෙමේද සිංහල කාව්‍ය ශාස්ත්‍රයෙහි අති සමතෙකි. මේ රජුගේ ඇවෑමෙන් හතළිස්වසක් ඉකුත්වූ පසු රජය ලත් හීමවික්‍රම මහා පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ රාජ්‍යකාලය අපේ සාහිත්‍යයාගේ අගනා කාලයසේ ගණින් ගැනේ. මේ රජුද පාළිභාෂාවේ විශාරද දැනීමක් ඇති මහා බහුශ්‍රැත කෙනෙකි. මේ රජුකල විෂවෛද්‍ය ශාස්ත්‍රය, ශාරීරික වෛද්‍ය ශාස්ත්‍රය, සාමුද්‍රිකා ශාස්ත්‍රය, සංගීත ශාස්ත්‍රය, වාණිජ ශාස්ත්‍රය, අක්ෂර ශාස්ත්‍රය යනාදිය සහ භූතවිද්‍යා, ආයුධ විද්‍යා, රසායන විද්‍යා, ඉන්ද්‍රනීල විද්‍යා, ආදී විද්‍යාද දියුණුව තුබුනේය. ඒ පිළිබඳ පොත් දැනට නැතිවීම කණගාටුවකි. බොහෝවූ පාළි ග්‍රන්ථයන් අතුරෙන් දැනුදු ඉතා ස්වල්පයක්වත් තිබීම ප්‍රීතියකි.

මේ රජහුගේ ශාස්ත්‍රාගම පටුතර බුධි මහිමය එතුමාට ලැබී තුබූ උපාධිනාමයන්ගෙන්ම සඵුට වේ. තදු පාඨිහුද මෙහි දක්වනු කැමැත්තෙමි. i ශත්‍රුරජචොළකුලන්තක ii උඩතරුජනිර්මූල iii දුර්ලබ්ධිමථනය iv දුර්නිවාරණ v පරකෘතඤ vi සකලදිග් විජය vii අනන්‍ය සමර viii ශත්‍රුවිජය ix සරණාගතවජ්‍රපඤ්ජර x පරමන්ත්‍රප්‍රභෙද xi වික්‍රමප්‍රතාප xii අකලඞ්කසර්ව ශාස්ත්‍ර ශිරොමාණික්‍යය xiii කෘත්‍යාකෘත්‍ය නිශ්චය xiv පරරාජගොධූම xv ඝට්ඨනගර වෙවරායර භණ්ඩ පරනාරි සහෝදර ආරියායර xvi වෛශ්‍ය භුජඞ්ග යනුයි.

මේ රජ පිරිවෙන් 360 ක් කරවා බොහෝ ශිලා ලෙඛනද කරවිය. රජුගේ දෙවෙනි බිසව වන චන්ද්‍රවතිය විසිනුදු ශිලා ලෙඛන කරවන ලදී. සිංහලාක්ෂර ශිලා ලෙඛණයන්ගේ පටන් ගැන්මද මේ කාලයෙහිය. මෙකල ශාස්ත්‍රදියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් පහත දක්වනු ලබන පරාක්‍රමබාහු රාජ්‍යමන්ත්‍රණ සභාව දැක්විය හැක.

1 අධිකරණ නායක මහා මන්ත්‍රී
2 යුධ කෘත්‍යභාර ප්‍රධාන මහා මන්ත්‍රී
3 මහා ලෙඛනාධිකාරී මහා මන්ත්‍රී
4 රාෂ්ට්‍රනායක මහා මන්ත්‍රී
5 වැසියන්ගේ සම්මතයෙන් පත්කරනලද රාෂ්ට්‍රනායක උපමන්ත්‍රී

6 නගර සභාවල ප්‍රධානීන් වෙනුවෙන් පත්කරනලද සභාපති නායක මන්ත්‍රී
7 සිටුවරුන් වෙනුවෙන් පත්කරණලද සිටුනායක මන්ත්‍රී
8 සදාචාරවර්ධන ජනනායක මන්ත්‍රී

9 අය සංවිධායක මහා මන්ත්‍රී
10 රාජ භාණ්ඩාගාරාධිපති ,,
11 වෛද්‍යනායක ,,
12 ශාස්ත්‍රවර්ධන අධිකාරි ,,
13 ධර්මාධිකරණ විනිශ්චය ,,
14 ජත්‍ර ග්‍රාහනායක ,,
15 දහම්ගෙයි නායක ,,
16 මායා ගොහාධිපති ,,
17 රක්ඛාධිකාරි ,,
18 ලක්මණ ලෑන ,,
19 මෙහෙකරු නායක කූටාගාරාධිපති සභා නායක මහා මන්ත්‍රී
20 සිළුනා මහා මන්ත්‍රී
21 ජයමහාලෑන මහා මන්ත්‍රී
22 මූල භාණ්ඩාගාර නායක මහා මන්ත්‍රී
23 සංග්‍රාම කෘත්‍යභාර උප ,,
24 සමූහාධිපති මන්ත්‍රීන් තිදෙනෙක්
25 අන්තරඩගබුර මහා මන්ත්‍රී
26 රුවන් ආකර රටභාර ,,
27 මුහුදු තෙර රටවල් භාර ,,
28 මහා මලයරට භාර ,,
29 නාවික අධිකාරී ,,
30 දණ්ඩනායක ,,
31 කොස්දනා ,,
32 ලඞ්කාධිකාරී ,,
33 අධිකාරී ,,
34 නගරගල්ල නායක ,,
35 පොරොහිත ,, යනුයි.

**තවද** මේ රජුට අසූහතරක් මණ්ඩලිකාරි පතිහුද අසූහත රක් උපාණ්ඩුකාරයෝද සිටියාහුය. ශාස්ත්‍ර දියුණුවක් නොතිබි යේ නම් මෙවැනි ප්‍රශස්ත ආණ්ඩු ක්‍රමයක් කිසිසේත් ඇතිවිය නොහැක. මෙකල ඇතිවූ **බෝධිසත්ව ව්‍යාකරණය** සහ **ශබ්ද ගුණාකර ව්‍යාකරණයද** පාළියට ඇතිවූ ප්‍රථම ව්‍යාකරණයෝයි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කච්චායණ ව්‍යාකරණයාගෙන් පසු මේ ව්‍යාකරණයෝ යටපත් වූහ. මෙහි කර්තෘ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යයි කියති. මේ රජු කල්හි කරණ ලද ග්‍රන්ථ:- i අනුරුධ ශතකය, ii මොග්ගල්ලායන ව්‍යාකරණය, iii මොග්ගල්ලායන පඤ්චිකාව, iv බාලාවබෝධනය, v අභිධර්මාර්ථ සංග්‍රහ ටීකාව, vi අඞ්ගුත්තර ටීකාව, vii සාරාර්ථදීපනිය, viii රත්නමති පඤ්චිකා ටීකාව, ix විනය මහා සන්නය, x අභිධර්මාර්ථ විභාවිනිය, xi විනය විනිශ්චය සන්නය, xii අභිධර්මාර්ථ ටීකාව, xiii විනය විනිශ්චය ටීකාව, xiv සුබෝධාලඞ්කාරය වේ ඉන්පසු ii සේන රජු දවස නීලපට ධර්මය ඇතිරීයාමෙන් ඒ සඳහා ලියන ලද බොහෝ පොත්ද ඇතිවිය. මහා පරාක්‍රමබාහු රජුගෙන් පසු රජපත් දෙවන විජයබා රජ තෙම අරිමද්දන පුර වාසී නරේන්ද්‍රයන් වෙත පාලි භාෂාවෙන් සන්දේශයක් ලියා දූතාමාත්‍යයකු අත යවා තිබේ. චොඩගඞ්ග රජුගෙන් පසු රජය ලත් ලීලාවතී බිසවගේ කාලයෙහි සසදා වත කළ බැව් පෙණෙතත් එහි කර්තෘ අවිනිශ්චිතය. මේ කාව්‍යය:- අර්ධභ්‍රම, ගොමුත්‍රිකා පාදන්තයමක, සර්වතොභද්‍ර, ධ්වජබන්ධන, ගුප්තචතුර්ථ, ත්‍රිශූල, ආද්‍යාම්‍රෙඩිත, කාවාට බන්ධන, එකාක්ෂර බන්ධන යන මේ දුෂ්කර බන්ධනයන්ගෙන් යුක්ත බැවින් එකල ශාස්ත්‍ර ප්‍රබෝධය කෙතරම් උසස්ව තුබුනේද යනු නිශ්චය කරගත හැක.

ලීලාවතී බිසවට කලින් සිටි කීර්ති නිශ්ශඞ්ක රජතුමාද බොහෝ ශිලාලේඛන කළ බව පෙනේ. ඉන්බොහොමයක් පොළොන්නරු පුරය අසළ වේ. i ථූපාරාමය ii දළදාමාළිගාව iii හැටදාගෙය iv රන්කොත් වෙහෙර v කිරිවෙහෙර vi රන්ගිරි දඹුලු විහාරය vii අනුරාධපුර රුවන්මැළි මහා චෛත්‍යය viii රම්බර රජමහා විහාරය ix වාදුරැප්පෙ යන ස්ථානයන් අසළ පිහිටි ලිපි ඉන් ප්‍රධානයි.

දළදා මාළිගාව අසළ ශිලා ලේඛනයේ පහත සඳහන් ශ්ලෝක යද තිබේ. එනම්:-

"මාන්‍යොයාංහස ගතිච් ඛරොහයවරම් ගණ්ඩූපදම් පන්නගම්
ඛජ්‍යොතො මිහිරම් මෘගෙනුලලහම් ක්‍රෞඤ්චාදිපම් වරනනබා
වුණ්‍යො නයොනු සාරෙතිරාජ කරිතම් ........ වෛදූතාම් සොවලම්
හඝ්‍යාසස යාදි ඉතිව්‍යක්ත නීති කුසලො නිශ්ශඞ්ක මලෙලාත්‍රෑපඃ"

යනුයි.

මෙතැන් සිට "කල්‍යාණවතී" බිසවගේ කාලය වනතුරු කිසිවක් සඳහන් කළ නොහැක. ඒ බිසවගේ කාලයේද ශිලා ලිපියක් පිහිටුවා තිබේ.

තවත් නොයෙක් තැන්වල ශිලා ලිපි තිබෙන බැව්ද සොයා ගෙන තිබේ. කාලිඞ්ග වංශික අදමිටු මාඝරජු බොහෝ පොත් පත් විනාශ කිරීමෙන් සිංහල සාහිත්‍යයට මහත් හානි කර තිබේ. දෙවෙනි විජයබා නම් වන්නි රජ සතුරන් පරදවා ඒ නසනලද පොත් පත් නැවතත් ලියවා සිංහල සාහිත්‍යය යථා ස්ථානයෙහි පිහිටුවාලීය.

මෙහිලා සැළකිය යුතු මුවදෙව්දාවතද කර්තෘ හා කාලය අවිනිශ්චිත උසස් ග්‍රන්ථයකි. පරාක්‍රමබාහු රජු කල හෝ ඊටත් ඉහත කරණ ලදැයිද සසදාවටත් ප්‍රථමයයිද ඇතැමුන්ගේ මතයයි.

**දෙවෙනි පැරකුම්බා** කාලය ගැන මෙතැන් සිට කියනු ලැබේ. මේ රජ "නැම්බඹර කලිකාල සාහිත්‍ය පණ්ඩිත පරාක්‍රමබාහු" යනා උපාධිය ලැබීමෙන්ම මහා පඬිවරයෙකු බැව් සුප්‍රකාශවේ. කව් සිළුමිණ, වනවිනිස, සන්නය විශුද්ධි මාර්ග සන්නය යන මේ රජු විසින් කරන ලද ග්‍රන්ථයෝද එතුමාගේ පාණ්ඩිත්‍යයම සපුට කොරෙත්. මින් කව්සිළුමිණ සියලු පඬිවරුම සිළුමිණක්සේ සලකත්.

මෙකල බොහෝ පඬිවරුද වූහ. වනරතන මහා ස්වාමිපාද ආනන්දසථවිර ස්වාමිපාද තච්ශිෂ්‍ය වෛදෙහ, බුද්ධපිය, ගොතම යන ස්වාමිපාදයන් වහන්සේලාද එක ශ්‍රැතිධර වජ්‍රබුද්ධින් යුක්ත ශාරිපුත්‍ර, සඞ්ඝරක්ඛිත, සුමඞ්ගල, වාගීශ්වර, ධර්මකීර්ති, නාග සේන ප්‍රතිරාජ පරිවෙනාධිපති යන මහා ස්වාමිපාදයාණන් වහන්සේලාද ගුරුළුගෝමී නම් බෞද්ධොපාසක තුමාද ප්‍රමුඛස්ථාන යෙහි ලා ගිනිය හැක. මේ කාලයේදී වනරතන මහා ස්වාමීන් විසින් අභිධර්මමූල ටීකාවද දෙවන පරාක්‍රමබාහු රජාණන් විසින් කව්සිළුමිණ, වනවිනිස සන්නය, විශුද්ධි මාර්ග සන්නය යන පොත් තුනද ගුරුළුගෝමී උපාසක තුමාණන් විසින් ධර්මප්‍රදීපිකාවද ධර්මකීර්ති ස්වාමීන් විසින් මහා වංශයේ ඊතීය කාණ්ඩයද කරන ලදහ. ථූපවංශයද මෙකල රචිත නමුත් කර්තෘ සඳහන් නැත.

මෙකල කරණ ලදැයි සිතන තවත් පොත් ලැයිස්තුවක් පහත දක්වනු ලැබේ.

| | | |
|---|---|---|
| අමාවතුර | – | ගුරුළුගෝමී |
| හත්ථවනගල්ල වංශය | – | — |
| පඤ්චමධුව | – | බුද්ධප්පිය ස්වාමි |
| මහාරූප සිද්ධිය | – | එම |
| සම්බන්ධචින්තාසන්නය | – | ගොතම ස්වාමි |
| රසවාහිනිය | – | මෙහි කථාවස්තු රට්ඨපාල ස්වාමි කාලින් ලියා තිබී වේදෙහ ස්වාමි ශුද්ධකොට රසවාහිනී යයි නම් කරන ලදී |
| දෛවඥකාම ධේනුව | – | අනෝමදස්සී මහා ස්වාමි |
| සමන්තකූට වර්ණනාව | – | වේදෙහ ස්වාමි |
| සිංහල ශබ්ද ලක්ෂණය | – | එම |
| සිදත් සඟරාව | – | ප්‍රතිරාජ පරිවේණාධිපති |
| බුත්සරණය | – | විද්‍යාචක්‍රවර්ති (මෙය නිශ්චය නැත.) |
| දහම් සරණ | – | } මේ පඬිවරයාම යයි ඇතමුන්ගේ |
| සඟ සරණ | – | } මතයි. |

සද්ධර්මාලංකාරයද මේ කාලයෙහිමයයි සිතේ. මේ රජුගේ කාලයේ බොහෝ පිරිවෙන්වල ශාස්ත්‍ර දියුණු කිරීමෙන් හා අගනා පොත් නිපදවීමෙන්ද විශාරද ශාස්ත්‍ර සංග්‍රහයක් කර තිබේ. තුන්වෙනි පරාක්‍රමබාහු රජතුමාද දළදා සිරිත කෙළේය.

හතර වෙනි පරාක්‍රමබාහු රජුගේ කාලයේද සිංහල භාෂා සංවර්ධනය අතින් සැලකියුතු කාලයකි. මේ කාලයෙහි සොළී රටින් පැමිණි භික්ෂූන් වහන්සේලා විසින්ද ධර්මසේන නම් ආචාර්ය වරයා විසින්ද යනාදී පඬිවරුන් විසින් මෙහි පහත සඳහන් පොත් කිරීමෙන් මහත් ශාස්ත්‍ර සංග්‍රහයක් කළ බැව් පෙනේ. මේ රජ බොහෝ දළදා පූජා පින්කම් කළ බැවින් දළදා සිරිත තුන්වන පරාක්‍රමබාහු රජු නොව මෙරජහු විසින් කරණ ලදැයි සමහරුන්ගේ මතයි. රචණා කරනු ලැබූ ග්‍රන්ථ:-

උමංදාව සිංහලට නැගීම – (චොළිය භික්ෂු) වීරසිංහ ප්‍රතිරාජ නම ද්‍රවිඩ පඬිවරයා යයි සමහරු කියත්.

පන්සිය පනස් ජාතකය සිංහලට නැගීම – සොළී රටින් පැමිණි භික්ෂුවක්.

පූජාවලිය – පළමුවෙනි ධර්මකීර්ති ස්වාමි

පාරමී ශතකය සහ ජිනානුරාග චරිතය – ධර්මකීර්ති ස්වාමි

මේ කාලය නම් කුරුණෑගල රාජධානී කාලයයි.

විජයබාහු රජු කල කළාවූ තොටගමු වෙහෙර දෙමහල් කොට ප්‍රකෘතිමත් කරමින් වැලිගම පැරකුම්බා නම් පිරිවෙනද වීදාගම සිරි ඝනානන්ද නම් පිරිවෙනද යනාදී නොයෙක් පිරිවෙන් කරවා සිංහල භාෂාවේ වර්ධනයට උදාර සේවයක් කෙළේය. vi පරාක්‍රමබාහු රජුකල පලාබත්ගල දෙවෙනි ධර්මකීර්ති පරම්පරානුයාත දෙවෙනි විමල කීර්ති මහතෙරුන් විසින් සද්ධර්මරත්නාකරය ලියන ලදැයි ඇතැම්හු කියත්.

## එළිසම කාලය.

---

ගම්පල රජකළ V භුවනෛකබාහු රජුකල පටන් මෙය ආරම්භ වන්නේය. මෙහි ප්‍රාරම්භ කාව්‍යය හැටියට ගුරුළුගෝමී මුනුබුරු කවීශ්වර නම් කිවිඳු විසින් කරනු ලැබූ එළිසම පොත ද්විතීය මයුර සන්දේශයයි ගැනේ. කව් දෙසීයකින් යුත් පොළොන්නරු පුර වර්ණනාවද කවීශ්වර කිවිඳුගේ කෘතියකි. මීට පසු ගම්පළ රජවූ දෙවෙනි වීරබාහු රජු දවසද වටිනා ශාස්ත්‍රසංග්‍රහයක් වී තිබේ. සද්ධර්මතිලක විහාරාධිපති ද්විතීය ධර්මකීර්ති ස්වාමීහු සද්ධර්මාලඞ්කාරයද, ජිනබෝධාවලියද, බාලාවතාර ගඩලාදෙනි සන්නයද නිකාය සංග්‍රහයද කළෝය. ශාසනාවතාරය, රාජාවලිය කර්තෘකාලය අවිනිශ්චිතව පවතින මීට සමකාලික පොත්ලු. ශ්‍රී සිද්ධාර්ථාභිධාන මාහිමියාණන් විසින් රසවාහිනියට සාරාර්ථදීපනිය නම් ටීකාවක් කරණලදී. මෙතැන් සිට කෝට්ටේ රාජධානියවූ vi පැරකුම්බා රජුගේ කාලය ගැන කරුණු දක්වේ. මේ කාලය තරම් සිංහල සාහිත්‍යයාගේ වර්ධනයවූ අන්‍යකාලයක් නැතැයි කිවහැක. මක්නිසාදයත්: එකල නිපැයුණු ග්‍රන්ථ මෙකල ශාස්ත්‍රවර්ධනයට අතිශයොපකාරීව පවත්නා හෙයිනි. මේ කාලය තුළ නිෂ්පාදනයකළ ග්‍රන්ථහා එහි කර්තෘවරයෝ මෙසේයි.

| | | |
|---|---|---|
| රුවන්මල | – | හවැනි පැරකුම්බා රජතුමා |
| පියුම් මල | – | කර්තෘ අවිනිශ්චිතයි. |
| පැරකුම්බා සිරිත | – | ශ්‍රී රාහුල ස්වාමීන්ගේ යයි සැකපිට කියත්. |
| පූරාණනාමාවලිය | – | තන්නූර්තුතයා මැති |
| බෞද්ධ ශතකය | – | ශ්‍රී බුද්ධාගම චක්‍රවර්ති යන උපාධිය ලත් විජයබා පිරිවෙන්වැසි ශ්‍රී රාමචන්ද්‍ර භූසුරාචාර්යයි නම් බ්‍රාහ්මණ පඬිවර යෙකි. |
| වෘත්තමාලාඛ්‍යාව | – | |
| වෘත්තරත්නාකර පඤ්චිකාව | – | |

| | | |
|---|---|---|
| කොකිල සන්දේශය | – | ඉරුගල්කුලතිලක පිරිවෙනාධිපතීන් වහන්සේ. |
| පරවි සන්දේශය | – | ශ්‍රී රාහුල ස්වාමීන් වහන්සේ. |
| සැළලිහිණි සන්දේශය | – | |
| කාව්‍යශේඛරය | – | |
| පඤ්චිකා ප්‍රදීපය | – | |
| හංස සන්දේශය | | |
| පදසාධන ටීකාව | – | ශ්‍රී රාහුල ස්වාමීන් වහන්සේ. |
| පැරකුම්බා සිරිත | – | |
| ලෝවැඩ සඟරාව | – | දෙවෙනි වීදාගම මෛත්‍රෙය ස්වාමීන් වහන්සේ. |
| බුදුගුණ අලංකාරය | – | |
| කාව්‍යලක්ෂණ මිණිමාලාව | – | |
| ලෝවැඩ සඟරාව | – | මේවා සවෙනි භුවනෙකබාහු රජුගේ කාලයේ යයිද සමහරු කියත්. |
| බුදුගුණ අලංකාරය | – | |
| දහම්ගැට මාලය | – | |
| කාව්‍යලක්ෂණ මිණිමාලය | – | |
| ගිරා සන්දේශය | – | මේවාද මේ කාලයෙහිම කරණ ලද පොත්ය. |
| කහකුරුළු සන්දේශය | – | |
| තිසර සන්දේශය | – | |
| ගුත්තිලය | – | වෑත්තෑවේ තෙරිඳු |
| ලෝකොපකාරය | – | රතස්ගල්ලේ ස්වාමි |
| කුවේණි අස්න | – | කතෘ අවිනිශ්චිතයි. |
| සිහබා අස්න | – | ,, ,, යනාදී පුස්තකයෝයි. |

හතරවෙනි භුවනෙකබාහු රජුකල විසූ මහාවන රතන ස්වාමීහුද තුන්වෙනි වික්‍රමබාහු රජු දවස ගඩලාදෙණියෙහි ධර්ම විනය විහාරාධිපතිව විසූ මහා ශ්‍රී ධම්මකීර්ති ස්වාමීහුද ද්විතීය ධම්මකිත්ති ස්වාමීහුද සිංහල සාහිත්‍යයට මහොපකාරීවූහ හයවෙනි පරාක්‍රමබාහු රජුකල පැපිළියානේ විහාරාධිවාසී මඞ්ගල මාහිමියාණෝද කෑරගල විහාරාධිවාසී ද්විතීය වනරතන මහා ස්වාමීහුද විජයබාහු පරිවෙණාධිවාසී ශ්‍රී රාහුල මාහිමියාණෝද පිළිවෙළින් සංඝරාජ පදවි ඉසුළුවෝය.

වෑත්තෑවේ ස්වාමීහුද වීදාගම ද්විතීය මෛත්‍රෙය ස්වාමීහුද, මයුරපාද පරිවෙණාධිපති, ප්‍රතිරාජ පරිවෙණාධිපති ඉරුගල් කුලතිලක පරිවෙණාධි පති මහා ස්වාමිපාද වරයෝද මේ එළිසම කාලයෙහි මහා උගතුන් වශයෙන් ප්‍රකටව විශාරද ශාස්ත්‍ර සංග්‍රහයක් කළෝය. තොටගමුවේ විජයබා පිරිවෙන මගින් බොහෝ පඬිවරුන්ද ඇතිකර මින් සාහිත්‍යය පිළිබඳ මහත් මෙහෙයක් සිදුවී තිබෙන බැව් පිරිවෙනින් දෙකලද උපාධි නාමයන්ගෙන්ම පරිස්ඵුට වේ. හේ මෙසේයි:

1. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත, 2. සකලවිද්‍යා චක්‍රවර්ති 3. ආගම චක්‍රවර්ති, 4 බෞද්ධාගම චක්‍රවර්ති 5. ෂඩ්භාෂාපරමේශ්වර, 6. ශිතියන්වගෝමි, 7. ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය්‍ය යන උපාධිනුවෙත්. ශ්‍රී රාමචන්‍ද්‍රභූසුරාචාර්ය බ්‍රාහ්මණ පණ්ඩිත රත්නයද රාහුල ස්වාමීන්ගේ ගෝලයකු බවත් උපාධි ලැබූ බවත්

"ශ්‍රී මද්රාහුල පාදතසත්‍රී පිටකාචාර්යාද් ගුරෝර් නිර්මලං
බෞද්ධං ශාස්ත්‍ර චර්ථත්‍යයසත්‍ර සරණං රතනත්‍රයං සිග්‍රියෙ
යො බෞද්ධාගම චක්‍රවර්තිපදවිං ලබ්ධාශ්වරාලලබ්ධවාන්
සශ්‍රීමාහිත සර්ශාස්ත්‍ර නිපුණො ව්‍යාඛ්‍යාමි මාන් ව්‍යාතනොත්.'

යන ශ්ලෝකයෙන් සපුව වේ.

විජයබා පිරිවෙනෙහි එකල ඉගෙනීම ලැබූ සවදෙශ විදෙශ ශත සහස්‍ර ශිෂ්‍ය සංඛ්‍යාවෙන්ද උගන්වනලද ශිල්පශාස්ත්‍ර, කාව්‍ය නාටක, ගණිත යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍ර, ලිඛිත, ඉතිහාස, පුරාවිද්‍යා, රසවිද්‍යා, ගුප්තවිද්‍යා, ත්‍රිපිටක ධර්මය සහිත ව්‍යාකරණ, ඡන්දස්, නිඝණ්ඩු, පාළි, සංසකෘත, ප්‍රාකෘතාදී සකල කලාවන් ගෙන්ද පරිවෙනාධිපතීන් වහන්සේ ලබනලද සඝාධවරප්‍රසාද ඇති ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ෂඩ්භාෂාපරමේශ්වර ශ්‍රීසඞ්ඝබොධි විජය බාහු පරිවෙනාධිපති ශ්‍රී රාහුල සඞ්ඝරාජ මාහිමියාණෝ යන උපාධි සහිත නාමයෙන්ද රචනා කරනලද ග්‍රන්ථ සමූහයෙන්ද එකල පැවැති භාෂාතත්වය මනාසේ වටහාගත හැක. මීට සමකාලිකව පූර්වාපර වශයෙන් වැඩ සිටි ෂඩ්භාෂා පරමේශ්වර ඉරුගල් කුලතිලක පරිවෙනාධිපතීන් වහන්සේද ෂඩ්භාෂා පරමේශ්වර ප්‍රතිරාජ පරිවෙනාධිපතීන් වහන්සේද, ෂඩ්භාෂා පරමේශ්වර බෙන්තොට ශෛලාන්තායතන විහාරාධිපති දීපඞ්කර සඞ්ඝරාජ පරිවෙනාධිපතීන් වහන්සේද මෙකල ශාසනෝන්නතියට මූලසම්භක වූහ.

## ශාසන පරිහානිය.

---

(අන්ධකාර කාලය)

සියලූ අතින් පිරිපුන් කාලයාගේද ඉකුත්වීම වැළැක්විය නොහැකි කරුණකි. ලොකසවභාව හෙයිනි. එය සපුව කිරීමට මෙන් ලඞ්කාවේ ශ්‍රී සමෘද්ධිය සමග ශාසන දියුණුවද නැතිකොට අන්ධකාරවීමට 1505 දී ප්‍රතිකාල්වරුන්ගේ පැමිණීම සමපූර්ණ හේතුව විය. එසේම තවත් විපතෙක්ද ඇතිවිය දියෙන් නැගුනු ගින්නක් මෙන් සීතාවක රජකල i රාජසිංහ රජකලාවූ පාපක්‍රියාව

වසා දැමීමට මෙන් රටේ පුරාම තුබූ පොත් රාශිය එකතුකොට ගිනි දෙවියාට පිදීමය. මෙයින්වූ ශාස්ත්‍ර පරිහානිය කෙතරම්දැයි නිශ්චය කිරීම කිසිවකුට නොහැකිය. ප්‍රතිකාලුන්ගේ වස්තු කොල්ලකෑම් රට පැහැරීම් ආදියෙන් තදින් පෙළී සිටි ජනයාට රාජසිංහ රජු ගේ මේ ක්‍රියාව කබලෙන් ලිපට තල්ලුකළාක් මෙනි. තවත් වර්තමානිකයන්ගේ භාග්‍යයට මෙන් මේ අතිභයඞ්කර අන්ධකාර කාලයද ශාස්ත්‍රයෙන් තොරනොවීම අමුතු පණක් ලද්දාමෙනි රාජසිංහ රජුකල විසූ ධම්මධ්වජ පණ්ඩිතුමා රාජසම්මාන ලද්දෙකි. මේ පණ්ඩිතුමාගේ අභිජාත පුත්‍ර රත්නයවූ අලගියවන්න මූකවෙටි තුමාද අසහාය පණ්ඩිතොත්තමයෙක් විය. එතුමාගේ ශාස්ත්‍ර දියුණුව ඇතිවූයේත් බැබලුනෙත් අතිශය ප්‍රයෝජනවත්වූ යෙත් නියම රාජ සෙවකයෙක් වූ හෙයිනැයි හැඟේ. එතුමාගේ ශාස්ත්‍ර විශාරද භාවය,

සව් සතර සමුදු ර
නැණ නැවිනි දුටු පර තෙ ර
දහම් දජ පඬි ව ර
තදනවූ පරසිදු මෙදිය තු ර

අලගියවන්න න ම්
මූකවෙටි ගුණැති නැණ තු ම්
දකිනුව සසර හි ම්
මෙකාව කෙළෙ හෙළු බසින් මත ර ම්

යන්නෙන් මනාව ඔප්පුවේ. මේවකාහි තොටගමුවේ ශ්‍රී රාහුල ස්වාමින්ගේ

සව් සත කෙළ පැමි ණි
ගුරුවන් දෙරණ සපැමි ණි
පිටිසිදු සිල් ගිහි ණි
සියල්ලොවැ වියතුන්ට සිළුමි ණි

යන්න පමණක් දෙවැනි නොවේද?

මෙයින් මනාසේ ඔප්පුවන්නේ අන්ධකාර කාලයද එසේ නැත් නම් රට විරුඬ කාලයක්දැ'යි විමසත්වා.

දහම්සොඬකාව, කුසජාතකය, සැවුල් සන්දෙශය, සුභාෂිතය, මුණිගුණගුණරත්න මාලය, නීතිසාරය, පරංගිහටන, මහහටන, දුශ්ශීලවත, ශෘඞ්ගාරය යන මේ ප්‍රශස්ත පොත් පන්සාතියක් ලිවීමෙන් එකම පඬිවරයාගෙන් සිදුවූ මෙහෙය ස්වල්ප නොවේ.

කාරණා මෙසේ නමුත් ක්‍රි: ව: 1739 රජ පැමිණි කීර්ත්තිශ්‍රී රාජ සිංහ රජුගේ කාලය දක්වාම අන්ධකාර කාලය හැටියට ඉතිහාසය සාක්ෂි දෙයි.

## නවීන යුගය.

ඇඳිරි ගෙයක්හි පහන් දල්වන්නාක්මෙන් මුළු ලංකාවේ ඒ ඒ ස්ථානවල ශෙෂව සැඟවී තුබුණු යම් විද්‍යාවක් වීද ඒ සියල්ල වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණඞ්කර ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රඥාබලයෙන් රාශිභූතකොට ගෙන සිංහල සාහිත්‍ය නමැති ප්‍රදීපස්ථම්භය දැල්වීමට උත්සාහ දැරී. මෙසේ මුන්වහන්සේ උඩරටද මාතර දිසාවෙහි වේහැල්ල නම් ග්‍රාමයෙහි නිවැසිවූ සිටිනා මලුවේ ධම්මජෝති නම් ස්ථවිරයන් වහන්සේ පහතරටද සාහිත්‍යවර්ධනයෙහි තත්පරවූහ. ක්‍රි: ව: 1747 දී රජ පැමිණි කීර්ත්තිශ්‍රී රාජසිංහ රජතෙමේ සියම් දෙශයට අමාත්‍යයන් යවා උපාලි මහා ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛවූ සඞ්ඝයා ගෙන්වා උපසම්පදාව පිහිටුවීමෙන් ශාසනයට හා සාහිත්‍යයටද අත්‍ය ශ්‍යොපකාරී වැඩ කෙළේයි. වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජ ස්වාමීන් වහන්සේ සාහිත්‍ය වර්ධනයට ඉවහල්වූ

i සාරාර්ථ සඞ්ග්‍රහය.
ii සාරාර්ථ දීපනී.
iii අභිසම්බෝධි අලංකාරය.
iv භෙසජ්ජ මඤ්ජුසා ව්‍යාඛ්‍යානය.
v මධුරාර්ථ ප්‍රකාශනී.

ආදී පොත් සමූහයක් කළහ.

ලඞ්කාවේ උඩපාත දෙරටෙහිම ඉතා විශාලව පවත්නා පණ්ඩිත පරම්පරාවේ අත්තරගම ශ්‍රී රාජගුරු බණ්ඩාර පඬිතුමා විසින් කාරක පුෂ්ප මඤ්ජරිය, සුධිරමුඛ මණ්ඩණය, සාරසංක්ෂෙප ව්‍යාඛ්‍යානය යනාදී ග්‍රන්ථ නිර්මාපනය කොට සිංහල සාහිත්‍යයට කරනලද උපකාරය ඉතා මහත්ය. තිබ්බටුවාවේ මහා ස්ථවිරයන් වහන්සේ විසින් දඹදෙණියේ රජකළ කවිසිළුමිණ කර්තෘවූ කලිකාල සාහිත්‍ය පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ කාලයෙහි (ක්‍රි: ව: 1236–1271) සිට කීර්ත්තිශ්‍රී රාජසිංහ රජුගේ කාලය දක්වා ලඞ්කා කථාව ලියා මහාවංශයට ඇතුළත් කිරීමෙන් සිංහල සාහිත්‍යයේ ශෙෂවතිබූ අඩු පාඩුවක් සම්පූර්ණකර ලෝවැඩ සලසන ලදී. යථොක්ත සිටිනාමළුවේ ස්වාමීන් වහන්සේ බාලාවතාරයට ඔකඳපොල

න්තයද කිරීමෙන් සාරණලද මෙහෙයද සුළුපටු නොවේ. ඔපාත දෙරටේහිම් මෙසේ නැවතත් ශාසනාගම වර්ධනයවූවායින් සු ග්‍රන්ථ නිර්මාණයද ඇතිවිය. ක්‍රි: ව: 1247 දී සඞ්ඝරාජ සවාමීන් හන්සේගේ අනුශිෂ්‍යවූ හීනටිකුඹුරේ සුමඞ්ගල සවාමීන් වහන්සේ සින් මිලින්දප්‍රශ්නය සිංහලට නැගීමද, ආචාර්ය මහසේන ාමීන් වහන්සේ ශුද්ධ සිංහල සුමුගුදකාව කිරීමද, සැලකියයුතු ත්‍යයෝ වෙත්. ක්‍රි: ව: 1270 දී සෙංකාඩගල උපොසථාරාම ාරාධිපති ධම්මරක්ඛිත සවාමීන් වහන්සේගේ ශිෂ්‍යවූ රතනපාල ාමීන් වහන්සේ විමානවත්ථු ප්‍රකරණය සිංහලට නැගීමද කළහ. ව:1771 දී පත්තායමේ කිවිඳු විසින් කව්මිණි කොඩල විසො රතන මාලය, රතවතී කථාව, සුධර්මභොජන ජාතකය යනාදී ව්‍යයන්ද කරන ලදී. මෙසින් පත්තායමේ ලේකම්තුමා එකි ලුම කාව් අග වන්දක්ෂර යෙදීමෙන් කාව්‍යලොකයාට මහත් ශීයක් පෙන්වා තිබේ, සිටිනාමළුවේ සවාමීන් වහන්සේගේ ත් ගෝලයෙක්වූ බරණගණිතාචාර්යයන් විසින් නීලකොබෝ ඳශය නම් කර්ණරසායන සිත්කළුවූ කාව්‍යයක් කරන ලද්දේය. ව: 1768 දී මාතර විසූ දිසානායක මුදලිතුමා කොකිල ඳශ සන්නයක්ද, ක්‍රි: ව: 1773 දී තවත් දිසානායක කෙනෙ කටුවානේ මුහන්දිරම් කිවිඳුන් විසින් කව්මිණි මල්දම නම් ඒ යෙහි බොහෝ ප්‍රසිද්ධියට පැමිණි ග්‍රන්ථයක් නිපදවන ලදී. නයින් සලකා බලනවිට නවීන යුගයේ අභිවර්ධනය කීර්තිශ්‍රී සිංහ මහරජතුමාගේ කාලයේ පටන් සිදුවූ බැව් ප්‍රත්‍යක්ෂ ඉන්පසු රජ පැමිණි රාජාධිරාජසිංහ රජතුමාගේ කාලයේ ව සිටි සාළිඇලේ සවාමීන් වහන්සේ විසින් කාව්‍යමුතුහර න කිරීමද, ප්‍රාතිහාර්ය ශතකය නම් එළු සිලෝ ග්‍රන්ථයක් වීමද සැලකියතු මෙහෙයයන්සේ හැගේ. රාජාධිරාජසිංහ සින් අසදෘශ ජාතකය කව් කිරීමෙන් මෙතුමාගේ පාණ්ඩිත්‍යය ට ප්‍රකාශවේ සිංහල නරපතීන් සාහිත්‍යයෙහි මනාපටුත්වයක් විසූ බැව් ග්‍රන්ථ නිෂ්පාදනයෙහි නියැළිව සිටීමෙන්ම සක්සුද අවබොධ වේ.

786 දී කරතොට සවාමීන් වහන්සේ බාරස කාව්‍යය නම් ් කාව්‍ය බන්ධනය තනා රාජාධිරාජසිංහ රජුගෙන් පවා ා මාන්න ලැබුවෙකි. මේ කාලයෙහිදීම උඩරට කිවීන් ්න් ගජ හපනෙක්වූ දුනුවිල ගජනායක නිලමේ විසින් ග බොධිජාතකය, රතිරත්නාලංකාරය, දුනුවිල හටන යන කිරීමෙන් දහඅටවන ශතවර්ෂය සමාප්ත !කෙළෙසි. දහ ශතවර්ෂය තුළ ඒ ඒ උතුමන් විසින් සිංහල සාහිත්‍යයේ

ර්ධනයට ඉවහල්වූ උක්ත ප්‍රකාර ගද්‍යපද්‍ය පුස්තකයන් 25 ක් වණ සකස් කරන ලදී. මෙසේ ක්‍රමයෙන් ඵලිතවූ සිංහල සාහිත්‍යය ශතවර්ෂයේ අවසාන භාගයේදි ඉංග්‍රීසින් සහ ඕලන්ද න් අතර ඇතිවූ යුද කෝලාහලයන් කාරණකොට ගෙන ශාස්ත්‍ර දෙක දියුණුවට ඉහවල්වූ ග්‍රන්ථ නිර්මාණයෙහි ව්‍යාවෘත නො මන් 19 වැනි ශතවර්ෂය මුලදී එය ඉතා අදුරු ස්වභාවයක වැත්තේය. නමුත් 1815 දී බ්‍රිතාන්‍යයෙහි ඉංග්‍රීසි මහරජතුමාට නාව අයිතිවීමෙන් එකම ආණ්ඩුවක් ඇතිවීම කාරණකොට හා සතුරු වියවුල් අතුරුදහන් වීමෙන් ශාස්ත්‍රයේ දියුණුවට ට පැවති බාධාවල් අපගත වීමෙන් නැවත සාහිත්‍යයේ වර්ධනයද සෙන්ට පටන් ගති. 19 වෙනි ශතවර්ෂයේ සාහිත්‍ය වර්ධනයෙහි න් ගැනීම වූයේ කරතොට පරම්පරාවේ කටුකුරුන්දේ මින් වහන්සේගේ අති ව්‍යක්ත සුප්‍රසිද්ධ ගෝලනමක්වූ මිහිරි න්නේ ධම්මරතන නම් ස්ථවිරපාදයන් ගෙති. මිහිරිපැන්නේ කව් නමැති පොත මුන්වහන්සේ විසින් කරණ ලදී. මුන් න්සේගේ ගෝලයන් තිදෙනා අතුරෙන් කොග්ගල පණ්ඩිත ම ක්‍රි: ව: 1853–54 හිදී සිදුවූ සව්සත්දම් වාදයෙහිත් සිට එයින් මහත් ප්‍රසිද්ධියට පැමිණියේය. අනික් ප්‍රසිද්ධ ලයාවත තුඩාවේ පණ්ඩිතුමා විසින් සිදත් සඟරා අභිනව ඛ්‍යානය නිපදවීමෙන් මහාජන ගෞරවය හා ප්‍රසාදයන් දිනා ගා ලදී. ඉක්බිති අනුක්‍රමයෙන් තෝමිස් මුහන්දිරම් ගඞ්ගා ග ශතකයද, ඉංග්‍රීසි හටන හා ඇහැලේපොළ වර්ණනාවද ලව කෝරාලවියෝග ශතකය, සහ යෝග මාලාවද, කිරම සියබස් මල්දම සහ විබත්මල්දමද, ගජමන් නෝනා න් නෝනාගේ" කව් නැමැති පොතද කිරීමෙන් තම ගේ යථා ශක්තින් සිංහල සාහිත්‍යය පොහොසත් කිරීමට ගත්හ. මෙයින් කරතොට ස්වාමීන් වහන්සේගේ ආශ්‍ර ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ මාතර පුර *වේරගම්පිට නම් පිය වාසය කළාවූ ගජමන් නෝනා නමින් ප්‍රසිද්ධවූ කිවිවරිය සාහිත්‍යයට කරණලද අගනා මෙහෙයෙන් වර්තමාන ස්ත්‍රී ඒ සඳහා ප්‍රෝත්සාහිකාර වීමෙහි ආදශ්‍යමත්වී සංඝරා ඤාපරමේශ්වරව විසූ වැලිගම ශ්‍රී සුමඞ්ගල නායක ස්වා මීන්සේ විසින් සිංහල සිද්ධාන්ත ශේඛරය සහ හිතොප ශය ද, ඉතිහාස නම් ග්‍රන්ථයක්ද නිපැදවී එසේම වස් ශ්‍රී සුභූති නායක ස්ථවිරයන් වහන්සේ විසින් නාමමාලාව සහ අභිධානප්පදීපිකාසූචි නමැති සප්‍රයෝජනවත්වූ ග්‍රන් සංස්කරණය කරණලදී. නමුත් මෙකල ස්වල්පවූ අදුරු

ස්වභාවක පැවතියදී වර්තමාන කාලයෙහි ශාස්ත්‍රාගම ව්‍යාප්තිය පිණිස අත්‍යන්තොපකාරී වූවෝ නම් සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගල සඞ්ඝනායක ස්වාමීන් වහන්සේ හා බටුවන්තුඩාවේ දෙවරක්ඛිත පණ්ඩිතුමාද වෙත්. ලඞ්කාණ්ඩුව විසින් යොදන ලදුව මේ පඬිවර තෙමේ ශ්‍රී සුමඞ්ගල සඞ්ඝනායක ස්වාමීන් වහන්සේ සමගම මහා වංශයසිංහලට නගා ධම්ම ශාස්ත්‍රාලොකය පැතිරවීමෙහි වාසනාවන්තයා විය. තවද මේ පඬිතුමා විසින් සුලභ කරනලද පොත්වලින් සමහරක් නම් 1 බාලාවතාරය, 2 කච්චායන, 3 ධාතු මඤ්ජුසාව, 4 අනුරුද්ධ ශතකය, 5 සූර්‍ය්‍යශතකය, 6 වෘතමාලාඛ්‍යාව, 7 අමර කොෂය, 8 මාධවය, 9 සිදත් සඟරා පෙළ, 10 සිදත්සඟරා පුරාණ සන්නය, 11 රුවන්මල, 12 පියුම්මල, 13 ගුත්තිල කාව්‍ය සන්නය යනාදියය.

බටුවන්තුඩාවේ පඬිතුමාගෙන් සිංහල සාහිත්‍යයට සිදුවූ මෙහෙය මැනගැනීමට යථොක්ත කෘතිනු ප්‍රමාණ වේයයි හඟිමි. විද්‍යොදය මහා විද්‍යාලයෙහි අධිපතිව වැඩවදාළ ශ්‍රී සුමඞ්ගල නාය ක ස්වාමින් වහන්සේ වර්ණ රීතිය, සුබොධිකාටිකා, බ්‍රහ්මධම්ම සන්නය, සිංහල කවි සහ විශාල සංස්කරණ රාශියක්ද ප්‍රසිද්ධ කොට සුලභ කිරීමෙන් ශාසනයට සහ ශාස්ත්‍රයට අනල්ප මෙ හෙයක් ඉටුකෙළේයි. මෙසේ දසදිග් පතල කීර්ත්තියෙන් හා සියල්ලන් කෙරෙහි මෙත්සිත් පතුරුවමින් ස්වකීය නිරහඞ්කාර ගුණයන් කාරණකොට ගෙන සියල්ලන්ගේ සිත් ගනිමින් වැඩ වදාළ මූන්වහන්සේ ක්‍රි: ව: 1911 දී ස්වර්ගීපරායනවීමෙන් සිංහල ඉතිහාසයට බොහෝ පාඩු සිදුවිය. පැළියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙනාධිපතිව වැඩවිසූ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමින් වහන් සේ ආධුනික සංග්‍රහය පිණිස සංස්කෘත ශබ්ද මාලාව සහ ශික්ෂා සංග්‍රහයද ලඞ්කාණ්ඩුවේ ආරාධනයෙන් ධම්ම ප්‍රදීපිකාවෙහි සං ස්කරණයක්ද කරන ලදී.

තවද ජානකීහරණ මහා කාව්‍යය, හංසසන්දෙශය, බාලාව තාරය, ආදී සංස්කරණද සිදත්සඟරායෙහි අභිනව සුඩියක් හා විස්තරාර්ථ වර්ණනාවක්ද කිරීමෙන් සිංහල සාහිත්‍යය දීසී කෙළේය. යථොක්ත පිරිවෙන් දෙකේ ආදී ස්ථවිරයාණන් වහන්සේලා දෙනමගෙන් ලක්දිව අද පවතින ශාස්ත්‍ර සමෘද්ධිය ඇතිවූ බැව් ප්‍රකට කාරණයකි.

දැනට ජීවත්ව සිටින උගතුන් විසින් ලියන ලද පොත් සමූහයක් ඇත් නුමුත් එය මෙහි නොදක්වූ වෙමු. 19 වැනි ශතවර්ෂයේ යුරෝපීය මහතුන් කීපදෙනෙකුන් සිංහල සාහිත්‍ය පිළිබඳ ප්‍රයත්න දරන ලද්දේය. කාටර්තුමාගේ සිංහල අකා රාදියද එතුමන්ගේම සිංහල ව්‍යාකරණ පොතද එකල සිදුවූ වූටිනා

මෙහෙයයෝ වෙති. ක්‍රිස්තියානි බයිබලය සිංහලට පරිවර්තනය කිරීමද මෙකල සිදුවිය. මෑත කාලයෙහි ආගමානුකූල සමාගම් මගින්ද ආණ්ඩුව සම්බන්ධයෙන් ස්වභාෂා පාඨශාලා පිහිටුවීමෙන්ද බෞද්ධ විහාරස්ථානයන්හි උසස් පිරිවෙන් දියුණු කිරීමෙන්ද සිංහල ප්‍රවෘත්ති පත්‍ර සඟරා ආරම්භයෙන්ද සාහිත්‍යය වර්ධනය වෙන්ට පටන් ගත්තේය. ලඞ්කාණ්ඩුව සම්බන්ධකොට පිහිටුවා ඇති ප්‍රාචීන භාෂොපකාර සමිතියේ ආධාරයෙන් එය වඩ වඩා දියුණු වේගන යයි.

මෙසේ අසරණ සරණ සරණඞ්කර සඞ්ඝරාජ පරම්පරාවේ නා නා ශාඛාවන්ගෙන් පැවත එන්නාවූ නා නා පඬිවරයන්ගේ ප්‍රොත්සාහයෙන් දැනට ලඞ්කාවේ සිංහල සාහිත්‍ය දීප්තිමත්ව බබලන බැව් ප්‍රශංසා මුඛයෙන් ප්‍රකාශකර සිටිමු. මෙසේ අන්ධකාර සහිත 19 වන ශත වර්ෂයේ මූලභාගයේ දැල්වූ සරණඞ්කර සඞ්ඝරාජ නමැති ප්‍රදීපයෙන් අද මුළු ලක්දිව අස්සක් මුල්ලක් නොමැතිව බැබලෙන බැව් සැළකිය යුතුයි. තවද උක්ත ප්‍රකාර පඬිවරුන් විසින් සිංහල සාහිත්‍ය වර්ධනය සඳහා ඉටුකර තිබෙන ග්‍රන්ථ කාරකාදී උසස් මෙහෙයන් ලිපිය දික්වෙන හෙයින් මෙහි ස්වල්ප වශයෙන් දැක්වීමු.

20. 5. 33 දින
බෙන්තරදීය.

ගල්බඩ ආණ්ඩුවේ විභාෂා පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍ය
පී. ඩබ්ලිව්. තෝමස් ද සිල්වා මහතා විසින්
සම්පාදනය කරණ ලදී.

---

# ලඞ්කාධ්‍යාපන ඉතිහාසය.

ලඞ්කාධ්‍යාපනයෙහි සවිස්තර පුරාවෘත්තයක් ලිවීම හෝ කීම දුෂ්කරාතිශය කාර්‍ය්‍යයක් බව පණ්ඩිත ජනයා පිළිගත් කාරණයකි. එසේ වුවද ඉදංකාලීන ගුරුන් වෙතෙහි මේ ගැන සාමාන්‍යාවබෝධයක් වත් ඇතිවිය යුතුය. කුමක් හෙයින්ද යත්? යමක ඉතිහාසය නොදන්නෝ එහි සුන්දරාවබෝධයක් නැත්තෝවෙත් යයි සලකනු ලබන බැවිනි. ඉතිහාසය දැනගැනීම ඒ පිළිබඳ නියම තත්වය හෝ මහාර්ඝය දැනගැනීමට හේතු වෙයි. එබැවින් ලඞ්කාධ්‍යාපනය සම්බන්ධ විශේෂාවබෝධයක් අප විසින් ඇතිකරගත යුතුය නමුත් ඊට ඉතිහාස කර්තෘවරුන් තජ්ඥයන්ගේ මනොරථපූර්ණයට ඉඩහල් කිසිවක් ස්වකීය ඉතිහාස දර්පණ තලයන්හි පිළිබිඹු කොට නොතැබීම සමස්තාචාර්‍ය්‍යවරයන්ගේ මනස්තාපයට කාරණයකි. මෙහිදී මවිසින් ප්‍රකාශ කරනු ලබන්නේ ලඞ්කාධ්‍යාපනය සම්බන්ධ සංක්ෂෙප සටහනකි මේ ප්‍රාකාශ්‍ය විෂයෙහි ඇතැමෙකුගේ අදහස් මීට විෂම වියහැකි වූවද මෙයින් ගතයුතු ප්‍රයෝජනයක් ඇතහොත් එය ගැනීමෙන්ම අපේ ප්‍රයත්නය සාඵල්‍යයට පමුණුවන ලෙසද දන්වමු.

අධ්‍යාපනය ශිල්පය. ශාස්ත්‍රය කියා දෙකොටසකි. පරිචිතයෙන් දතයුත්ත ශිල්පය කියාද ඥානයෙන් දතයුත්ත ශාස්ත්‍රය කියාද සාමාන්‍යයෙන් බෙදිය යුතුයි. මේ දෙක නැවතත් 64 ක් ප්‍රභෙද ඇත්තෝවෙත්. සිව්සැටකලා යන්ගෙන් එය ප්‍රසිද්ධවිය. මේවා පිළිබඳ අධ්‍යාපනයත් එහි ක්‍රමයත් ඒ ඒ කාලවලදී කෙසේ පැවතුනේ දැයි විමසා බැලිය යුතු.

## රාවණාකාලය.

---

ලඞ්කාඞ්ගනාවගේ වාසනාවත් කාලපරිච්ඡේදයක් යයි කියන්ට පිළිවන. එකල රට දියුණුවෙන් ආඪ්‍යව පැවැති බවට නොයෙක් කාරුණු පොතපතින් පෙනේ. ඒ නිසා අධ්‍යාපනය අතින්ද

මහත් දියුණුවක් ඇතිවියයුතුබව නිගමනය කළයුතුය. ශිල්ප ශාස්ත්‍ර එයම ඉතාම සොඳට තිබුණ බවට රාවණාගේ මාළිගා උද්‍යාන යුධ සරඹ සහ අහස්යාත්‍රා යනාදිය සාක්ෂිදරයි. අද පවත්නා ගුවන යාත්‍රාවට වඩා සම්පූර්ණකාරයෙන් සැපපහසු ඇතිවූද ආශ්චර්ය ජනකවූද ගගන යන්ත්‍රයක් එකල තිබීම ලෞකික ප්‍රඥාවේ විපුලත්වය ප්‍රකාශ කිරීමට කාරණයකි. ක්‍රිස්තුවර්ෂයෙන්යට හත් වැනි ශතවර්ෂයේදී ලංකාවේ ලියනලද වස්ත්‍රයක් කාශ්මීර රටේ රජ මාළිගාවේ තිබී සම්බවූ බව **රාජතරංගනී”** නම් ඉන්දියානු ඉතිහාසයේ සඳහන් වේ. මෙලෙසින් පැවති රටේ දියුණුව සහ අධ්‍යාපනයත් ක්‍රමයෙන් හීනවූයේය.

මීටපසු බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩි කාලයෙහි අධ්‍යාපනයෙන් ඉතිරිව තිබුණේ සවල්පයකි. ශිල්ප පමණක් තරමක් දුරට දියුණුවෙන් පැවති බව චූලෝදර මහෝදර නාරජුන්ගේ මැණික් ආසනයෙන් පෙනීයයි. මේ කාලයෙහි කියයුතු තරම් වෙන උසස් අධ්‍යාපනයක් තිබුණබවට කාරණ අදෘශ්‍යමානයි. මෙසේ පරිහානි මාර්ගයෙහි ගමන්කළ ලංකාමාතාවගේ දූදරුවෝ ඉතාම අශීලාචාරවූවෝය. අධ්‍යයන අධ්‍යාපනයෙන් අන්ධවූවෝය මෙකල ඔවුනතර කලා විද්‍යාවන්ගෙන් ගාන්ධර්වය, මන්ත්‍රය යන දෙක ප්‍රධාන වශයෙන් පැවැත්තේය. නෂ්ටාවශේෂ වශයෙන් තවත් ශිල්ප හා ශාස්ත්‍ර කිහිපයක් පැවති බව පෙනේ. එකල **කුවේනිය** ගේ නූල්කැටීමද නෂ්ටාවශෙෂයෙන් පැවතීමකි. දූරාතීතයෙහි පටන් කපුගොවිතැන සහ එයින් වස්ත්‍ර පිළියෙලකර ගැනීමත් මෙහි පැවැත්තේය.

**විජයරජතුමාගේ** කාලයෙහිම ලංකාවට ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලැබුණේය. එම අධ්‍යාපනාචාර්යයන් විජයාදී ප්‍රථාමාගත පිරිසනොව දෙවනවරට පැමිණි පිරිසයයි ඉතිහාසගතව තිබේ. රටක දියුණුවක් ඇතිකිරීමට සුදුසු අධ්‍යාපනයද මූලකාරණයක් වන බැවින් විජය තෙමේ ඒ ගැනද කල්පනාකොට ප්‍රබල පිරිසක් ඉන්දියාවෙන් මෙහි ගෙන්වූයේය. ඒ පිරිසෙහි එවකට ලංකාවට සුදුසු අධ්‍යාපනය ඇතිකර ලීමට අවශ්‍යවූ ප්‍රබල ආචාර්යවරයෝ වූහ. ඒ ආචාර්යවරයන්ගේ ප්‍රභවය ඉන්දියාවෙන් ඇතිවූවාක් මෙන්ම අධ්‍යාපනයද ඉන්දියාවෙන් ලැබුණේයයි කීම විතර්කයට පාත්‍රනොවූවකි. ඒ ආචාර්යවරයෝ දඹදිව ක්‍රමයටම මෙහි ප්‍රථම වරට අධ්‍යාපනය පටන්ගත්තෝය. සිව්සැට කලා පිළිබඳ අධ්‍යාපනයක් එකල තිබුණබවට ඉතිහාසානු ගත කරුණු මෙසේයි:– **“මහාවංශයෙහි** 37 වෙනි පිටෙහි” පඬුරුද



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ලිපුම්ද රජහට දැක්විය. යන්නෙන්ද, එහිම "සතුරන් දිනූ රජහට ලියමන්දී එවූයේය. යන්නෙන්ද 39 වෙනි පිටේ "ඇමතියන් හා මන්ත්‍රණය කොට හසුන්පත් යැවූයේය." යන වාක්‍යයෙන්ද අක්ෂරය හා ලිඛිතයන් තිබුණබව පෙනේ. **රාජාවලියෙහි** 19 වෙනි පිටෙහි "**කුවේනියගේ** ලැමද පයොධර තුනින් මැද පයොධරය මැකුණුවිට හිමිකෙනෙකුන් ඇතිවන බව ඉසිවරුන් කීවාට" යන්නෙන්ද **මහාවංශයෙහි** අටවන පරිච්ඡේදයෙහි "ඇමතියෙක් නෙමේ බැහැර නිමිත්ත පාඨකයකුගෙන් ක්ෂත්‍රියයන්ගේ ඊම විචාළේය." යන්නෙන්ද ජ්‍යොතිර් ඥානය ඇත්තෝ සිටියාහුනම් ගණිතයද එහිම ඇතුළත් වියයුතු බැවින් ගණිතයද තිබුණ බව පෙනේ. "මිනිස්සු බත් හා සූපයන් උයා රජකුමරු බත් කවා සියල්ලෝද කෑවෝය. යන මහාවංශ පාඨයෙන් සූපශාස්ත්‍රයද තිබුණ බව පෙනේ. මේ ආදි ක්‍රමයෙන් එකලැ පූර්වොක්ත ශිල්පශාස්ත්‍රයන් පිළිබඳ අධ්‍යාපනය තිබුණ බව සාක්ෂිසහිතව පැවසීමට පිළිවන. එය හින්දු ක්‍රමනුකූලව චතුර්වේදයේ නිපුණ බ්‍රාහ්මණයින් ලවා කරවන ලද්දේය. මිහින්තලේ අසල දොරමඩලාවේ පදිංචිව සිටි පණ්ඩුල නම් බ්‍රාහ්මණයෙක් ක්‍රිස්තුවර්ෂයට පෙර හතරවන ශතවර්ෂයේදී පණ්ඩුකාභය රජුට ඉගැන්වීම කළබව ඉතිහාසයෙන් පෙනේ. රාජගුරුවූ ඒ බ්‍රාහ්මණ පඬිවරු රාජපූජිතව රජවරුන් විසින් සාදවනලද ආරාමවල විසූවෝය. මේ ආරාමවලදී කවර ශිල්පශාස්ත්‍ර උගන්වනු ලැබුවේදැයි නිශ්චය වශයෙන් දැනගන්ට නැත. එහෙත් දීඝගාමිණී කුමරු විසින් "ඛකීටක" නමැති යන්ත්‍රයක ආධාරයෙන් උන්මාද චිත්‍රා කුමරියගේ එකසතම්භ බන්ධනාගාරයට ඇතුල්වීමෙන් පෙනීයන්නේ යන්ත්‍ර සූත්‍ර පිළිබඳවූද ඉගැන්වීමක් ඒ කාලයේදීත් පැවති බවයි.

**බෞද්ධ සමය ලංකාවට ගෙන ඒම** සමග මෙහි අධ්‍යාපනය ප්‍රකෘතිමත් වූයේය. වේදය පිළිබඳ ඉගැන්වීම ක්‍රමයෙන් අභාවයට ගොස් ඒ වෙනුවට බෞද්ධ භික්ෂූන් විසින් බුද්ධ ධර්මය සහ පාළි භාෂාව ඉගැන්වීම ආරම්භ කරන ලදී. මෙතැන්සිට භික්ෂූන් වහන්සේලා සිංහලයින්ගේ අධ්‍යාපනාචාර්යවරයෝ වූහ. පිරිවෙන් ඇතිවූහ. ගමක් හෝ පන්සලක් පාසා පිරිවෙණකි. එයින්ම සිංහලයාගේ විනීතත්වය ප්‍රාරම්භවිය. එකල සිංහලයා අදට වඩා ප්‍රඥා, සූර වීර ගුණාදියෙන් පරිපූර්ණ විය. එබැවින් ජාතීන් අතුරෙන් සිංහල ජාතිය ශ්‍රෙෂ්ඨත්වයට පත්විය. ලංකාවේ එවකට ඇතිවුනාවූ සිය ගණන් පිරිවෙන් අතුරෙන් පළමුවෙන් ඉතිහාසානුගත වූයේ අනුරධපුර මහා විහාරයේ තිබුණ **කාලප්‍රාසාද**

පිරිවෙණය. ඊට පසු ප්‍රසිද්ධියට පැමිණියාවූ පිරිවෙණක් නම් **දෙවානම් පියතිස්ස** රජුගේ දික්සඳ සෙනෙවියා විසින් ආරම්භ කළාවූද ධාතුසේන රජු දවස මහාවංශ කතෘ ආදී උතුමන්ගේ ප්‍රධානත්වය පිට පැවතුනාවූද **දික්-සඳ සෙනෙවියා** පිරිවෙණය. මේ පිරිවෙන්වල ඉගැන්වීම කළෝ බෞද්ධ භික්ෂූහුය. උන්වහන්සේලාට වැටුප් නොලැබුණත් රජුන්ගෙන් සියලු උවැටන් ලැබුණේය. ශිෂ්‍ය පිරිසද උපස්ථාන පාරිචර්යාදීන් ගුරුවරයාට ගරුබුහුමන් පැවැත්විය. ඔව්හු පාඩම ආරම්භයේදි සහ අවසානයේදී ස්වකීය පොත්වලට වඳින සිරිතක් කළෝය. මොවුන්ගේ අධ්‍යයනය වැඩි වශයෙන් වනපොත් කිරීම වූයේය. ආචාර්ය තාගෝර් තුමාගේ **"ශාන්ති නිකේතන්"** නමැති විශ්ව විද්‍යාලයේ මෙන් ඉගැන්වීම **එළිමහනේ** සෙවන ඇති ගස්යට කරනලදී. මේ පිළිබඳ මනා විස්තරයක් **"ගිරාසන්දේශයේ"** ඇත්තේය. බ්‍රාහ්මණාචාර්යවරු සංස්කෘත ඉගැන්වීමෙහි නිරත වූවෝය. මහානාම මහා ස්ථවිරතුමා ධාතුසේන රජුගේ ගුරුවරයා හැටියටද එකවට තිබුණාවූ සියලු ශිල්ප ශාස්ත්‍රයන්ගේ කෙළ පැමිණියාවූ තනදමහ තෙරුන් වහන්සේ සිරිසඟබෝ රජුගේ ආචාර්යවරයා මෙන්ද සිටි බව කාවුරුත් පාහේ දන්නා කාරණයකි ක්‍රිස්තු වර්ෂ හතරවෙනි ශතවර්ෂය වනතුරුම ලංකාවේ සාහිත්‍යය ගැන කිසිවක් දැනගන්ට නැත මේ කාලයේදී බුද්ධදාස රජතුමා ආයුර්වේදය ගැන **"සාරාර්ථ සංග්‍රහ"** නමැති සංස්කෘත ප්‍රකරණය කෙළේය. එයින් පෙනීයන්නේ රජුන් පවා එවකට ලංකාවේ බහුල වශයෙන් තිබුණාවූ සංස්කෘතය ඉගෙණීමෙන් ප්‍රයෝජන ගත් පරිදියි. ක්‍රිස්තු වර්ෂ හවෙනි ශතවර්ෂයේදී කුමාරදාස රජු විසින් **"ජානකීහරණ"** නමැති තවත් ශ්‍රෙෂ්ඨ පද්ධතියේ සංස්කෘත රචනාවක් කිරීමෙන්ද අපට අවබොධ වන්නේ සංස්කෘත භාෂාව එවකට සිටි ලාංකිකයන්ට මනාසේ තේරුම් ගතහැකිවූ බවයි. ශල්‍ය කර්මය සහ ඖෂධයන් පිළිබඳ අධ්‍යාපනය බුද්ධදාස රජ කාලයේදී රටේ පැතිර සිටිබව ගමක් ගමක් පාසා තිබුණ ආරෝග්‍ය ශාලාවලින් ඔප්පු වේ. අනුක්‍රමයෙන් සාහිත්‍යයද දියුණු වෙන්ට පටන් ගත්තේය. අග්‍රබෝධි රජු දවස පමණක් (ක්‍රි: ව: 564) සිංහල පද්‍යයන් ප්‍රබන්ධ කළාවූ ප්‍රසිද්ධ කවිවරයන් දොළොස් දෙනෙක් සිටියෝය

**ක්‍රිස්තු වර්ෂ හත්වෙනි ශතවර්ෂය පමණේදී** බ්‍රාහ්මණාචාර්යවරු ලංකාධ්‍යාපනයෙහි ප්‍රමුඛස්ථානයක් නැවත වරක්ද දරන්ට වූහ. ක්‍රි: ව: 15 වෙනි ශතවර්ෂයේදී කරනලද පැපිලියානේ ගල් සන්නසේ සඳහන් වන පරිදි මේ පාරදෙශික ආචාර්යවරුන්ට

ලක් රජුගෙන් වැටුප් සහ නින්දගම්ද ලැබුණේය. ලංකාවේ පැවති පිරිවෙන් ගැන කරුණු සොයා ගැනීමට ඉතිහාසාර්ණවයෙහි නිමග්නවන කෙනෙකුට බැරිකමක් නැත. එයින් නාම මාත්‍රාවශිෂ්ට කතිපයක් පමණක් ප්‍රකාශ කරමි. (අ) බුද්ධදාස රජු කල (ක්‍රි: ව: 339) මොරතර පිරිවෙණ, (ආ) I අග්‍රබෝධි රජු කල (ක්‍රි: ව: 564) සිරිසඟබෝ පිරිවෙණ, (ඉ) III අග්‍රබෝධි රජුකල (ක්‍රි: ව: 623) අග්බෝ පිරිවෙණ, (ඊ) V කාශ්‍යප රජුකල (ක්‍රි: ව: 928) ග්‍රන්ථාකර පිරිවෙණ සහ භණ්ඩික පිරිවෙණද, (උ) III විජයබා රජුකල (ක්‍රි: ව: 1264) විජයබාහු පිරිවෙණද, (ඌ) II වෙනි පරාක්‍රමබාහු රජුකල (ක්‍රි: ව 1350) පරාක්‍රමබාහු පිරිවෙණද භුවනෙකබාහු පිරිවෙණද, මහ මිහිඳු පිරිවෙණද (ඍ) IV පණ්ඩිත පරාක්‍රමබාහු රජු දවස (ක්‍රි: ව: 1305) පරාක්‍රමබාහු පිරිවෙණද යන ක්‍රමයෙන් පිරිවෙන් කීපයක්හුගේ නාමමාත්‍ර පමණක් ඉතිහාසාභිලාෂීන් වෙතෙහි තැබීමට පිළිවන. ක්‍රිස්තු වර්ෂ 15 වෙනි ශත වර්ෂයේදී උත්තර මූල පිරිවෙණද, විල්ගම්මූල, දීඹුලාගල, පැපිලියානේ, රයිගම, මහානෙත්‍ර ප්‍රාසාද මූල, කෑරගල සහ දෙවිනුවරද මේ ආදී පිරිවෙන් රාශියක් තිබුණේය. පිරිවෙන්වල ප්‍රධාන වශයෙන් උගැන්වූයේ සම්බුද්ධ ධර්මයයි. එය ප්‍රමුඛත්වයෙහි තබා පාළි සිංහල සංස්කෘත භාෂා ව්‍යාකරණ ශාස්ත්‍රාදිය ඡන්දෝලංකාර නිරුක්ති නිඝණ්ඩු ආදී ශාස්ත්‍රද තර්ක මීමාංසාදියද එකී පිරිවෙන්වල අධ්‍යාපනය කරවන ලදි. පලාබද්දල ප්‍රතිරාජ පරිවෙණාධිපතිත්වය ඉසුලුවේ වේදෙහ ස්වාමීන් වහන්සේය, සිදත් සඟරාවද මුන්වහන්සේගේ කෘතියකි. ප්‍රතිරාජ පරිවෙණාධිපතිවූයේ අනවම දර්ශී ස්වාමිපාදයන් වහන්සේ යයි සමහරු කියත්. ගිහි ආචාර්යවරුන් අඩගම්මඩුවලදී යුධ, සරඹ, ධනු ශිල්පය, මල්ලව පොර සහ අසරු සතරද ඉගැන්වූ බව පෙනේ. පිරිවෙන් හැර පන්සලක් පාසා විද්‍යාස්ථානද තිබූ බව අද දක්වා දකින්ට තිබෙන වැලිපෝරු භාවිතයෙන් අපට කිව හැක. ලක්දිව අධ්‍යාපනය සම්බන්ධයෙන් සිහිකටයුතු කාන්තාවන් අතුරෙන් රත්නාවලී බිසවද කෙනෙකි. ඒ බිසවගේ දක්ෂකම හා පණ්ඩිතත්වය සලකනවිට ස්ත්‍රී පක්ෂයටද ඒ කාලයේ අධ්‍යාපනයක් තිබුණු බව වැටහේ. විජයබා පරිවෙණාධිපති ශ්‍රී රාහුල මාහිමියන් වහන්සේ ෂඩ්භාෂාපරමෙශ්වරවද ත්‍රිපිටකධාරිවද විජෘම්භමානවූ බැව් අප කාවුරුත් දන්නා සත්‍යයකි. උන්වහන්සේගේ සාමර්ථ්‍යය පසළොස් හැවිරිදි කාලයේම සකන්ධ කුමාරවර ප්‍රසාදයෙන් දක්වන්ට ලැබුණේලු. පූජාවලී කර්තෘද මේ බන්ධනයම අත්හදා බලන්ට යො-

මේන් ඇසක් නැතිකර ගත් බව මෙහිදී සිහිපත් කරවනු කැමැත්තෙමු. තොටගමුවේ පිරිවේණට විදෙශීය රටවලින්ද ශිෂ්‍යයෝ පැමිණුනාහ. ඔවුන් අතුරෙන් චන්ද්‍රභාරතී බ්‍රාහ්මණයාද කෙනෙකි. මන්ත්‍ර ශාස්ත්‍රයෙ අඟතැන් පැමිණි ශ්‍රී රාහුල මා හිමියන් වහන්සේ ස්වකීය කටයුතු කරවා ගැනීමට යක්ෂයින් බඳවාගෙන සිටියේල. උන්වහන්සේ විසින් මතුරන ලද ඖෂධ වර්ගයක් ආලේප කිරීමෙන් ස්වකීය මෘත ශරීරය අවුරුදු දහසක් නො නැසී පැවතීමට කටයුතු සලස්වන ලදි, මෙය "සුධ ක්‍ෂාවියර්" ගේ මෘත ශරීරයයි කතෝලිකයින් විසින් විශ්වාසකොට ගෝවේ නුවර දෙවස්ථානයේ ගරුබුහුමන් ලබමින් අද දක්වාම පවතී.

අධ්‍යාපන උපකරණ වශයෙන් ඒ කාලයේ කළුලැලි තිබුන බවක් දැනගන්ට නැත. පන්හිඳෙන් ලියා කළමදින ලද පුස්කොළ පොත් පමණක් තිබුණුබව පෙනේ. මුද්‍රණ යන්ත්‍රාලය එවකට නොතිබීම මහත් පාඩුවක් වූවා පමණක් නොව පොත් මිලදී ගැනීම හෝ පිසුරුවා හැරීම දුෂ්පතෙකුට කරන්නට බැරි කාරණයක් වූයේය.

**ලඞ්කාධ්‍යාපනයෙහි අභාග්‍ය කාලයක්.** යථොක්ත ක්‍රමයෙන් පිරිවෙන් මාර්ගයෙන් ආවාවූ අධ්‍යාපනය පරිහානි පක්ෂයේ ගමන් කිරීමට පටන් ගත්තේය. ක්‍රිස්තු වර්ෂ 13 වෙනි ශත වර්ෂයේදී කාලිඞ්ග මාඝ රජු විසින් බෞද්ධ සාහිත්‍යය සුන්කර දමන්නට ප්‍රයත්න දරන ලදි, ද්‍රවිඩ රජුන්ගෙන් ඇතිවූ හිරිහැර නිසා පරිවේණාචාර්යවරු මන්දෝත්සාහි වූහ. ක්‍රිස්තු වර්ෂ 1581 දී සීතාවක රජ කළ I වන රාජසිංහ රජු විසින් බෞද්ධ භික්ෂූන්ගේ පොත්පත් සියල්ල ගිනි ජාලාවට ගොදුරු කිරීමෙන් ලඞ්කාධ්‍යාපනයට ඇතිවූ පාඩුව මෙතෙකැයි නිශ්චය කරන්ට බැරිතරම්ය. ක්‍රිස්තු වර්ෂ 1786 පමණේදී මහනුවර රාජ්‍යශ්‍රීයට පැමිණි රාජාධිරාජසිංහ නරේන්ද්‍රයා එකල පරිහානි පක්ෂයේ ගමන් කළ අධ්‍යාපනය නගා සිටුවීමට මහත් ප්‍රයත්න දැරීය. වැලිවිට සරණඞ්කර සඞ්ඝරාජ මාහිමි තුමා පිරිවෙන් අධ්‍යාපනය නැවත ජොතිස්නා මෙන් හළුයටලු ගිනි පුපුරක් කෝලේය. ඒ ගිනි පුපුර බොධිසත්ව ගුණොපෙත භික්ෂූවේ ශ්‍රී සුමඞ්ගල නායක මාහිමියාණන් වහන්සේද ශ්‍රී ධර්මාරාම නායක මාහිමියාණන් වහන්සේද වැලිගම ශ්‍රී සුමඞ්ගල නායක මාහිමියන් වහන්සේද මතුකොට දෙශ දෙශාන්තරයන්හිද දල්වා හැරියෝය. අද දවසේ ලඞ්කාවේ පවත්නා ප්‍රාචීන ශාස්ත්‍රාලොකයට මුන්වහන්සේලා මුල්වූහ.

**පෘතුගීසි ආණ්ඩු කාලයේදී** වර්තමාන පාඨශාලාධ්‍යාපනය පටන් ගන්නා ලද්දේ යයි කීමට ඉඩ තිබේ. යුරෝපයේද ප්‍රථම අධ්‍යාපනය පූජකයන් අතේ තිබුණාක්මෙන්ම එයම ලංකාවට යෝග්‍ය වේයයි ඔව්හු සිතුවෝය. ඔවුන්ගේ අධ්‍යාපනයේ එකම අදහසවූයේ රෝමාණු කතෝලික ධර්මය පැතිර වීමයි. ක්‍රිස්තු වර්ෂ 1540 දී කෝට්ටේ රජුගේ ආරාධනය පිට ශුද්ධ ප්‍රැන්සිස්ගේ නිකායේ පාදිලිවරු ලංකාවට පැමිණියෝය. ඔව්හු අනුක්‍රමයෙන් ක්‍රිස්තු භක්තිකයන්ගේ සංඛ්‍යාව වැඩි කරමින් කොළඹ හේවාගම් කෝරළය සහ යාපනේ ශාස්ත්‍ර ශාලා පිහිටෙවුවෝය. එහි ආගම කියවීම ලිවීම ගණිතය කණ්තාරු කිරීම් ලතින් භාෂාව හා අලංකාර ශාස්ත්‍රයද උගන්වන ලදහ. මීට වුවමනා සියලු වියදම් රාජභාණ්ඩාගාරය විසින් දරනලදී. සිංහල රදල පවුල්වල තරුණයෝ ක්‍රිස්තු භක්තිය වැළඳ ගත්තෝය. වඩ වඩා ශාස්ත්‍ර ශාලා පිහිටුවීමට කෝට්ටේ රජකළ දෙන් ජුවන් ධර්මපාල රජතුමාගෙන් මුදල් ඉල්වන්ට යෙදුනෙන් හෙතෙම බෞද්ධ විහාර සන්තක ඉඩම් මේ පාදිලිවරුන්ට තෑගි කෙළේය. මීට බෞද්ධයෝ විරුද්ධවූහ කාඩුවේ. බලයෙන් ඒ ඉඩම් බලහත්කාරයෙන් අල්වා ගත්හ. නමුත් මේ ආදායම පෘතුගීසි අමාත්‍යයින් විසින් උදුරා ගන්නා ලදී. ක්‍රිස්තු වර්ෂ 1602 දී ජැසුඉට් නිකායේ පාදිලිවරු කොළඹට පැමිණ කොළඹ ශාස්ත්‍ර ශාලවක් පිහිටෙව්වෝය. අවුරුදු විස්සක් ගතවන්ට ප්‍රථම යාපනේද, ගාල්ලේද එවැනි ශාස්ත්‍ර ශාලා රාශියක් ඇති කළෝය. මීටපසු ඩොමිනිකන් නිකායේ පාදිලිවරු පැමිණ කොළඹ තාපසාරාමයක් හා රඹුක්කන කතෘ මඩමක්ද විවෘත කළෝය. කොළඹ මෝදර තිබුණාවූ ෆ්‍රැන්සිස්කන් වරුන්ගේ අනාථ මඩමේ වියදම උදෙසා ඊට නුදුරුවූ ගම් දෙකක ආදායම් බදුවලින් කොටසක් වෙන්කරන ලදී. සීතාවක රජකළ 1 වන රාජසිංහ රජුගේ මුනුබුරෙක්වූ නිකපිටියේ බණ්ඩාර නමැති ශිෂ්‍යයා පළමුවෙන් කොළඹද ඊට පසු ගෝවේද ශාස්ත්‍රෝද්ග්‍රහණය කොට **කොයිම්බ්‍රා** විශ්වවිද්‍යාලයට ඇතුල්විය. එහිදී ඔහු මරුමුවට පැමිණියේය. බටහිර විශ්වවිද්‍යාලයකට ඇතුල්වූ පළමුවෙනි ලාංකික ශිෂ්‍යයා මොහු වූයේය. කුසජාතක කතෘභූත අලගියවන්න මොහොට්ටාල කොළඹට පැමිණ ලතින් භාෂාව හා අළුත් තෙස්තමේන්තුව කටපාඩමින් කීමට නයමාසයක් ඇතුළදී ඉගෙණ ගත්තේ ලු. ජැසුඉට් පාදිලිවරුන්ගේ ඉගැන්වීම ගැන ප්‍රසන්නවූ ධර්මපාල රජතුමා ඔවුන්ගේ සහ ශාස්ත්‍ර

ශාලාවල වියදම පිණිස කොළඹට ආසන්නවූ මහගම් දොළසක් නිඳගම් කොට දුන්නේය. ඔවුන්ට කල්පිටියේ අඹීම්පයද මෙලෙසම ලැබුණේය.

**ඕලන්ද ආණ්ඩු කාලයේදී** ලංකාධ්‍යාපනය යුහුව දියුණු වූයේය. ඔවුන්ගේ ලංකාතරණය සමගම පෘතුගීසින්ගේ රෝමානු කතෝලික ආගම රෙප්‍රමාදු සමයට පරිවර්තනය විය. ඔවුන් ඇතිකළ පාඨශාලාවල පරමාධ්‍යාශය වූයේ ලාංකික බාලක බාලිකාවන් ස්වකීය රජපාක්ෂික භාවයෙන් තොරකොට ඕලන්දයේ වික්‍රමය සහ තේජස ඔවුන් සිත්හි ධාරණය කිරීම විය. ක්‍රිස්තු වර්ෂ 1712 දී සිංහල ග්‍රාමීය පාඨශාලා 24 ක්ද දෙමළ පාඨශාලා 6 ක්ද තිබුණේය. 1723 පැමිණිකල පාඨශාලාවන්ගේ සහ ශිෂ්‍යයන්ගේ ගණන වැඩිවූයෙන් ඕලන්ද වෙළඳ සමාගම සෑම පාඨශාලාවකට දෙවෙනි උපගුරුවරයෙකු බැගින් පත්කෙළේය. දක්ෂ සිංහල ශිෂ්‍යයන් ස්වල්ප දෙනෙකුට ඕලන්ද භාෂාවද ඉගැන්වීමට නියමවිය. 1725 දී සිඩවූ ජලගැල්ම සහිත සාගතය නිසා ශිෂ්‍යසංඛ්‍යාව කෙතරම් පහත බැස්සේද කිවහොත් 1735 වන කොට අධ්‍යාපනය අප්‍රාණික අඩියට පැමිණියේයයි කිවහැකිව තිබුණි. ඊළඟ වර්ෂයේදී වොන්ඉම්හොෆ් ආණ්ඩුකාරයාගේ පැමිණීම සමගම අධ්‍යාපනාංගනාවට සමෘද්ධිකාලයක් ආරම්භ විය. එහෙත් ගුරුවරුන්ගේ අදක්ෂ භාවය නිසා පරීක්ෂකවරුන්ගේ ඉදිරියට නොබා පා තැබීමට ඕනොමෝ මැලිවූවාය. 1739 දී මුද්‍රිත පොත් පළමුවරට මෙරට ඇතිවීමෙන්ද, 1747 දී සිංහල දෙමළ ගුරුවරුන් පුහුණු කිරීමට විද්‍යාභ්‍යාස පාඨශාලාවක් කොළඹ නගරයේ විවෘත කිරීමෙන්ද යථෝක්ත අඩුපාඩු කල්යාමෙන් දුරුවිය. ගුරුවරුන් රහසේ බෞද්ධයින්වී සිටි බැවින්ද මද්‍යපානයෙහි ලොල්වූ හෙයින්ද, තණ්හාධික ආත්මාර්ථකාමීන්වූ නිසාද පාඨශාලාවල දියුණුව ආණ්ඩුවේ බලාපොරොත්තු වලට ප්‍රමාණ නොවිය, 1778 වනකොට මිශ්‍ර පාඨශාලා 46 ක් දියුණු තත්වයේ අංකයන්ට ඇතුළත්විය. ඒවායේ ගැහැණු ශිෂ්‍යයෝ වැඩිවිය පැමිණි පසුත් (විවාහ වනතුරු) ඉගෙණීම ලැබුවෝය. 1784 දී කොළඹ දිස්ත්‍රික්කයේ පාඨශාලා 53 ක් තිබුණේය. 1722 දී ගාලු සහ මාතර දිස්ත්‍රික්කවල ඇතිවූ ස්වදේශික පාඨශාලා 38 ක් ගාල්ලේ පාදිලිවරුන්ගේ සාංවත්සරික පාඨ පරීක්ෂණ ඇතුව පැවති බව පෙනේ. මේ පරීක්ෂණවලට සිංහලයෝ නොයෙක්විට විරුද්ධවී කෝලාහල කළෝය. 1759 දී ඕලන්දයට යැවූ වාර්තාවක මෙහි පහත සඳහන්වන විස්තර ඇතුළත් වූහ. එනම්:–"බෙන්තොට ඉතා හොඳ පාසැලද, ඉදුරුවේ අනතිම නරක

පාඨශාලාවද, කොස්ගොඩ සහ වැලිතොට පාඨශාලා දෙකක්ද, මාතර කුඩා පාඨශාලාවක්ද වැලිගම සහ ගාල්ලේ දූමිල තත්ත්වයේ පාඨශාලාද, අම්බලන්ගොඩ පාඨශාලාවේ වයෝවෘද්ධ ගුරුවරයා ශිෂ්‍යයන් ගැන මහත් උනන්දුවෙන් ක්‍රියාකරන්නෙකු බවද දෙවුන්දර සහ අකුරැස්සේ සාංවත්සර විභාගවලදී ගම්වැසියන් කොළාහල කළබවද පොල්වත්ත (දෙනිපිටිය අසල) පාසැලේ ගුරුවරයා ශිෂ්‍යයන් සවල්පදෙනෙක් එකතුකරගත් නමුත් ඔවුන් සලාකිය බවද" යනුයි. යාපන දිස්ත්‍රික්කයේ පාඨශාලා පිළිබඳ තත්කාලීන වාර්තාව සවිස්තරව දතනොහැක. ද්‍රවිඩ ශිෂ්‍යයෝ කඩිනමට ඉගෙණීමෙහි දක්ෂයෝයයි වාර්තාවී තිබේ. ඉහතකී සවදේශික පාඨශාලාහැර සිංහල පූජක පාඨශාලාවක් 1708 දී කොළඹ පටන්ගන්නා ලදී. එහි අදහසවූයේ දේශනාකාරයින් පුහුණු කරවීමය. එහි කථිකාචාර්යවරු ඕලන්ද භාෂාව ව්‍යාකරණ සහ වාක්‍යරචනාවද ලතින්, ග්‍රීක් සහ හීබ්‍රෑ භාෂාවන්ද දේවධර්ම ශාස්ත්‍රය තර්කය සහ ගණිතයද ඉගැන්වූහ. අවසාන විභාග දිනයේදී ආණ්ඩුකාරතුමා ඔහුගේ අනුශාසක මණ්ඩලය කැටිව පැමිණේ. පරීක්ෂකවරු වශයෙන් ඔහු විසින් විශේෂ කාරක සභාවක් පූජක පිරිසෙන් තෝරා පත්කරනු ලබයි. මෙහි ඉගෙණීම ලැබූවාවූ. සිංහලයෙකු සහ එරෝපාකාරයෙකු ආණ්ඩුවේ වියදමින් ලේඩන් විශ්ව විද්‍යාලයේ වැඩිදුරට ඉගැන්වීම සඳහා පිටත් කර යැවූබව සැලයි. යාපනේද පූජක පාඨශාලාවක් නොබෝ කලකින් උද්ගතවිය. සවදේශික පාඨශාලාහැර ඕලන්ද පාඨශාලා 17 ක් කොළඹ, ගාල්ල සහ යාපනේ තිබුණේය. යුරෝපාකාර ළමයින්ට පමණක් කියවීම, ලිවීම, ආගම, කථොපකථනය, කණ්ඨාරු කිරීම, ගණිතය සහ භූගොල ශාස්ත්‍රය මේ පාඨශාලාවල ඉගැන්නුවෝය. මේවායේ පාලනය ආණ්ඩුකාරතුමා විසින් පත් කරණු ලැබූ අධ්‍යාපන මණ්ඩලයකින් සිඩකෙළේය. මේ සභිකයන් ගෙන් යටත් පිරිසෙයින් දෙදෙනෙක් පාඨශාලාවලට ගොස් සාංවත්සරික වාර්තාව සම්පාදනය කිරීම සඳහා ශිෂ්‍යයන් විභාග කළෝය. ඇනම්විට ඔව්හු ත්‍යාගී ප්‍රදානොත්සව ඇතිකරලීමෙන්ද ශිෂ්‍යයන්ට ධෛර්ය දුන්නෝය. අස්වීමට කාලය පැමිණ තිබේයයි පරීක්ෂක තුමා නිඥකළායින් පසු පමණක් ශිෂ්‍යයෙකුට පාඨශාලාවෙන් අස්වීමට බලය තිබුණේය. ඉගැන්වීම නොමිලයේ විය. අවුරුද්දේ වාර්තාවන් ආණ්ඩුකාරතුමා විසින් බලා විදෙශීය ඉගැන්වීම පිළිබඳ එක රපෝර්තුවක් ඔහු විසින් ඕලන්ද වෙළඳ සමාගමේ ප්‍රධාන ස්ථානයට යවනු ලැබේ. 1736 වකහෙක් පාඨශාලීය උපකරණ සම්පාදනය කිසිසේත් තරම් නොවිය. ශිෂ්‍යයන්ට පොත් තිබුණේ නැත. තිබුණා නම් ඉතා සවල්පයකි. ගුරුවරුන්ට දෙනුලැබූ

පොත් ස්වල්පයෙන් ශිෂ්‍යයින්ට කටපාඩම් වනතුරුම කියෙව්වෝය. බාල ශිෂ්‍යයෝ අක්ෂරෝච්චාරණය පුරුදු කරමින් පාඨශාලාවේ බිම හෝ ගල් බංකුවක අතුරනලද වැල්ලෙහි ලියන්ට ඉගෙණ ගත්තෝය. වැඩි මහලු ශිෂ්‍යයෝ පන්හිඳකින් තල්පත් වල හෝ පුස්කොළවල ලියන්ට ඉගෙණීම ලැබුවෝය. 1736 දී මුද්‍රණ යන්ත්‍රාලය ආණ්ඩුවේ වැඩ කිරීම සඳහා භාවිතයට පැමුණුන බැවින් පාඨශාලීය පාඨ්‍ය පුස්තක බොහොමයක් අච්චු ගැසීමටද ස්වභාෂාවලට පරිවර්තනයටද පටන් ගන්නා ලදී. ලේඩන් විශ්වවිද්‍යාලයේ සිට ජන්මභූමියට පැමිණියාවූ තරුණයින් දෙදෙනෙකු හෝ තිදෙනෙකු ග්‍රන්ථ පරිවර්තනයෙහි යෙදෙව්වෝය. මෙය ක්‍රිස්තු සමය හා අධ්‍යාපනය විසුරුවා හැරීමට බෙහෙවින් උපකාර විය. සියලුම පාඨශාලා ගෘහයෝ එකම සැලැස්මකට අනුව තැනුවාවූ ආයත චතුරස්‍රාකාර ගොඩනැගිලි වූහ. පොළොවේ සිට අඩිපහක් උසට වට්ට බිත්ති සාදා තිබුණේය. මේ කොට බිත්තිවලට උඩින් එකසමාන පරතරයක් ඇතිවෙන්ට ගල්කණු නංවා ඒ උඩ උළුසෙවිලිකළ වහලක් ගසා තිබුණේය. ගල්කණු අතර ජනේල වෙනුවට කුඩා ගරාදිවලින් පුරවන ලදී. එක ලී පුටුවක් සහ මේසයක් ගුරුවරයාගේ පාවිච්චියට පමණක් තිබුණේය. නමුත් ඔහු එය කවදාවත් පාවිච්චි කළේ නැත. ඉතාමත් කලාතුරකින් පාදිලිතැන පමණක් මේ බඩුදෙක පාවිච්චියට ගත්තේය. බිත්තිවල ඇතුල්පැති වට්ට ගල්බැම්මෙන් කළ පිල් හෝ බංකුවූහ. ගුරුවරයාගේ ඇඳුමම ශිෂ්‍යයන්ගේ සැලකිල්ලට හේතුවිය. සන්සුන් පාටඇති කබායක්ද බොත්තම් ඇමුනු සුදු "වේස්ට්" කෝට් එකක්ද චීත්තරෙද්දක් හෝ සෝමනක්ද කෙලින් පනාවක්ද ඔහුගේ ඇඳුම විය. ශිෂ්‍යයෝ කපුරෙද්දක් පමණක් ඉණවට්ට ඇන්දෝය. ශිෂ්‍යාවන්ගේ ඇඳුම කොටවූ හැට්ටයකින්ද හිසේ ගැසූ පනාවකින්ද රිදී වළලු සහ රත්රන් අරුන්ගල් වලින්ද සමන්විතය. පාඨශාලා ප්‍රධානාචාර්‍ය්‍යවරු නිරායාසයෙන්ම තෝම්බුවේ ලේකම්වරු වූ නිසා සතුරන් හෝ සරදම් කරන්නන්ගෙන් තොරව විසුවෝය. ඔවුන්ට නම්බුදීමක් වශයෙන් "පල්ලියේ රාළහාමි" කියා ගම් වැසියෝ ආමන්ත්‍රණය කළෝය. ඔවුන්ට වරදක් කළ කෙනෙකුගේ උප්පැන්නයක්, විවාහයක්, මරණයක් තෝම්බුවේ ලියා පදිංචිකරවා ගැනීම උගහටය. ඇතම්විට කලින් ලියවා ගන්ට යෙදුනාවූ එවැනි සටහන් පවා තෝම්බුවෙන් අස්කර දැමීමටද මූල් ගුරුවරයාට හැකිව තිබුණේය. තෝම්බුකාසි ඔහුගේ ආදායමේ ප්‍රධාන උල්පතයයි සලකන ලදී. ගුරු පඬුරුදු බෙහෙවින් ඔහුට ලැබුණි.

**ඉංග්‍රීසි ආණ්ඩු කාලය.** ක්‍රිස්තු වර්ෂ 1796 දී පටන් ගත් කාල ලංකාධ්‍යාපනය යන්තමකින් ක්‍රමානුකූලව තිබුණේය. නොමිලයේ. සහ නාමයෙන් පමණක් බලාත්කාරයෙන් ලිවීම, කියවීම සහ ක්‍රිස්තියානි ධර්මය පල්ලියේ පාඨශාලාවල උගන්වන ලදී. ඉන් එකකට ගුරුවරු තිදෙනා බැගින් සිටියෝය. ඕලන්දක්කාර පාදිලිවරු සියල්ලන්ම යුද්ධය පිළිබඳ හිරකාරුවන්වූයෙන් පාඨශාලාවල කළමනාකාරත්වය ක්‍රිස්තු වර්ෂ 1799 දී රෙ. ජේම්ස් කෝඩිනල් ඉංග්‍රීසි පාදිලි තැනට පවරනලදී. ඔහුගේ යෝජනාවපිට අධ්‍යාපනය පිළිබඳ වියදම වශයෙන් පවුම් 1500 ක් ඉංග්‍රීසි ආණ්ඩුවෙන් වෙන්කරන්ට යෙදුනේය. නමුත් 1804 දී විදෙශභාර මහලේකම් තුමාගේ නියමයෙන්. නෝර්ත් උතුමාණන් වහන්සේ විසින් තාවකාලික වශයෙන් පාඨශාලා පිළිබඳ මුදල් නවත්වන ලදී. 1809 දී මේට්ලන්ඩ් උතුමාණන් වහන්සේ "**ට්විස්ල්ටන්**" පාදිලිතුමා ලංකාවේ පාඨශාලා භාරකාර සභාවක ප්‍රධානයා හැටියට පත් කෙළේය. බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේගේ ආණ්ඩුකාලය මුලදී (එනම් 1819 දී) පළමු වරට ගැහැණු ගුරුවරියක් පත්කරන ලදී. 1829 දී පත්කරනු ලැබූ කොමිෂන් සභාවක වාර්තාවේ පාඨශාලාවල තත්වය කිසිසේත් සතුටුදායක නොවේයයි සටහන්වූ නිසා 1831 දී හෝර්ටන් උතුමාණන් වහන්සේ ලංකාවට පැමිණෙනවිට පාඨශාලා කිසිවක් දකින්ට නොතිබුණේය. කොළඹ ඇතිවූ ප්‍රථම ඉංග්‍රීසි පාඨශාලාව 1799 දී පටන් ගත් බවත් එහිදී රදලවරුන්ගේ පුත්‍රයින්ට "**සාජන්ට් තොමස් සපල්**" යුධ මූලාදෑනියාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බැරැක්කයේදී ඉංග්‍රීසි ඉගැන්නූ බවද වාර්තාවී තිබේ. බ්‍රවුන්රිග් ආර්යාවගේ පරීක්ෂණය යටතේ ජා ගැහැණු ළමයින්ට ඉංග්‍රීසි, දෙමළ, ක්‍රිස්තියානිය, මැහුම් සහ රේන්ද ගෙතීම ඉගැන්වීමට පාඨශාලාවක් ඇතිවූයේය. 1813 දී මාතර සහ මන්නාරමේද 1815 දී ත්‍රිකුණාමලයේ සහ කළුතරද පාඨශාලා විවෘත කළෝය. 1817 දී කොහෙල්වත්තේ සහ ගල්කිස්සේද 1818 දී කොහිලවත්තේද ඉංග්‍රීසි පාඨශාලා ඇතිවිය. 1820 දී ඉංග්‍රීසි පාඨශාලාවක් කැළණියේද තිබුණේය. මෙසේ පටන් ගන්නා ලද විභාෂා පාඨශාලාවල මුළු ගණන 15 ක් විය. 1820 ටත් 1832 ටත් අතරේ ආණ්ඩුවේ පාඨශාලා කිසිවක් විවෘත නොකළා පමණක් නොව ඇතිව තිබුණු පාඨශාලාවන්ගේ සංඛ්‍යාවද හතර දක්වා අඩුවිය ආණ්ඩුව යටතේ රක්ෂාව ලබා ගැනීමට ඉංග්‍රීසි භාෂාව දැනීම අත්‍යාවශ්‍යකවූ නිසා ඒ ඉගැන්වීම දියුණු කරන ලෙස ආණ්ඩුවට

පෙත්සම් රැශියක් මාස්පතා ලැබුණේය. මේ පෙත්සම් විභාග කළ "මේජර් කෝල් බෲක්" මහතා ඔවුන්ගේ අයදුම ඉෂ්ට කළ යුතු බව වාර්තා කෙළේය. බාන්ස් උතුමාණන් වහන්සේගේ කාලයේදී ලඩකාධ්‍යාපනය කොපමණ දුරට පහත වැටී තිබුණේද යතහොත් මිසියෝනාරි සමාගම් කිහිපයක් මෙරටට නොපැමිණියාහු නම් පෘතුගීසින් සහ ඕලන්දක්කාරයින් විසින් ආරබ්ධවූ මෙ අගනා මෙහෙය සම්පූර්ණයෙන් විනාශභාග් වෙන්ට තිබුණි. බැප්ටිස්වරු 1812 දී ද, වැස්ලියන්වරු 1814 දීද, ඇමෙරිකන් මිසියෝනාරිවරු 1816 දීද, සී ඇම් ඇස් වරු 1818 දීද ලක්දිවට පැමිණියෝය. ඔව්හු සවභාෂා ඉංග්‍රීසි පාඨශාලා සෑම පළාත්වලම විවෘත කිරීමෙන් ගැහැණු සහ පිරිමි ළමයින්ට භාෂාව, කියවීම, ලිවීම, ගණිතය, භූගොල ශාස්ත්‍රය, මැහුම් සහ ක්‍රිස්තියානි ධර්මය උගන්වන්ට උත්සාහ කළෝය. ඒවායින් සමහරක් නේවාසික සහ පූජක පාඨශාලා වූවෝය. 1832 වනකොට මිසියෝනාරි පාඨශාලා සඞඛ්‍යාව 235 ක්ද ආණ්ඩුවේ පාඨශාලා සඞඛ්‍යාව 90 ක්ද වී තත්‍රත්‍ය ශිෂ්‍ය සඞඛ්‍යාව 10,000 කින් පරිමිතවිය. යථොක්ත වර්ෂය ලඩකා පාලන ධර්ම ප්‍රතිසංස්කරණයන්ගෙන් සටහන් වියයුතු අනුස්මරණීය වර්ෂයක් විය. ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවක්ද, අභිනව උසාවි බලපත්‍රයක්ද, රාජකාරිය සහ කුරුඳු බද්ද අවලංගු කිරීමද, පුද්ගලික අදහස් ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් නිදහස්ව ප්‍රකාශ කිරීමට ඉඩ ලැබීමද ඇතිවිය. ඒ සමගම අධ්‍යාපනය සම්බන්ධ ආණ්ඩුවේ ක්‍රියා පටිපාටියද ප්‍රතිසංස්කරණය විය.

1834 දී පළමුවෙනි පාඨශාලා කොමිෂන් සභාව හෝර්ටන් උතුමාණන් වහන්සේ විසින් පත්කරනු ලැබී. එහි ප්‍රධානත්වය කොළඹ අනුනායක පාදිලි උන්වහන්සේ දැරුවේය. ආණ්ඩුවේ භාණ්ඩාගාරික සහ ගණන් පරීක්ෂක මූලාදෑනීහුද බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත තුමාද කොළඹ නගරයේ පදිංචිව සිටි පූජකවරුද මේ සභාවේ සාමාජිකයෝ වූහ. ඔවුන්ගෙන් ආණ්ඩුව බලාපොරොත්තුවූයේ ලඩකාධ්‍යාපනය සහ තදීය පාඨශාලා කෙසේ දියුණුකළ හැකිදැයි පරීක්ෂාකොට ඒ සඳහා සුදුසු යෝජනා උතුමාණන් වහන්සේට වාර්තාකිරීම වේ. කොළඹ, කෝට්ටේ, බද්දේගම, මහනුවර, නැල්ලොරුව යන ස්ථානයන් වර්තමාන ලඩකාධ්‍යාපනයේ මුල්ගල් තැබූ ස්ථානයන් හැටියට සැලකිය යුතුව තිබේ. 1836 දී පටන්ගත් කන්දේ වීථියේ "ඇකැඩැමි" නොහොත් ඊටපසු කොළඹ ඇකැඩැමියි කියාද අනතුරුව රාජකීය ශාස්ත්‍ර ශාලාව කියාද ප්‍රසිද්ධියට පැමිණි ආණ්ඩු

වේ ශ්‍රේෂ්ඨ ඉංග්‍රීසි ශාස්ත්‍ර ශාලාව තව අවුරුදු තුනකින් ශතවර්ෂයක් දික්වූ ජීවිතයකට පැමිණෙනවා ඇත. 1822 දී පටන්ගත් මහනුවර ත්‍රිත්ව ශාස්ත්‍ර ශාලාවට දැනට වර්ෂ 111 ක් ගතවීමෙන් ශතවර්ෂාධික කාලයක් ආයුෂ වළඳන්ට ලැබීම ලාංකික සියලු දෙනාගේම මහත් ප්‍රීතියට කරුණකි. එමෙන්ම දකුණේ පිහිටි "රිජ්මන්ඩ්" ශාස්ත්‍රශාලා තොමෝ තත් ප්‍රතිෂ්ඨාපනයෙන් පස්පනස් වසක් (55) ගතවන්ට ප්‍රථම ලංකාවේ ප්‍රථම අධ්‍යාපන මන්ත්‍රීවරයා ඇතිකරලීමට තරම් භාග්‍ය සම්පන්න වූවාය.

**වර්තමාන ලංකාධ්‍යාපනය** ගැන විස්තරයක් කිරීම මෙහිදී උවමනා නැතැයි අපේ විශ්වාසයයි. නමුදු එය කොතරම් දුරට දියුණුවී තිබේද යනු පමණක්වත් සංක්ෂෙපයෙන් සඳහන් කිරීම මෙහිදී අත්හැර දැමුවොත් මේ ලිපිය අසම්පූර්ණ එකක්වනු නිසැකයි. අද දවසේ ලංකාධ්‍යාපනය මන්ත්‍රීවරයෙකු සහිත හත්දෙනෙකුගේ කාරක මණ්ඩලයකට ආණ්ඩුව භාරකර තිබේ.

මේ හැර ආණ්ඩුවට සහ යථොක්ත අධ්‍යාපන කාරක මණ්ඩලයට ආධාර කිරීමට විසිදෙනෙකුගෙන් යුත් අධ්‍යාපන අනුශාසක සභාවක්ද තිබේ. පාඨශාලා පොත් පරීක්ෂණය සඳහා ඉංග්‍රීසි, සිංහල, දෙමළ පොත් කාරකසභා තුනක් තිබේ. 1932 අවුරුද්ද අවසානයේදී ලංකාවේ තිබුණ පාඨශාලා ගණන 5183 කි. එහි ඉගෙණීම ලැබුවාවූ ශිෂ්‍ය සංඛ්‍යාව 6, 13, 208 කි. මින් 3, 92, 075 ක් පිරිමිද, 2, 21, 135 ක් ගැහැණුද වූවෝය. වර්ෂ 14 කින් යුක්තවූ සමාගම් මගින් හා පුද්ගලික උත්සාහයෙන් ඇතිකළ පාඨශාලාවල ගණන 2595 කි. මේ පසළොස් වර්ෂයේ ආධාර ලබන පාඨශාලාවලට ආණ්ඩුවෙන් රුපියල් 65, 74, 086/79 ක් ගෙවනලදී. ආණ්ඩුව මගින් නඩත්තු කරන පාඨශාලා 1, 548 ක්ද එහි පිරිමි ශිෂ්‍යයෝ 1, 57, 745 ක්ද ගැහැණු ශිෂ්‍යාවෝ 72, 992 ක්ද වූහ. ඒ සඳහා වියදම් වශයෙන් රුපියල් 50, 36, 536 ක් ගෙවන්ට සිදුවිය. අධ්‍යාපනය නිසා ලංකාණ්ඩුවට ගිය මුළු වියදම රුපියල් 1, 26, 97, 211/90 කි. ආධාර ලබන පාඨශාලාවල ගුරු විශ්‍රාම වැටුප් සඳහා 1172 දෙනෙකුට රුපියල් 2, 56, 703/00 ක් ගෙවන්ට යෙදුනේය. ලංකාවේ ජනගහනය ගැන සමකර බලන විට සාමාන්‍යයෙන් අධ්‍යාපනයේ වියදම එක්වැසියෙකුට රුපියල් 2.68 ක් ප්‍රමාණයට වේ. ඉංග්‍රීසි ආචාර්යවරු 4, 923 දෙනෙක්ද ස්වභාෂාචාර්යවරු 14, 024 දෙනෙක්ද, ඉගැන්වීමෙහි නියුක්ත වෙත්. වඩුවැඩ, සූප ශාස්ත්‍රය, ඇඳුම් මැහීම, සායම් සෑදීම, ගෙත්තම්, රේන්දගෙතීම, කුඹල් වැඩ, මුද්‍රණ වැඩ, පොත් බැඳීම

රෙදි වියීම, වේවැල් වැඩ, කූඩා සහ පැදුරු වියීම යනාදී හස්ත කර්මාන්ත ඉගැන්වීමට පාඨශාලා 78 ක් තිබේ. එහි පිරිමි 3, 563 ක්ද, ගැහැණු 37 ක්ද ඉගෙණීම ලබත්. පිරිවෙන් 43 ක් ඇත්තාහ. පන්සල් පාඨශාලා 328 ක්ද, කෝරාන් පාඨශාලා 286 ක්ද තිබේ. රාත්‍රි පාඨශාලා 22 ක්ද ගුරුවරුන් පුහුණු කිරීමට පාඨශාලා 21 ක්ද තිබේ. විභාගකිරීම සඳහා පරීක්ෂක මණ්ඩලයේ වැටුප් වශයෙන් රුපියල් 4, 44, 965 /90 ක් ගෙවන්ට යෙදුනි. ඩන්හැම් අධ්‍යාපනාධ්‍යක්ෂක තුමාගේ කාලයේදී ගුරුවැටුප් නොමසුරුව වැඩිකළ නමුත් මෑතදී එය අඩුකරන ලදී. ඉංග්‍රීසි සහ ස්වභාෂා අධ්‍යාපනය බහුල කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රැකී රක්ෂා නැතිව සිටින උගත් අයවලුන්ගේ සංඛ්‍යාව දිනෙන් දින වැඩිවීමෙන් ඇතිවී තිබෙන ප්‍රශ්නය ඉතා ගැටලු එකකි.

ඉංග්‍රීසි උපාධිනාම ලැබෙන උසස් විභාගවලට ඉගැන්වීම සඳහා විශ්වවිද්‍යාලීය ශාස්ත්‍රශාලාවක් 1921 දී කොළඹ නගරයේ පිහිටුවන්ට යෙදුනේය. 1932 අවසානය වනතෙක් එහිදී උපාධි නාම ලැබූවන්ගේ සංඛ්‍යාව 240 කි. එයද ලංකාවේ උසස් අධ්‍යාපනයට ප්‍රමාණ නොවන්නේය. යන මතය පිට දුම්බර පළාතේ විශ්ව විද්‍යාලයක් පිහිටුවීම සඳහා රුපියල් 30, 00, 000/= ක් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව විසින් වෙන්කරන ලදී. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සෞඛ්‍යය හා ශාරීරික ව්‍යායාම වර්ධනය සඳහා ආණ්ඩුව විසින් දරන උත්සාහයද දිනෙන් දිනම දියුණුවීම මෙහිදී සටහන් කළයුතුව තිබේ. ගොවිකර්මාන්තයද ශාස්ත්‍රානුකූලව ඉගැන්වීම සඳහා පේරාදෙණියේ සහ යාපනේ පාඨශාලා දෙකක් පිහිටුවා තිබේ ඉංජිනේරුවැඩ, වෙළහෙළඳාම් පිළිබඳ ශාස්ත්‍ර සහ චිත්‍ර කර්මාන්තයන් ඉගැන්වීමට කොළඹ නගරයේ පිහිටුවන ලද ශිල්ප ශාස්ත්‍ර පරිභාෂික ශාස්ත්‍රශාලාව අනල්පවූ මෙහෙයක් ඉටුකරයි.

දිනෙන් දිනට ලංකාධ්‍යාපනය දියුණුවීම දකින්ට ලැබීම අප සියලුදෙනාගේම ප්‍රීතියට කාරණයකි. මෑතදී ආරබ්ධ ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය රටේ වඩ වඩා පැතිරයාමෙන් අපේ අධ්‍යාපනයෙන් රටට සෙතක්වනු නියතයි.

එය එසේම වේවා!

---

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

වැලිතර ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේ ප්‍රධානාචාර්ය
**ඩී. ඒ. ද සිල්වා මහතා විසින්**
සම්පාදනය කරණ ලදී.

---

# ලෝකයේ ස්වාභාවික ප්‍රදේශ.

---

පිහිටීම, භූමි ලක්ෂණය, වායුගුණය, වෘක්ෂ ලතාදිය, සත්ත්වයා හා මනුෂ්‍යයා සම්බන්ධ කරුණු මුල්කරගෙන පෘථිවිතලය පහත සඳහන් ස්වාභාවික ප්‍රදේශවලට බෙදනු ලැබේ.

**එනම්:-**

I නිරක්ෂ රේඛාව සම්බන්ධ ඝන වනාන්තර ප්‍රදේශ
II " " උප " "
III නිවර්තන රේඛා සම්බන්ධ කාන්තාර ප්‍රදේශ.
IV මධ්‍යධරණීය ප්‍රදේශ.
V ස්ටැප්ස් ප්‍රදේශ.
VI සයිබීරියන් වර්ගයේ වනාන්තර ප්‍රදේශ.
VII ටන්ඩ්‍රා ප්‍රදේශ. යනුයි.

අනුක්‍රමයෙන් මේ එකී එකී ප්‍රදේශය පිළිබඳ සංක්ෂෙපයෙන් විස්තර දැක්වීම මේ ලිපියෙන් අදහස් කරනු ලැබේ.

## I. නිරක්ෂ රේඛාව සම්බන්ධ ඝන වනාන්තර ප්‍රදේශ.

---

**පිහිටීම හා තත්ත්වය:-**

මෙම ප්‍රදේශ සමකයේ සිට උතුරට හා දකුණට අංශක 10 බැගින් විශාලව පවතිත්. ආසියාව, අප්‍රිකාව හා දකුණු අමෙරිකාව යන මහා මීපයන් තුළ පැතිර පවත්නා මේ ස්වාභාවික ප්‍රදේශ ඝන වනාන්තරයෙන් හා ඇතැම් විට සරුලෙස වැඩුණ තෘණ පවුලේ වෘක්ෂයන්ගෙන්ද යුක්ත වෙත්.

**වායු ගුණය:-**

මෙහි අවුරුද්ද මුලුල්ලේ පවත්නා අධික උෂ්ණය නිසා නොකඩව පවතින අහස් වර්ෂාව හැර වෙනත් කිය යුතු වායු

ගුණයක් නොමැති වේ. අප්‍රියෙල්, මැයි, ඔක්තෝබර්, නොවැම්බර් යන මාසවලදී සමකය ආසන්න ප්‍රදේශවලට අධිකව වර්ෂාව ලැබෙන හෙයින් මෙම ස්වාභාවික ප්‍රදේශ වලටද තද වර්ෂාව ලැබේ. මේ ප්‍රදේශයන්හි පවත්නා තද උෂ්ණ ගතිය යුරෝපීයයන්ගේ සනීපයට හේතු නොවේ.

**වෘක්ෂ ලතාදිය හා සත්වයා:-**

මෙම ප්‍රදේශයෙහි කළුවර, මැහෝගනී ආදී අරටු සහිත වෘක්ෂ වර්ගද තාලවර්ගයේ ගස්ද තෙල් ලබා ගන්නා ගස් වර්ගද උණ ආදී තෘණ පවුලට අයත් ගස්ද, නුග ආදී විශාල ගස්ද මඤ්ඤොක්කා, කෙසෙල්, උක් යනාදී වෙනත් ප්‍රයෝජනවත් වැවිලි සහ විශාල ලතා වර්ගද සැපසේ වැඩෙත්. මෙකී ප්‍රදේශවල කොළ හා එල බුදිමින් ජීවත් වන්නාවූ කෘමීහුද, එම කෘමීන් ආහාරය කොට ගෙන ජීවත්වන්නාවූ පක්ෂීන් හා වවුලෝද, ගස් හා ගස්බෙන් වාසභූමිකොට සිටින්නාවූ සූතන්, සර්පයන් හා ඉත්තෑවෝද අධික ලෙස වාසය කරති. වානරයන්ගේ ඔබමොබ සඤ්චාරය කිරීම මෙහි පවත්නා විශෙෂ ලක්ෂණයකි. තවද මෙහි වාසය කරන මැසිවර්ගයේ සත්තු මනුෂ්‍යයාගේ ජීවිතය පවා නැතිකරමින් .මෙම වනාන්තර ප්‍රදේශ දියුණු නොකිරීමට ප්‍රයත්න දරන්නන්මෙන් ක්‍රියා කරති.

**මනුෂ්‍යයෝ:-**

මේ ප්‍රදේශවල වාසයකරන මනුෂ්‍යයෝ ස්වභාවයෙන්ම අශිලාචාර දිළිඳු අහිංසක තත්වයේ අයවෙති. ඔවුන්ගේ තත්වය එසේ වීමට හේතු වූයේ පහත සඳහන් කරුණු වෙති.

එනම්:- 1 උපතතතීයෙන්ම සනීප අය නොවීම.
2 බර ඇදීමට සොදන සතුන් නැතිවීම
3 ගමනා ගමනය අපහසුවීම.
4 ගොවිතැන් කළ නොහැකිවීම.
5 ආහාර ලැබීමේ දුෂ්කර තාවය. යනු වෙත්.

1. උපතතියෙන්ම සනීප අය නොවීමට ඇති හේතුනම්:- තද උෂ්ණත්වයක් ඇතිවීම, මැලේරියා රෝගය ඇති කරන සතුන් ගෙන් ගහන ප්‍රදේශවූයෙන් එම රෝගය වැළදීම, ආලොකය නොලැබීම, සිත්සතුටු කරන දර්ශණයන්ගෙන් තොරවීම, ඇඳුම් සහ වෙනත් උපකරණ සාදා ගැනීමට නොහැකිවීම හා අමාරු

වෙන් සාදාගත් සුළු ඇඳුම් හා උපකරණ පවා විනාශකරන සතුන් ගහණවීමද වෙත්.

2. බර ඇදීමට යොදන සතුන් නැතිවීමට ඇති හේතුනම්:- සතුන් ඇත්කර ගැනීමට උවමනා කරන තෘණභූමි නැතිවීම, සත්ත්වයන්ට ජීවත්වීමට නොහැකිවීම හා සත්ත්වයන්ට හිංසා පමුණු වන මැසිවගී ඇතිවීම්ද වෙත්.

3. ගමනාගමනය අපහසුවීමට ඇති හේතුනම්:- දිනපතා නොකඩව වැඩෙන ඝනකැලෑව නිසා මාර්ග සම්පාදනය කරගැනීමට ඇති දුෂ්කරතාවයද, වනචාරී සත්ත්වයන්ගෙන් වටවසිටීම නිසා ගමනාගමනය පිණිස යොදන සතුන් ඇති කිරීමට නොහැකිවීමද වෙති.

4. ගොවිතැන් නොකළහැකිවීම:- මෙහි වාසයකරන මනුෂ්‍යයෝ කැලෑ එළිකොට ගොවිතැන් කිරීම නොදනිත්. එසේම ගොවිතැනට අදාල සත්ත්වයන් ඇතිකිරීමද කළනොහැකි බැවින් ගොවිතැන් නොකරති.

5. ආහාර ලැබීමේ දුෂ්කරතාවය:- මෙම ප්‍රදෙශවල වාසය කරන මිනිස්සු තමන්ගේ ජීවිකාව සඳහා දඩයම් කිරීම, මසුන් මැරීම, එකතුකිරීම, (වනයේ මුල්, අල, කොළ, එල රැස්කිරීම) යන රක්ෂාවල යෙදී සිටිති. මෙම රක්ෂාවල යෙදී සිටින අයට ආහාර ලැබීම අස්ථිරය. එහෙයින් මෙම මනුෂ්‍යයෝ නිරාහාරයෙන් හිඳීමට සම්භව වෙත්.

**මනුෂ්‍යයා සම්බන්ධ විශෙෂ කාරණා:-** මෙහි වාසය කරන මනුෂ්‍යයෝ ස්වභාවයෙන් සම්පාදනය වන දෙය පමණක් රැස් කිරීමෙන් ජීවිකාවෘත්තිය කරගැනීමට කල්පනා කරන්නන් බැවින් ස්ථිරවාසස්ථාන නැතිව තැනින් තැන යමින් කාලය ගතකරන මනුෂ්‍ය කොටසක්වූවා පමණක් නොව දෙහ ශක්තියෙන් හා ක්‍රියාශූරත්වයෙන්ද, වාගචාතුර්යයෙන්ද අන්‍ය මනුෂ්‍යයන්ට සමාන නොවෙත්. තවද මොවුන්තුළ ප්‍රීතිවීම්, ආභරණ පැළඳීම්, පවුලේ අය කෙරෙහි ඇල්ම ඇති කිරීම්, පසුගිය කාලය හා මතුකාලය ගැන බලාපොරොත්තුවීම් ආදී ශිෂ්ටගතිගුණ කිසිත් නොමැත්තාහ. මේ සියල්ලටම හේතුවූයේ ඔවුන්ගේ ජීවනොපාය සම්බන්ධ ක්‍රියාකාරිත්වයයි.

## II නිරක්ෂ රේඛාව සම්බන්ධ උපවනාන්තර ප්‍රදෙශ.

**පිහිටීම හා තත්වය:-**

උතුරු අංශක 10° සිට 20° දක්වා හා දකුණු අංශක 10° සිට 20° දක්වාද විශාලව පවතින මේ ප්‍රදෙශ ආසියාව, අප්‍රිකාව, අමෙරිකාව හා ඕසෙට්‍රලියාව යන මහද්වීපයන් තුළ පැතිර පවතිත්. එක් ඍතුවක් තුළ වැඩෙන වෘක්ෂ ලතාදියෙන් ගහනවූ මෙම ප්‍රදෙශ ග්‍රීෂ්මමණ්ඩලයට අයත් ඵලවර්ගී හා ධාන්‍යවර්ගීද සරුලෙස වැඩෙන ප්‍රදෙශ වෙත්.

**වායුගුණය:-**

සූර්යයා මුදුන්වන කාලයට පමණක් තද වර්ෂාව ලැබීමද, අනික් කාලයට වියලි වායුගුණයක් ඇතිවීමද මෙහි පවත්නා ස්වභාවයයි. මේ ප්‍රදෙශ කෙරෙහි මෝසම් සුලඟ බලපවත්වයි. එහෙයින් ග්‍රීෂ්ම ඍතුවේදී අධික වර්ෂාව හා ශිශිර ඍතුවේදී වියලි ස්වභාවයද ඇතිවෙත්. මෙම ඍතුභෙදය පැහැදිලිව පෙනීම මෙහි පවත්නා විශෙෂ ලක්ෂණයකි. මෙහි උස්බිම් පෙදෙස්වල පවත්නා දෙශගුණය යුරෝපීය යන්ට යොග්‍ය වේ.

**වෘක්ෂලතාදිය හා සත්වයා:-**

ඉරිඟු, මිලට්, වී ආදී ධාන්‍යවර්ගීද, කෝපි, උක්, කපු, තේ, අවරියා, අන්නාසි ආදී ප්‍රයෝජනවත් වැවිලිද, කළුවර, බුරුත, මැහෝගනී, තේක්ක, පලු ආදී අරටු සහිත වෘක්ෂද, පොල්, තල්, ඉඳි ආදී තාලවර්ගීයේ වෘක්ෂද මෙහි මනාසේ වැඩෙත්. මෙම ප්‍රදෙශවල සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස් යන චණ්ඩ මෘගයෝද, ගෝන මුව උෟරු ආදී සත්තුද, මහත් ශරීරයෙන් යුත් ඇත්තුද, නොයෙක් වර්ගීවල පක්ෂීහුද, මැසිවර්ගීයේ සත්තුද බහුල වශයෙන් දක්නා ලැබෙත්.

**මනුෂ්‍යයෝ:-**

මේ ප්‍රදෙශයෙහි වාසයකරන මනුෂ්‍යයෝ දුෂ්කරතා රාශියකට මුහුණපාමින් ගොවිකර්මාන්තයම ස්වකීය ජීවනොපාය කරගෙන කටයුතු කරති ගොවිතැන් කිරීම සම්බන්ධව මෙහි මනුෂ්‍යයන්ට තිබෙන ස්වභාවික අපහසුකම්වලින් ප්‍රධාන ඒවා පමණක් මෙහි සඳහන් කරනු ලැබේ. එනම්:- i පසෙහි පෝර ඉක්මණට විනාශ

**වීම,** ii. සතුන් ඇතිකර ගැනීමේ අපහසුකම සහ, iii. කුඩා සතුන්ගෙන් ඇතිවන උපද්‍රව යනු වෙත්.

මේ එකිනෙක කාරණයක්ම ගොවියාට විපත්ති දැයකබැව් කියයුතු නොවේ. එහෙන් උතුරු ඕසෙත්‍රලියාවේ හා ක්වීන්ස් ලන්තයේ වාසයකරන සවදෙශීහු පමණක් ගොවිතැන් කිරීම් ආදී ව්‍යාපාරයක නොයෙදී ස්වභාව ධර්මයට යටත්ව වාසය කිරීම නිසා පහත් තත්වයක සිටිති. ආසියාව, අප්‍රිකාව සහ අමෙරිකාව යන මහාවීපවල පිහිටි මෙම ස්වාභාවික කොටසෙහි වාසය කරන මනුෂ්‍යයෝ උත්සාහයෙන් කටයුතු කරමින් ශිෂ්ට ජීවිතයක් ගත කරති.

## III නිවර්තන රෙඛා සමබන්ධ කාන්තාර ප්‍රදෙශ.

---

### පිහිටීම හා තත්වය:-

උතුරු අංශක 20° සිට 30° දක්වා හා දකුණු අංශක 20° සිට 30° දක්වාද විහිද තිබෙන මේ ස්වාභාවික ප්‍රදෙශ ග්‍රීෂ්ම ඍතුවේ වර්ෂාව ලබන ප්‍රදෙශයන්ට පිටිපසින් ධ්‍රැවදෙසට හුරුව පිහිටා තිබෙත්. වලාකුල්වලින් නිරාවරණවූ අහසින් යුක්තවූද වියලිවායුව ආශ්‍රිත වූද මේ ප්‍රදෙශ ඉතා වියලි ශුෂ්ක භූමිප්‍රදෙශයෝ වූහ. මේ ප්‍රදෙශ කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය ආශ්‍රය කරමින් යුරෝපය හැර අන්‍ය මහාවිප හරහා පැතිරී තිබෙත්.

### වායුගුණය:-

මෙහි පවත්නා වායුගුණය අධිකතර උෂ්ණයෙන් හා වියලි භාවයෙන්ද යුක්තවේ අහස වලාකුල්වලින් තොරව පවතින බැවින් දවල් කාලයේ අධිකතර උෂ්ණ ස්වභාවයක් හා රාත්‍රිකාලයේ අධිකතර ශීතල ස්වභාවයක්ද ඇතිවේ. හමන සුළඟද ඉතා වියලි ස්වභාවයක් දරයි. අවුරුද්ද තුළ සුළු වර්ෂාවක්ද ලැබේ. ධූලි සහිත මහා කුනාටු ඇතිවීම මේ ප්‍රදෙශවල පවත්නා විශෙෂ ලක්ෂණයකි.

### වෘක්ෂලතාදිය හා සත්වයා:-

තියග ඉසිලිය හැකිවූ ඉඳිගසවැනි තාලවර්ගයේ ගස්ද, මැලියම් උපදවන ගස්වර්ගද, නොයෙක් ආකාර තෘණවර්ගද මෙහි වැඩෙන ස්වාභාවික වැවිලි වෙති. මේ ප්‍රදෙශයෙහි වැඩෙන පැලෑටි ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් ක්ෂෙමභූමි සම්බන්ධ පැලෑටි සහ කාන්තාරවල වැවෙන පැලෑටි යනුවෙති. සහරා

කාන්තාරය හා අරාබිකාන්තාරය යන දෙක ඉදිගසේ ජනමභූමි වෙති. සහරාකාන්තාරයෙහි තිබෙන ක්ෂෙම භූමිවලින් ඉතා වැදගත් එකවූ ඊජිප්තුව (මිසර දෙශය) ලොකයේ තිබෙන ප්‍රධාන ක්ෂෙම භූමිය වේ. මෙහි කපු සහ ඉඳිගු බහුල වශයෙන් වවනු ලැබෙත්. අරාබියේ හා උතුරු අප්‍රිකාවේද මිටි පඳුරුවලින් යුත් ලැහැබ් බිම් පිහිටා තිබෙත් මෙම ප්‍රදෙශවල වාසයකරන සත්ත්වයෝ ස්වල්ප වෙති. ඔටුවු, බූරු, එළු, බැටළු යන සිව්පාවුන් හා පැස්බරා නමැති පක්ෂියාද මෙහි වාසය කරන සැලකියයුතු සත්ත්වයෝ වෙත්. මෙම සත්ත්වයෝද සියලු කල්හි ක්ෂෙම භූමියක් පාසා සංචාරය කරමින් ජීවිතය ගතකරති.

**මනුෂ්‍යයෝ:–**

මේ ප්‍රදෙශයන්හි වාසය කරන මනුෂ්‍යයෝ එඬේර කම්, දඩයම් කිරීම වෙළඳාම හා සුළු වශයෙන් ගොවිතැන් කිරීමද යන කරුණු මුල්කරගෙන ජීවනොපාය සලසා ගනිති. සරුවූ ක්ෂෙමභූමි ආශ්‍රය කරන මනුෂ්‍යයෝ පමණක් ගොවිතැනෙහි හා වෙළඳාමෙහි යෙදී සිටිති. සෙස්සෝ එඬේර කම හා දඩයම් කිරීම ස්වකීය රක්ෂාව කරගෙන කටයුතු කරන හෙයින් ස්ථිර වාසස්ථාන නොමැතිව පහත් ජීවිතයක් ගතකරති. ඉතා සුළු වර්ෂාවක් ලැබීම, වෘක්ෂලතා වන්ගේ හීනකම, ගොවිතැන් නො කළ හැකි බව, මනුෂ්‍යයන් සතුන් නිසා ජීවත්වීම, තැනින් තැනයාම, පහත් ශිෂ්ටාචාරය යන කරුණු හය උෂ්ණකාන්තාර ප්‍රදෙශ කෙරෙහි විශෙෂයෙන් බලපවත්වනු ලැබෙත්. මෙහි මනුෂ්‍යයාගේ ප්‍රධාන වස්තුව හැටියට සැලකිය යුත්තේ ඔවුන්ට අයත් සත්ත්ව සමූහයායි. "කාන්තාර නෞකාවය"යි නම් කරනු ලබන ඔටුවා මෙහි වැස්සන්ට විශාල මෙහෙයක් ඉටුකරදෙයි. එසේම ඉතා සුළු දළ ආහාරයකින් දිවිපෙවෙත රැකගැනීමෙහි සමත් බූරුවාද කාන්තාර වැසියාගේ හිතවතෙකි. මිසරදෙශය, මිසපොතාමි තැනිතලාව වැනි ක්ෂෙමභූමිවල වාසය කරන මනුෂ්‍යයෝ ගොවිකර්මාන්තයෙහි හා වෙළඳාමෙහි යෙදී ශිෂ්ට ජීවිතයක් ගත කරති. ඕස්ට්‍රේලියාවේ කාන්තාර වාසීහු ඉතා දුක් සහිත ජීවිතයක් ගත කරති. මේ මනුෂ්‍යයන්ට අනික් රටවල වාසය කරන කාන්තාර වැසියාට මෙන් පහසුවෙන් හීලෑ කළ හැකි එළු, බැටළු, ඔටුවු ආදී සතුන් හා ප්‍රණීත ආහාරයක් සපයා දෙන ඉඳිගසද, නොමැති හෙයින් ස්ථිර වාසස්ථාන නොමැතිව අලවගී රැස් කිරීමෙන්ද, ලැහැබ් බිම්හි වසන කැන්ගරු නම් සත්ත්වයා දඩයම් කිරීමෙන්ද දිවිපෙවෙත රැකගැනීමට සිදුවී තිබේ.

පිග්මි මනුෂ්‍ය වර්ගයට අයිති ඕස්ට්‍රේලියාවේ ස්වදේශික කාන්තාර වාසීනු තමන්ගේ දිවිපෙවෙත රැකගැනීමට ඔබමොබ සංචාරය කිරීමේදී “ඩිංගෝ” යන නමින් හඳුන්වන බල්ලා සහ “බූමරැන්” යන නමින් හඳුන්වන පාරුවලල්ල වැනි ආයුධයද පාවිච්චි කරති.

## IV මධ්‍යධරණී වර්ගයේ ප්‍රදේශ.

---

### පිහිටීම හා තත්වය:-

උතුරු අංශක 30° සිට 40° දක්වා හා දකුණු අංශක 30° සිට 40° දක්වාද විහිද තිබෙන මේ ප්‍රදේශ මහාවීප පහම ආශ්‍රය කරගෙන පවතිත්. මධ්‍යධරණී මුහුද අවට විශාල ප්‍රදේශයක මෙම වායු ගුණය දක්නා ලැබෙන හෙයින් එකී වායු ගුණය පවත්නා අවශෙෂ ප්‍රදේශද මෙම නාමයෙන්ම හඳුන්වනු ලැබෙත්. සිත්පිනවන පුෂ්පාරාමයන්ගෙන් හා ඵලාරාමයන්ගෙන් ගැවසී ගත් මේ ප්‍රදේශ විශෙෂයෙන්ම යුරෝපීයයන්ට හෝ ඔවුන් ගෙන් පැවතෙන්නන්ට වාසස්ථාන කරගැනීමට ස්වභාවයෙන් සජ්ජවී තිබෙන උද්‍යානයක සිරිය උසුලති.

### වායු ගුණය:-

කුනාට්ටු සහිතව හමන බටහිර සුළං (විරුඬ වෙළඳ සුළං) වලින් ලැබෙන වර්ෂාවෙන් යුත් ශිශිර ඍතුද නියංසමයෙන් යුත් ග්‍රීෂ්ම ඍතුද මෙහි ඇත්තාහ මේ ප්‍රදේශයෙහි ග්‍රීෂ්ම ඍතුව උෂ්ණවත්වීම හා ශිශිර ඍතුව සෞම්‍යවීම අවුරුද්ද මුලුල්ලේම පලාවර්ණයෙන් යුත් වෘක්ෂලතා නිෂ්පාදනයට හේතු වෙති.

### වෘක්ෂලතාදිය සහ සත්වයා:-

ගිම්හාන ඍතුවේ පවත්නා උණුසුම් ගතිය හා ශිශිර ඍතුවේ පවත්නා වර්ෂාවත් හේතුකොට ගෙන මේ ප්‍රදේශයෙහි වෘක්ෂ ලතාදිය අවුරුද්ද මුලුල්ලේම සැපසේ වැඩෙති. සියලු කල්හි පලාවර්ණය පවත්නා වෘක්ෂ, පඳුරු හා වනස්ස වර්ග සුලබ වෙති. මෙහි වෘක්ෂලතාදිය කිසිකලක වඩා උසට නොවැඩෙත්. ඝනවූ හමකින් යුත් කුඩා පත්‍රයන්ගෙන් යුක්තවූ වෘක්ෂයන්ගෙන් මේ ප්‍රදේශ වැසී තිබෙත්. ලූනුඅල වැනි අලවර්ගද, පටුවූ පත්‍රයෙන් යුත් පඳුරු වර්ගද, සුවඳ හමන කොළ වර්ගද මේ ප්‍රදේශවල

සෑම තැනම දක්නා ලැබෙත්. කඳු ආශ්‍රිත ප්‍රදෙශවල ඕක්. හොලි, ඔලීව, රටමාරා, ලෝරල් යන වෘක්ෂ වර්ග දක්නා ලැබෙත්. තිරිඟු ඔලීව, මුද්‍රික, දෙසි, දෛඩම් යනාදිය මෙහි ඇති ප්‍රධාන වැවිලි වෙති. ගව, එළු, බැටළු ආදී සිව්පාවුන් හා කුකුළු, පාත්ත, කළුකුන් ආදී සත්තුද මෙහි ඇති කරණු ලැබෙත්. දකුණු අප්‍රිකාවෙ ප්‍රදෙශවල පමණක් පැස්බරු ඇතිකරනු ලැබේ.

**මනුෂ්‍යයෝ:-**

මේ ප්‍රදෙශයෙහි වාසය කරන මනුෂ්‍යයෝ ගොවිකර්මාන්තය හා වෙළඳාම ස්වකීය ජීවනොපාය කරගෙන වාසය කරති. ස්වභාවයෙන්ම ගොවිකම කෙරෙහි විශෙෂ ලැදිකමක් හා පුහුණුවක් ඇතිකරගෙන වාසය කරන මෙහි වැස්සෝ සිත කය දෙක නිතර පිනවමින් ජීවත් වෙති. මෙහි වැස්සන් විසින් කරනු ලබන තිරිඟු ගොවිතැන හා පලතුරු වැවීම බෙහෙවින් එලදායක වෙත්. තමන්ට උවමනා පමණ පලතුරු ආදිය ප්‍රයෝජනයට තබාගෙන අවශෙෂ පලතුරු වර්ග දෙශ දෙශාන්තරයන්හි විකිණීම සඳහා යවනු ලැබෙත්. අමු ද්‍රව්‍ය දීර්ඝ කාල යක් තබා ගැනීමේ ක්‍රම සම්බන්ධවද තෘණාදී විද්‍යාව සම්බන්ධවද ශාස්ත්‍රීය පරීක්ෂණ පවත්වා එයින් ලත් විපුල අත්දැකීම්වලින් ප්‍රීතිමත්ව ධනසඤ්චය කිරීමෙහි යෙදී සිටින විශෙෂඥයන්ගේ සංඛ්‍යාව අල්ප නොවේ. මේ ප්‍රදෙශවාසී සියලු මනුෂ්‍යයාටම සිත් පිනවන උද්‍යානයක් තිබේ. එම උද්‍යානයෙහි නා නා වර්ග වල පුෂ්ප වෘක්ෂ හා ඵල වෘක්ෂ ශාස්ත්‍රානුකූල ලෙස රෝපණය කරවා ඉන් ප්‍රයෝජන ගනු ලැබෙත්. මධ්‍යධරණී සමුද්‍රය හාත් පස ප්‍රදෙශයෙහි වාසයකරන ග්‍රීක්වරු හා රෝමන්වරු ස්වභාව ධර්මය ජයගන්නා සුළු ශාස්ත්‍රීය පරීක්ෂණ පවත්වා ඉන් ලත් ප්‍රතිඵල අනුව ලෝකේ සියලු තන්හිම වාගේ විද්‍යානුකූල ගොවි කර්මාන්ත විධි අනුව වැවිලි කිරීමට පුරුදුකොට ලෝ වැස්සන්ගේ ගෞරවයට භාජනව සිටිති. එබැවින් මෙම මධ්‍ය ධරණීය ප්‍රදෙශ ලෝකයේ ස්වාභාවික ප්‍රදෙශ අතුරෙන් ඉතා වාසනාවන්ත ප්‍රදෙශ බැව් නිර්භයව කිවහැක.

## V ස්ටැප්ස් ප්‍රදෙශ.

**පිහිටීම හා තත්ත්වය:-**

උතුරු හා දකුණු අංශක 40° සිට 60° දක්වා විහිද තිබෙන මේ ප්‍රදෙශ යුරේශියාව, අමෙරිකාව හා අප්‍රිකාව යන මහා ද්වීපයන්ගේ මධ්‍ය භාගය ආශ්‍රය කරගෙන පිහිටා තිබෙත්. මේ

ප්‍රදෙශයෝ ආසියාවේදී හා යුරෝපයේදී "ස්ටැප්ස්" යන නාම යෙන්ද උතුරු අමෙරිකාවේදී "ප්‍රේරි" යන නමින් හා දකුණු අමෙරිකාවේදී "පැම්පාස්" යන නාමයෙන්ද හඳුන්වනු ලැබෙත්. මෙහි සමහර කොටස් සරුවූ තෘණයන්ගෙන්ද ඇතැම් කොටසාස දුර්වලව වැඩුන තෘණයෙන් හා කුඩා ලඳු කැලෑවලින්ද ගැවසී තිබෙත්. සවභාවයෙන්ම මෙම ප්‍රදෙශ එඬේරකමට යොගා වෙත්.

**වායුගුණය:–**

මේ ප්‍රදෙශවල මහාවීපික වායු ගුණය පවතී. මෙහි ශිශිර සෘතුව සාකීශය. ග්‍රීෂම සෘතුව උෂණවත්ය. මේවා සමුද්‍රයෙන් ඈත්ව පිහිටා තිබෙන බැවින් වර්‍ෂාව ලබන්නේ සවල්ප වශයෙනි. ග්‍රීෂම සෘතුවේදී පමණක් වර්‍ෂාව සවල්ප වශයෙන් ලැබේ. ශීත සෘතුවේදී මේ ප්‍රදෙශ අධික ශීතලවූද, වර්‍ෂාවෙන් තොරවූද, සාකීශ දෙශ ගුණයෙන් යුක්තවූද ඒවා වෙති.

**වෘක්‍ෂලතාදිය හා සත්වයා:–**

මේ ප්‍රදෙශ සවභාවයෙන්ම තෘණ වර්ගයන්ගේ උත්පත්තියට යොගාව සෑදී තිබෙත්. මෙහි පවත්නා දිග වියලි සෘතුවත් කෙටි වර්‍ෂා සෘතුවත් යන දෙක තණ පිට්ටනි සෑදීමේ මූලික හේතුවෙති. මනාසේ ජලාශ්‍රිතවූ සථානවල වනගතව වැඩෙන තෘණයන් වෙනුවට තෘණ පවුලට අයත් තිරිඟු, බාර්ලි, ඕට්ස්, ආදී ප්‍රයෝජනවත් තෘණයෝ වවාගත හැකිවෙත්. උතුරු අමෙරිකාවේ 'ප්‍රේරි" යන නමින් හඳුන්වන මෙම ප්‍රදෙශ තිරිඟු ආදී තෘණ පවුලට අයත් පැලෑටි වැවීම ගැන විශෙෂයෙන් ප්‍රසිද්ධියක් උසුලති. රුසියාවේ ස්ටැප්ස් තැනිතලාවන්හි ප්‍රධාන වශයෙන් තිරිඟුද සුළුවශයෙන් බාර්ලි, ඉරිඟු හා ඕට්ස්ද වවනු ලැබෙත්. සයිබීරියාවේ පිහිටි ස්ටැප්ස් තැනිතලාවේ ඉතා උෂණවත් අග්නිදිග සීමාවේ පිහිටි නිම්න භූමිවල කපු, වී, හා එල වර්ගද වවනු ලැබෙත්. සාමාන්‍යයෙන් සලකා බලන කල මුළු ස්ටැප්ස් ප්‍රදෙශ තණ පිට්ටනිවලින් වැසී තිබෙන බැව් පෙනේ. මේ ප්‍රදෙශ වාසීහු සවභාවයෙන්ම එඬේරකම සවකීය ජීවනොපාය කරගෙන වාසය කරන්නන් බැවින් එළු, බැටළු, ගව. අශ්ව, ඔටු, යන සතුන් ඇති කරති.

**මනුෂ්‍යයෝ:-**

මෙම ප්‍රදේශ‌ෙල වාසය කරන මනුෂ්‍යයෝ එඬේර සමින් ජීවත් වෙති. මේ මනුෂ්‍යයෝ ප්‍රීතිමත් ජීවිතයක් ගත කරති. ස්වකීය ජීවනෝපායට උවමනා සියලු දේම එළු, බැටළු, ගවා ආදී සතුන්ගෙන් ලබාගෙන ස්ථිර වාසස්ථානයක් නැතිව කාල යෙන් කාලයට ඔබමොබ සංචාරය කරමින් ජීවත්වීම මොවුන් ගේ ස්වාභාවික සිරිතකි. යුරෝපයේ ස්ටැප්ස් ප්‍රදේශවල වාසය කරන මනුෂ්‍යයාට "කොසැක්ස්" යන නාමය භාවිත කරනු ලැබේ. ඔවුන් ඉතා දක්‍ෂ අශ්වාරෝහකයන් වූයෙන් මේ නම භාවිතා කරනු ලැබේ. මෙම "කොසැක්ස්" වරු පූර්ව කාලයේ ස්වකීය කූඩාරම පවා සත්ව සමින් සඳගත්තෝය. මොව්හු සම් සහ ලොම් වලින් සෑදල හා ඇතිරිලි ආදිය සාදති. ආසියාවේ වාසය කරන ස්ටැප්ස් වැසියා මොන්ගෝලියන්වරු සහ කිර් ගීස්වරු කියා කොටස් දෙකකට බෙදනු ලැබේ. මෙයින් මොන් ගෝලි මනුෂ්‍යයෝ තියන්ෂන් කඳුවලින් නැගෙනහිර දිගද කිර්ගීස් නම් මනුෂ්‍යයෝ ස්ටැප්ස් ප්‍රදේශයන්හි බටහිර දිගද වසත්. මේ මනුෂ්‍යයෝ සමුද්‍රයෙන් ඈත්වීමෙන්ද, කාන්තාර කඳුවැටි ආදියෙන් ආවරණයවූ හෙයින් ශිෂ්ට ජන සමාජයෙන් තොරව විසීමෙන්ද තෘණ හැර අන්‍ය වෘක්‍ෂලතාදිය වවාගැනී මට නොහැකි වීමෙන්ද යන කරුණු හේතුකොටගෙන දියුණු වෙන් හීනවූවෝ වෙති. මේ මනුෂ්‍යයන්ගේ ජීවත්වීමට වුව මනා මස්, කිරි, ඇඳුම්, පලස්, කූඩාරම් ආදී සියලුම උප භෝග පරිභෝග වස්තු එළු, බැටළු, ගව යන සතුන් විසින් සම්පා දනය කරනු ලැබෙත්. මෙමස්වාභාවික ප්‍රදේශවල වාසය කරන මනුෂ්‍යයාගේ ප්‍රධාන වස්තුව නම් තමන්ට අයත් සත්ව සමූහයා වේ. ඔවුන්ගේ ධනවත් භාවය නිශ්චය කිරීම ඔවුන්ට අයත් සතුන් අනුව කරනු ලැබේ.

## VI සයිබීරියන් වශීයේ වනාන්තර ප්‍රදේශ.

---

**පිහිටීම හා තත්ත්වය:-**

මෙම ප්‍රදේශ උතුරු අංශක 60° සිට 70° දක්වා විහිද තිබෙත්. විශාල කොටස සයිබීරියාව මැදින් විහිද තිබෙන බැවින් මීට සයිබීරියන් වශීයේ වනාන්තර ප්‍රදේශයයි නම් කරන ලදී. යුරේසියාව හා උත්තර අමෙරිකාව යන මහාද්වීප හරහා මේ ප්‍රදේශ විහිද පවතී. කේතුරූපාකාර වෘක්‍ෂයන්ගෙන් ගැවසීගත් මේ ප්‍රදේශ දැව සැපයීමට අතිශයෝපකාරී වෙත්. ශිශිර ඍතුව

බලවත්වීමද, කෙටි ග්‍රීෂ්ම සෘතුවක් ඇතිවීම හා අල්පවූ වැසිඑල ලැබීමද නිසා මේ ප්‍රදේශ හර රහිත ඉදිකටු වැනි පත්‍රවලින් යුත් කේතු ආකාර වෘක්ෂයන්ගේ උත්පත්තියට හේතුවූහ.

**වායු ගුණය:-**

මෙහි පවත්නා වායු ගුණය මහද්වීප සම්බන්ධ වායු ගුණය වේ. ශිශිර සෘතුව ඉතා සාහසිකවීම හා ග්‍රීෂ්ම සෘතුව උෂ්ණවත් වීමද, මෙහි පවත්නා වායුගුණයේ තත්වය වේ. මෙහි ග්‍රීෂ්ම සෘතුවේ දවස් දිඝී වෙති එසේම තද උෂ්ණ ගුණයෙන්ද යුක්ත වෙත්. ග්‍රීෂ්ම සෘතුවේ පමණක් වර්ෂාව ලැබේ. ග්‍රීෂ්ම සෘතුවේ ලැබෙණ උෂ්ණය හා වර්ෂාව නිසා මේ ප්‍රදේශ වනාන්තරවී තිබෙත්. තවද මෙහි පවත්නා සෘතුභෙදය වෙනසක් නැතිව නියම කාලයට ඇති වේ. මේ ප්‍රදේශ සමශීතෝෂ්ණ කලාපයේ උෂ්ණ කොටසේ හා සමශීතොෂ්ණ කලාපයෙ ශීත කොටසේද පිහිටා තිබෙති. අවුරුද්දේ එක් කාලයකදී මෙහි ජලය මිදී පවතී. ඒ කාලයේදී මෙහි පවත්නා උෂ්ණත්වය දිය මිදෙන තුඩින් 20° දක්වාත් පහළ බසී, ග්‍රීෂ්මසෘතුව පවතින කාලයට මේ ප්‍රදේශවල උෂ්ණත්වය අංශක 60° ක් පමණ වේ.

**වෘක්ෂලතාදිය හා සත්වයා:-**

මෙම ප්‍රදේශවල කේතුරූපාකාරයෙන් යුත් වෘක්ෂ වැඩෙත්. කවාකාර පත්ලකින් යුක්තව ක්‍රමයෙන් සිහින් වෙමින් උල්වූ මුදුනක් ඇතිවන සේ ඉහළට වැඩෙන්නාවූ සෘජු කඳන් වලින් යුක්තවූද, ඉදිකටු වැනි තුඩු ඇති සිහින් පත්‍ර ඇත්තාවූද පයින්. බර්ච්, පර්, ලනාදී වෘක්ෂවර්ගී මෙහි වැඩෙත්. මේ ස්වාභාවික වෘක්ෂ හැර මෙහි වනය හෙළිකර රයි, ඕට්ස්, බීට් ආදී ප්‍රයෝජනවත් වැවිලි වවනු ලැබෙත්, මෙකී වැවිලි වගී යුරෝපය අමෙරිකාව යන මහද්වීප දෙකේ පිහිටි මෙම ප්‍රදේශවල උෂ්ණ කොටසේ බහුලව ඇත්තාහ. අවශෙෂ කොටස් දැව පිණිස භාවිතා කරන වෘක්ෂයන්ගෙන් ගහනවෙත්. බලවත් ශිශිර සෘතු පවත්නා මෙම වනාන්තර ප්‍රදේශයෙහි ස්වභාවයෙන් ඇතිවී තිබෙන සත්වයන් හැර මනුෂ්‍යයන් විසින් ඇතිකරනු ලබන සත්වයෝ නොමැත්තාහ. මෘදු ලෝමයෙන් ගැවසී ගත් සමක් ඇති සේබල්, මින්ක්බිවර්, එර්මයින් ආදී සත්තු මෙහි වාසය කරති. මේ සතුන්ගෙන් ලැබෙන ලෝම අගනා වෙළඳ ද්‍රව්‍යයකි.

**මනුෂ්‍යයෝ:-**

ආසියාවේ මෙම වනාන්තර ප්‍රදේශවල වාසයකරන මනුෂ්‍යයෝ අනික් මහාවීපවල මේ ප්‍රදේශවල වාසයකරන මනුෂ්‍යයන්ට වඩා දියුණුවෙන් හීනවූ අය වෙති. ඔවුහු දඩයම් කිරීම හා මසුන් මැරීම සවකීය ජීවනෝපාය කරගෙන දුකසේ කල්යවති. ලී කර්මාන්තය කිරීමට ඔවුන්ට අවහිරකම් තුනක් බලපවත්වති. එනම්:- මාර්ග අඩුවීම, දේශගුණයෙන් නිසරු ප්‍රදේශ යාව තිබීම සහ අසල දියුණුනුවූ රටවල් තිබීමත් වෙති.

යුරෝපයේ මෙම වනාන්තර ප්‍රදේශවල වාසයකරණ මනුෂ්‍යයෝ වැඩි වශයෙන් ලී කැපීම හා සවල්ප වශයෙන් ගොවිතැන් කිරීමද කරති. ස්වීඩන් හා පින්ලන්තය යන ප්‍රදේශ දෙක දැව කර්මාන්තයෙන් වඩා දියුණු වූහ. අසල දියුණු රටවල් තිබීම හා ගමන් පහසුව ඔවුන් යථොක්ත දැවකර්මාන්තයෙහි යෙදීමට පොළඹවත් යුරෝපා රුසියාවේ මේ ප්‍රදේශ ආශ්‍රිත වැසියෝ බීට්, අර්තාපල් හා ඕට්ස් ගොවිතැන කිරීමෙන් කාලය ගතකරති.

උත්තර අමෙරිකාවේ කැනඩා රාජ්‍යයේ පිහිටි මෙම වනප්‍රදේශයෙහි වැසියෝ දඩයම් කිරීමෙහිද, සතුන්ට උගුල් ඇටවීමෙහිද, දැවකැපීමෙහිද, ලෝම එකතුකිරීමෙහිද යෙදී සිටිති. මෙම ප්‍රදේශය ශාන්ත ලෝරන්ස් ගංගාවෙන් සීමාවන හෙයින් පහසුවෙන් සපයනු ලබන ආපොබලය හේතුකොට ගෙන ක්‍රියාවේ යොදන දැව ඉරන මෝල් සහ ලීකුඩු පාප්ප සාදන මෝල් කීපයකින් යුක්තවීම නිසා විශාල කර්මාන්ත ප්‍රදේශයක් බවට පැමිණ තිබේ. ගමන් පහසුවද සපයන ද්‍රව්‍ය ඉක්මනින් විකොට ගැනීමට හැකිවීමද නිසා මේ ප්‍රදේශ වැස්සෝ උත්සාහවන්තලෙස කටයුතුවලයෙදී ධන රැස් කරති.

## VII ටන්ඩ්‍රා ප්‍රදේශ.

**පිහිටීම හා ලක්ෂණ:-**

උතුරු අංශක 70° න් ඉහළ සහ දකුණු අංශක 70° න් පහළ පිහිටියාවූ මේ ප්‍රදේශ ආසියාව, යුරෝපය උතුරු අමෙරිකාව යන මහාවීප ආශ්‍රය කරගෙන පිහිටා තිබෙත්. පෘථිවිය අංශක 23½ ක් ඇලව සූර්ය්‍යාවටේ ගමන් කිරීම මේ ප්‍රදේශයන්ගේ නිෂ්පත්තියට හේතුවිය. මේ ප්‍රදේශ ප්‍රධාන කොටස් දෙකකට බෙදෙත්. එනම්:- සදාකාලික හිමෙන් වැසී තිබෙන ප්‍රදේශ හා එක ඍතුවකදී හිම දියවී පෙඳ ආදිය වැවෙන ප්‍රදේශද වෙති. උත්තර සාගරයේ හා දක්ෂිණ සාගරයේ සීමාව වන්නාවූ බිම්පටි වසා විහිදෙන

පාලු ප්‍රදෙශයන්වූ මෙම තැනිතලා දඩයම් කිරීම හෝ පිනිමුවන් රැකබලා ගැනීමද, මස්මැරීමද කරන ස්ථිර පදිංචියක් නැති මනුෂ්‍ය වර්ගයන්ගේ උත්පත්ති භූමිවෙත්.

**වායු ගුණය:-**

මෙම ප්‍රදෙශ ධ්‍රැවකාවවලින් ඈත ශීත ඛණ්ඩයට අයත් ප්‍රදෙශ බැවින් අධික ශීතලෙන් යුක්තවෙති. මෙහි ග්‍රීෂ්ම ඍතුවෙහි පවා උණුසුම නොදැනෙන්නේය. ශීත ඍතුව අධිකතර ශීතලෙන් යුක්තවේ.

**වෘක්ෂ ලතාදිය හා සත්වයා:-**

මේ ප්‍රදෙශවල පෙළවර්ගී පමණක් වැවෙති. ඒ පෙළවර්ගීද ඉතා මිටි ඒවා වෙති. තවද මෙහි මත්ස්‍යයන්ගේ ප්‍රධාන ආහාරයක් වන "ඩයටම්" උඹස්නම් මුහුදු පැලෑටියද බහුලලෙස වැඩේ.

මේ ප්‍රදෙශවල ශුනක වර්ගයේ සතුන් හා පිනිමුවෝද වාසය කරති. මේ සතුන්ගෙන් බල්ලා සහ පිනිමුවා ගෘහවාසි සත්තු වෙති. මිදුනදිය කෙත් ජනමභූමිකොට වාසයකරන සීල්නම් මත්ස්‍යයා දඩයම් කිරීමෙහි නිතර පරීක්ෂාකාරීව සිටින ධ්‍රැව වලසා මේ ප්‍රදෙශවල බහුල වශයෙන් දක්නා ලැබේ. නොයෙක් වර්ගීවල පක්ෂීහුද මසුන් දඩයම් කරමින් මිදුන ජලතලා මතුපිට ජීවත් වෙති පිනිමුවා හැර මෙහි වාසයකරන සියලු ප්‍රාණීහු සත්වද්‍රව්‍ය යන්ම ආහාරකොට ජීවත්වෙති.

**මනුෂ්‍යයෝ:-**

අසාරවූ ශීතාධික ප්‍රදෙශයක්වූ මෙහි වාසයකරන මනුෂ්‍යයෝ ස්ථිර වාසස්ථාන නොමැතිව ඔබමොබ සඤ්චාරය කරමින් කාලය ගතකරති. මේ මනුෂ්‍යයෝ තමන්ගේ ප්‍රධාන ආහාරය මත්ස්‍ය මාංස හා පිනිමුවන්ගේ මස් බැවින් ගොවිකර්මාන්තය සම්බන්ධ සිතිවිලි මාත්‍රයක් පමණවත් නොකරති. ආසියාවේ ටන්ඩ්‍රා ප්‍රදෙශ වල වාසයකරන මනුෂ්‍යයෝ සැමෝයාඩ්ස්, ඔස්ට්යක්, ඉන්දියන් ඇස්කිමෝ යන වර්ගී සතරකට ඇතුළත් වෙති. මේ වර්ගී සතරේම ක්‍රියාකාරිත්වයන් හා ගුණධර්ම එක සමාන වෙති. මේ මනුෂ්‍යයෝ පිනිමුවා ගෘහවාසී සතෙකු මෙන් ඇති කරති මසුන් මැරීම හා දඩයම් කිරීම මොවුන්ගේ ප්‍රධාන රක්ෂාවෙති. යුරෝපයේ ටන්ඩ්‍රා ප්‍රදෙශවල වාසයකරන මනුෂ්‍යයෝ ලැප්වරු සහ පින්වරු යන වර්ගී දෙකට ඇතුළත් වෙති. මේ මනුෂ්‍යයෝද ප්‍රථම සඳහන්කළ අය මෙන්ම සියලු ගති ගුණවලින් සමාන වෙති. ලැප් මනුෂ්‍යයෝ තමන්ගේ පිනිමුව රංචු පෙළ ආදිය තිබෙන ස්ථාන කරා ගෙන

යමින් ඒ සතුන්ගේ මස් හා කිරි ආදියද ආහාර වශයෙන් ගනිත්. මේ මනුෂ්‍යයෝ දඩයම් කිරීම සඳහා තුවක්කුද පාවිච්චි කරති. එම තුවක්කු දකුණු ප්‍රදේශවල වාසයකරන දියුණු මනුෂ්‍යයාගෙන් ලබාගත් ඒවා වෙති.

අමෙරිකාවේ උතුරේ වාසය කරන මනුෂ්‍යයෝ මොන්ගෝලීය වර්ගයට අයිති වෙති මේ මනුෂ්‍යයෝ ගෘහවාසී සත්වයන් මෙන් බල්ලන් ඇති කරති මේ ටන්ඩ්‍රා ප්‍රදේශවාසීහු ඔරු පාරු සෑදී මෙහිද මුහුදු යාත්‍රාවෙහිද අති දක්ෂයෝ වෙති. ඔව්හු කයා (Kayak) නමැති ඔරු වර්ගයක් හා "ස්ලැජස්" නමැති ඔරු වර්ගයක්ද සාදති. මිදුන දිය උඩ ගමන් කිරීම සඳහා සාදනු ලබන අඟල් 18, ක් දික්වූද අඟල් 9 ක් පළල්වූ ද පාවහන් වර්ගය විශ්මය ජනක උපකරණයක් වේ. මේ වහන් යුගලක් ලාගත් මෙහි වැස්සෝ පැයට හැතැප්ම 15 ක් පමණ දුර පහසුවෙන් ගමන් කරති එම ගමන් කිරීමේදී පිය මාරු නොකොට ශීඝ්‍රලෙස ඉදිරියට ලිස්සාගන යති. මේ මනුෂ්‍යයන්ගේ ඇඳුම් පිනිමුව හම්වලින් සාදගනු ලැබෙත්. පදම් නොකළ පිනිමුව හම්වලින් සාදගනු ලබන මෙම ඇඳුම් ශීත ඍතුවේදී ලොම් සහිත පැත්ත ශරීරයට ස්පර්ශ වනසේද, ග්‍රීෂ්ම ඍතුවේදී ලොම් රහිත පැත්ත ශරීරයට ස්පර්ශ වනසේද, අඳිති. ශීත ඍතුවේදී හිමකැට වලින් සාදගත් ගෘහයකද ග්‍රීෂ්ම ඍතුවේදී පිනිමුව හම්වලින් සාදගත් කූඩාරමකද වාසය කරති. මෙහි මනුෂ්‍යයෝ බාල වයසේදීම විවාහ ජීවිතයට ඇතුලත් වෙති. සියලුදෙනාම එක විධියට ජීවත්වීමද, ගමනා ගමනයට ඇති අපහසුකමද, සමූහ වශයෙන් වාසය නොකිරීමද යන කරුණු නිසා මෙහි වැස්සෝ කොල්ලකාරයන් නොවෙති. ඔවුහු අන්ධකාරයෙන් යුත් ශීත ඍතුවේදී ප්‍රයෝජනය ගැනීම සඳහා ග්‍රීෂ්ම ඍතුවේදී මස් වර්ග හා තෙල් වර්ගද, ඇටකටු ආදියද රැසක් සම්පාදනය කොට සුරැකි ලෙස තබති. ශීත ඍතුව පැමිණි කල්හි හිම කැටවලින් සාදගනු ලැබූ ගුහාවක් වැනි ගෘහය තුළට වී සත්ව තෙල් පානය කරමින් ගෙමැද තිබෙන ගිනි උදුන ආසන්නයෙහි පැතිර කාලය ගත කරති.

ලෝකයේ උතුරේ ඉහත සඳහන් ගතිගුණ වලින් යුත් මනුෂ්‍ය වර්ගයක් වාසය කරන නමුත් දක්ෂිණ මහා විපයේ මෙම ස්වභාවික ප්‍රදේශවලට අයත් විශාල කොටසක් තවම සොයාගෙන නොමැති හෙයින් ඒ සම්බන්ධ විස්තර ඉදිරිපත් කළ නොහැකිව තිබෙත්. ස්වාභාවික හෙතුන්ට අනුව එහිද මෙවැනි ප්‍රදේශ ඇත්නම් ඒවාද පූර්වෝක්ත උතුරු ප්‍රදේශ මෙන් සියලු ගුණාඞ්ග වලින් සමන්විත වන්නාහ.

1933. 6. 17. දින.

ගල්වෙහෙර ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය
**ඇන්. පී ද සිල්වා මහතා විසින්**
සම්පාදනය කරණ ලදී.

---

# හකාර විනිශ්චය.

---

හකාරය පිළිබඳ ස්වභාෂීය ව්‍යාකරණ විධිය මඳක් තීක්ෂණ භාවයෙන් යුක්තය. මෙකලැ අපට ඇති පුරාතන එකම සිංහල ව්‍යාකරණයවූ **සිදත් සඟරායෙහි ආ හකාර නිස** හකාරය පිළිබඳ නියම සිද්ධාන්තයෙකි ස්වකීය ආචාර්‍ය සම්ප්‍රදායයකුත් **ඇති** නම් හකාරය පිළිබඳ විවෙචනයක් කරන්නකුට සිද්ධාන්ත **සඞ්ග්‍රහා**ගත හකාර විනිශ්චයම තනාතීණීයෙහිලා අප්‍රාමාණික **නො**වේ. එබැවින් අපි මෙහි අස්මදීයාචාර්‍ය සම්ප්‍රදායයද ගුරු **කො**ටැ සිද්ධාන්ත සංග්‍රහ මතානුසාරීවැම හකාරය පිළිබඳ **සංක්ෂි**ප්ත විවෙචනයක් කරමු.

## ත්‍රිවිධ හකාරය.

**ආදෙශ විධි හකාරය, ආගම විධි හකාරය, ප්‍රකෘති සම්බන්ධ හකාරය** යයි ස්වභාෂාමය වාග්ව්‍යවහාරයෙහි පැනෙණ **හ**කාරය භෙද ත්‍රයකින් යුක්ත වේ.

**1. ආදෙශ විධි හකාරය**:- වචනයක පිහිටි සකාරයට **ආ**දෙශවූ හකාරය ආදෙශ විධි හකාරයයි නිෂ්පන්න, තත්සම, තද්භව යයි ත්‍රිවිධවූ ම බොහෝ වචනයන්හි පිහිටි සකාරයට හකාරය ආදෙශ කොටැ එම වචන ව්‍යවහාර කරනු ලැබෙත්. **උදාහරණ**:- සටහන්=හටහන්, පසන්=පහන්, සිස්නා=හිස්නා, **සිස්**=හිස්, සිතු=හිතු මේ ආදි වචනයන්හි වූ සකාරයට හකාරය **ආ**දෙශ වේ. හකාරය ආදෙශ කොටැ ව්‍යවහාරයෙහි පවත්නා වචනයක් එසේ 'නොකොටැ ප්‍රථමයෙන් සිටි සකාරයෙන් යුක්ත වැම ව්‍යවහාර කළද නිරවද්‍ය වේ. සටහන් හටහන් යන වචන දෙකින් කවරක් වුවත් ව්‍යවහාරයෙහි උප යුක්ත වේ. මෙබඳු සෙසු තැනුත් එසේ මැයි.

I **ත්‍රිවිධ සකාරයः**— සකාරයද ස්වභාෂායෙහි තුන් පරිද්දකින් යෙදේ. තත්සම සකාරය, තද්භව සකාරය, ආදේශ සකාරය යන මොවුන්ගේ වශයෙනි. ආදේශ හකාරය දැනගනු කැමැත්තන් විසින් සකාරයාගේ මෙම භේදත්‍රය පළමු කොට අවබොධ කට යුතුයි. එහි තද්භව වූ හෝ තත්සමවූ යම් වචනයෙක පැවැති සකාරය මාතෘ ශබ්දසථ ස්වරයෙන් යුක්ත වේ නම් **ඒ තත්සම සකාරය** යි. උදාහරණ:—

| සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|
| සර්ව | සබ්බ | සව් |
| ප්‍රසන්න | පසන්න | පසන් |
| රස | රස | රස |

තද්භව වචනයෙහිවූ සකාරය මාතෘ වචනයෙහි සකාරසථ ස්වරයට අසමාන ස්වරයකින් යුක්ත නම් හේ **තද්භව සකාරයයි** උදාහරණ:—

| සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|
| ශඞ්කිත | සඞ්කිත | සැක |
| ශාසන | සාසන | සසුන් |
| වර්ෂ, වර්ෂා | වස්ස | වැසි |

මාතෘ ශබ්දයෙහි ච, ජ, ඣ, ද යනාදි අක්ෂරයන්ට ආදේශවූ සකාරය **ආදේශ සකාරයයි**. උදාහරණ:—

| සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|
| චම්පක | චම්පක | සපු |
| ජින්න | ජින්න | සින්, සුන් |
| ඡේක | ඡේක | සේ |
| නිර්ඣර | නිජ්ඣර | සැළි (ජලශ්‍රොතස) |
| කදලී | කදලි | කොසෙල් |

හකාරය ආදේශ වනුයේ මෙසේ ත්‍රිවිධවූ සකාරයටයි. යට දැක්වූ භේද ත්‍රයට අයත් වචනයන්හි සකාරයට හකාරය ආදේශවූ කල්හි මෙසේයි.

**තත්සම සකාර හකාරයං**

සව් = හව්
රස = රහ, රැහැ
පසන් = පහන්
කොසෙල් = කෙහෙල්

**තද්භව සකාර හකාරය.**

සසුන් = හසුන්
සැකි = හැකි
වැසි = වැහි

**ආදේශ සකාර හකාරය.**

සපු = හපු. සේ = හේ. සැළි = හැළි
සින් = හින් සපා = හපා.

හකාරාදේශවන අන්‍ය සකාරයෙක් මේ විනා නොමැත්තේය.

## II හකාරාදේශයෙන් පසු ලැබෙන කාර්‍ය්‍ය.

ඇතැම් වචනයන්හි සකාරයට හකාරාදේශවූ පසු උච්චාරණ සෞකර්‍ය්‍යය සඳහා කාර්‍ය්‍යාන්තරයෝ ද වෙත්. (මුසල)*මුසල් යනු හකාරාදේශ කළ කල්හි මූහල් යනු වේ හකාරයේ අකාරයට ඔකාරාදේශ හා තන්නිමිත්තෙන් මකාරයේ උකාරයට පිළිපෙරළි ඔකාරයක් ම වීමෙන් මොහොල් යී සිද්ධවේ. (විසජ්ජිත) විසඳ යන තන්හි හකාරාදේශයෙන් විහඳ යී සිටි කලැ වකාරයේ ඉකාර නිමිත්තෙන් තදනන්තරවූ හකාරයේ අකාරයටද ඉකාර පිළිපෙරළියෙන් විහිඳ යී වේ.

(විසෘටය) විසට යනුදු හකාරාදේශවැ විහට යී වූ පසු වකාරයේ ඉකාරයට උකාර පිළිපෙරළි වැ තන්නිමිත්තෙන් තදනන්තර හකාරයේ අකාරයට එම උකාරයම වීමෙන් වුහුට යී සිද්ධවේ. රස යන්නෙහි හකාරාදේශයෙන් පසු අකාරවයටම පිළිපෙරළි ඇකාරයක් වීමෙන් රැහැ යී සිද්ධවේ. (ආසාළහ) ඇසළ=ඇහැළ (අස්සත්ථ) ඇසටු=ඇහැටු යනුත් මෙසේ මැයි.

## III සකාරයට හකාරාදේශ අනභිමත ස්ථාන.

සකාරයට හකාරාදේශවන නමුත් හේ නිත්‍ය විධියෙක් නොවේ. යම් වචනයෙක්හිවූ සකාරයට හකාරාදේශ කළ කල්හි මුල් වචනයෙහි අර්ථයට විරුද්ධවූ අර්ථයෙක් ප්‍රකාශ වේ නම් එබඳු වචනයන්හි සකාරයට හකාරාදේශ කිරීම අභිමත නොවේ. සඳහා (සන්ධාය) හඳහා, සිඳත්=හිඳත්, සුරහු (සුර) හුරහු කියාද පසක් (පච්චක්ඛ) පහක්, සපු (ජපද) හපු, වසත් (වසන්ත) වහත්, සජන (සජ්ජන) හදන, සිරි (ශ්‍රී) හිරි, ඔසු (ඔසධ) ඔහු

ඉසුරු (ඓශ්වය්‍ය) ඉහුරු යි සකාරයට හකාරාදෙශ කළහොත් මූල් වචනයේ අර්ථයට ඉඳුරාම විරුඬවූ අර්ථයෙන් ප්‍රකාශ වේ. එබඳු තැන සකාරයට හකාරාදෙශය අභිමත නොවේ. මෙසේ විරුඬාර්ථ ප්‍රකාශනයෙන් සකාරයට හකාරාදෙශ නොකට යුතු බොහෝ තැන් භාෂායෙහි විද්‍යමාන යහ.

IV **සකාර යුක්තවූ සමානාර්ථ ඇති ඇතැම් වචනද භාෂායෙහි ඇත්තාහ.** සපා යනු සිපාසිද ව්‍යවහාර කරනු ලැබේ අර්ථය එකෙක් මැයි. එහි සපායන්නෙහිම සකාරයට හකාරාදෙශ වනු මිසැසිපා යන්නෙහි සකාරයට නොවේ. විරුඬාර්ථ ප්‍රකාශක බැවිනි. ආදෙශ හකාරය වනාහි අති සූක්ෂමය. ආචාය්‍ය සම්ප්‍රදායයක් නැති කල්හි මෙහි අවගාහණය දුෂ්කර වන්නේ මැයි.

### V **ආදෙශ හකාරයාගේ ව්‍යවස්ථිත විභාෂාව.**

---

ආදෙශ හකාරය විභාෂා විධියෙකි. විභාෂා නොමෝද විභාෂාය ව්‍යවස්ථිත විභාෂා යයි විවිධ වන්නීය. **විකල්පය විභාෂා නම්** නිශ්චිත විකල්පය **ව්‍යවස්ථිත විභාෂා යි.** යම් විධානයක්හුගේ **වීමත්** නොවීමත් දෙකෙක් ඇතිවේ නම්, හෙ‍ ‍ විභාෂා නම්. ඇතැම් තැනෙක්හි නිත්‍යයෙන් වීමත් ඇතැම් තැනෙක්හි අනිත්‍යයෙන් වීමත් කිසි තැනෙක්හි අසත් විධියත් හෙවත් කිසිසේත් ම නොවීමත් යන විධි ත්‍රයයාගේම හෝ දෙකක්හුගේ හෝ වීම ව්‍යවස්ථිත විභාෂානමු.

මෙම විභාෂාවය අතුරෙන් ආදෙශවිධි හකාරය ව්‍යවස්ථිත විභාෂා විධියෙහි අන්තර්ගත වේ. සව්, හව් යනාදී ඇතැම් රූප යන්හි සකාරයට හකාරය ආදෙශවීම හා නොවීමත් සඳහා යනාදී ඇතැම් තන්හි කිසිසේත්ම නොවීමත් දක්නා ලැබෙන හෙයිනි.

### VI **ආදෙශ සකාරය.**

---

ආදෙශ හකාරයක් මුත් ආදෙශ සකාරයක් ශිෂ්ට ව්‍යවහාර යෙහි ඇති බැව් බොහෝ පඬිවරුන් විසින් නොසලකන ලදී. සිදත් සඟරායෙහිද ඒ සඳහා කිසිවක් සඳහන් නො කරන ලදී. ආදෙශ සකාරය යනු හකරට අදෙස් සකරයි, ස්කාරයට හකාරය ආදෙශ වන්නාක් මෙන්ම හකාරයටද ඇතැම්විට සකාරාදෙශ වේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

| උදාහරණ:- | සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|---|
| | හිඞ්ගු | හිඞ්ගු | හුඟු, සුඟු (පෙරුම්කායම් |
| | කටුකරෙහිණී | කටුකරෙහිණී | කටුකරෝහන, කටුකරෝසන |
| | හරිතාල | හරිතාල | හිරියල්, සිරියල් |

හිඞ්ගු ශබ්දයෙන් තද්භව වනුයේ හිඟු, හුඟු යනුයි. පසුව හකාරයට සකාරාදෙශ කිරීමෙන් සුඟු කියා වේ. කටුකරෙහිණී, හරිතාලයන වචනයන්හිවූ හකාරයට සකාරාදෙශවැ කටුකරෝසන යනුද සිරියල් යනුද වේ.

**සකාරයට හකාරාදෙශ කළ කල්හිමෙන් හකාරයාහට සකාරාදෙශ කළකල්හිද උච්චාරණ සෞකර්‍ය්‍යය සඳහා කාර්‍ය්‍යාන්තරයෝද වෙත්** හකාරයට සකාරාදෙශ කළ කල්හි සිඟුයි සිටියි. නැවත සකාරයෙහි ඉකාරයාහට පර නිමිත්තෙන් උකාරාදෙශ කළ කල්හි සුඟුයනුවේ. හකාරයට සකාරාදෙශවැ කටුකරෝසිනී සිටි කලැ ඉකාරයට පිළිපෙරළී අකාරාදෙශවැ කටුකරෝසන යී වේ

## ආදෙශ සකාරයාගේ ව්‍යවස්ථිත විභාෂාව.

ආදෙශ හකාරයෙහි මෙන් ආදෙශ සකාරයේහිද ව්‍යවස්ථිත විභාෂාව ඇත්තීවේ. සුඟු, කටුකරෝසන යනු හකාරයට සකාරාදෙශය නිත්‍යයෙන් කිරීමෙනි. මහත්මෝ, මහතා යනාදී වචනයන්හි හකාරයට සකාරාදෙශ කිරීමෙන් මසත්මෝ, මසතා යී කිසිවිටෙකත් නොවේ. බොහෝ යනු එසේම බොසෝයයි ද මහවත් (උලූක) මසවත්, වරහ (වරාහ) වරස, රහ (යොග්‍ය) රස යී ද නොවේ. සිදත් සඟරායෙහි මෙය නොදක්වන ලද්දේ භූයො ව්‍යාප්තියෙනැයි සැලකිය හැක්කේය.

## 2. ආගම විධි හකාරය.

ආගම විධියෙන් පැමිණි හකාරය ආගම විධි හකාරයයි. මාතෘභාෂායෙන් බිඳී ආ ශබ්දයකට එහි (මාතෘ වචනයෙහි) නොතිබූ හකාරයෙක් අමුතුවෙන් පැමිණේ. මීට ඇති හේතුහු දෙදෙනෙකි. එකෙක් ධනිතාක්‍ෂරයට එහි සිථිලාක්‍ෂරයක් ආදෙශ වීමයි. අනෙක වචනයක මුලින්සිටි දීර්ඝ ස්වර ය යි.

## I විවිධ ආගම හකාරය.

ස්වර සහිත හකාරාගමය, ස්වර රහිත හකාරාගමයයි ආගම හකාරය දෙවැදෑරුම් වේ. ස්වර සහිත ආගම හකාරය මධ්‍යයෙහිය, පදාන්තයෙහි ය යි යළිත් දෙවැදෑරුම් වේ.

## II පද මධ්‍යයෙහි ප්‍රථම හේතුක ස්වරසහිත ආගම හකාරය.

| සංස්කෘත | මාගධ | සිංහල | අර්ථ |
|---|---|---|---|
| ස්නාත | න්හාත | ගන්, ගහන් | නෑහැය |
| අශ්‍රුධාරා | අස්සුධාරා | අස්දර – ඇස්දහර | කඳුළු |
| සද්ධර්ම | සද්ධම්ම | සදම්–සදහම් | බණ |
| මධ්‍යස්ථ | මජ්ඣත්ත | මැදත් – මැදහත් | මැදහත් |

## III පදාන්තයෙහි ප්‍රථම හේතුක ස්වර සහිත ආගම හකාරය.

| සංස්කෘත | මාගධ | සිංහල | අර්ථ |
|---|---|---|---|
| ශ්‍රද්ධා | සද්ධා | සැදෑ–සැදෑහැ | ඇදහීම |
| ඍද්ධි | ඉද්ධි | ඉදු–ඉදුහු | සෘද්ධිය |

## IV ස්වර රහිත ආගම හකාරය.

සිද්ධාර්ථ සිද්ධත්ථ සිදුඅත් සිදුහත් ගෞතම බුදුහු

## V පද මධ්‍යයෙහි ද්විතීය හේතුක ස්වර සහිත ආගම හකාරය.

| සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|
| කායබන්ධන | කායබන්ධන | කාබාන් – කහබාන් |
| නිර්දෘස | නිද්දෘස | නිදස් – නිදහස් * |
| සලාකහස්ත | සලාකහත්ථ | ලාබත් – ලහබත් |
| ස්ථාවර | ථාවර | තාවුරු – තහවුරු |
| මාලක | මාලක | මාල් – මහල් |

මෙබඳු තැන සස්වර හකාරයක් ආගමවූ කලැ පූර්වයෙන් සිටි දීර්ඝ ස්වරය හ්‍රස්වත්වයට පැමිණේ. හකාරාගමය පිළිබඳ මෙම ද්විතීය හේතුව ඇතැම් දීර්ඝ ස්වරයක් සිංහල හ්‍රස්වවැ බිදීම ය යි සලකත් නිද්දෘස, නිර්දෘස, නිදස්, නිදහස්,මාලක, මල් මහල් යනාදී වශයෙනි.

---

* මෙය සමාසයෙහි මිසැ ව්‍යස්තයෙහි නොවේ.

මාතෘ භාෂායෙහි ධනිතාක්ෂරයක් ශිථිලාක්ෂරයකට තද්භව වීමෙන් ඉන් පරවැ වන හකාරාගමය මාතෘ වචනස්ථ ධනිතාක්ෂර යෙහිම තුබූ හකාරය ය" යි බොහෝ දෙන සලකත්. ධනිතාක්ෂර යක් සෑදී තිබෙන්නේ එහිම සිථිලාක්ෂරයත් හකාරයත් යන දෙදෙනාගේ සංයොගයෙනැ "යි ඔහු සලකත්. ඒ මෙසේයි. ක් + හ් × අ=ඛ; ග් + හ් + අ=ඝ යනාදී වශයෙනි. අපගේ රුචිය වනාහි මෙසේ නොවන්නීය. එසේ කල්හි මෙබඳු තැන් ආගම හකාර යෙහි නොවැ ප්‍රකෘති හකාරයෙහි ගැනෙණ බැවින.

## ආගම හකාර ලොපයෙන් පූර්ව දීර්ඝය.

ආගම වූ ස ස්වර හකාරය ලොප්වැ පූර්ව ස්වරයහට දීර්ඝද වේ.

දහම = දෑම සැදැහැ = සැදෑ

"සැදෑලෙන් වරුණ දෙව් රද මුහුද විසූ"

"සිටින ලියන් දෑකැ සිහිසරා බණදෑම"

යන ශාරිකා සන්දෙශ කීර සන්දෙශාදී පාඨයෝ ඊට සාධක වෙත්.

## ආගම හකාරයාගේ අනිත්‍ය විධිය.

විවිධවූම ආගම හකාර අනිත්‍ය විධියෙන් යුක්ත වේ. ඇස් දර යනු ආගම හකාරයෙන් ඇස්දහරයිද එසේ නොවැ ඇස්දරයිද වේ.

"රුපු තඹුවනැස් සඳකැන්-මිණින් මිම් ඇස්දර තෝ "යනාදී යයි සිදුහත් යනු සිදුඅත් යී ද වේ.

## ප්‍රකෘති සම්බන්ධ හකාරය.

ආදෙශ හකාරයක් හෝ ආගම හකාරයක් හෝ නොවන් නාවූ වචනයන්හි ස්වභාවයෙන් පිහිටි හකාරය ප්‍රකෘති හකාරයි. පහර, මහත්, හද, හළ, හැඟි, හිවි, හුරු, යනාදියයි. මෙම වචන යන්හි පැනෙණ හකාරය සකාරයට ආදෙශවීමෙන් හෝ ආගම වීමෙන් හෝ නොපැමිණැ ස්වභාවයෙන් පැවැති හෙයින් ප්‍රකෘති හකාර නම් වේ.

## I ප්‍රකෘති හකාරයෙහි ත්‍රිභෙදය

**තත්සමය, තද්භවය, නිෂ්පන්නය යි ප්‍රකෘති හකාරය ත්‍රිවිධ වේ.** මාතෘ ශබ්දයෙහි හකාරය යම් ස්වරයක් සමඟ සිටියේ නම් ~~තද්භවවූ හෝ~~ තත්සමවූ හෝ සිංහල ශබ්දයෙහිත් එම ස්වරය සමඟම සිටි හකාරය **තත්සම ප්‍රකෘති හකාරය** වේ

| සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|
| කොලාහල | කොලාහල | කොලහල |
| මහත් | මහන්ත | මහත් |
| සහස්‍ර | සහස්ස | සහස්, දහස් |
| හංස | හංස | හස් |
| හද | හද | හද |
| හය | හය | හය (අශ්ව) |
| හෘ | හර | හර |

මාතෘ ශබ්දයෙහි හකාරය සිංහලට බිඳී එනකල්හි අන්‍ය ස්වරයකින් යුක්තවී නම් හේ **ශුද්ධ ප්‍රකෘති හකාරය** යි.

| සංස්කෘත | මාගධ | සිංහල |
|---|---|---|
| ආහාර | ආහාර | අහර |
| ප්‍රහාර | පහාර | පහර |
| ව්‍යවහාර | වොහාර | වහර |
| විහාර | විහාර | වෙහෙර |
| ඉතිහාස | ඉතිහාස | ඉතිහස |
| බහු | බහු | බුහු–බොහෝ |

භාෂාන්තරයකින් නොපැමිණ සිංහලයෙහිම ඇති හකාරය **නිෂ්පන්න හකාරය** වේ. හඬ (ශබ්දය) හුරු (උචිත) හොරු (ද්‍රෝණි) හිවි (උච්ච) හුණු (පතිත) හොළ (දුඃඛ) හමළ (හැමූ) යනාදියයි.

## 4. හකාරය හා ප්‍රාණාක්ෂරය.

ආදේශ හකාරය සහ ප්‍රකෘති හකාරය මුල්කොටැ ඇති ඇතැම් ශබ්දයන්ගේ හකාරය ලොප්වී ප්‍රාණාක්ෂරය පමණක් ශේෂ වේ.

| | | | |
|---|---|---|---|
| සැමඳ | හැමඳ | ඇමඳ | (ඇමඳලා) |
| සැඳිනැ | හැඳිනැ | ඇඳිනැ | (සංජානනය කොටැ) |
| සිඹැ | හිඹැ | ඉඹැ | (චුම්බනය කොටැ) |
| | හද | අද | (හෘදය) |
| | හඬ | අඬ | (ශබ්දය) |
| | හැඟි | ඇඟි | (ඉඞ්ගිත, අභිප්‍රාය) |
| | හොරු | ඔරු | යනාදියයි. |

## 5. ප්‍රාණාක්ෂර පාඨ.

හකාරය හා ප්‍රාණාක්ෂරය යනුවෙන් දක්වූ හකාර ලොපයෙන් ශේෂවන ප්‍රාණාක්ෂරය පමණෙක් නොවැ ප්‍රාණාක්ෂරය

ආදිකොටැ ඇතිවම සිද්ධවූ බොහෝ වචනයෝද ස්වභාෂායෙහි ව්‍යවහාර වෙත්. මෙහි හෙතුව එබඳු වචන මාතෘ භාෂායෙහි ස්වරයක් ආදිකොටැ ඇති වචනයන්ගෙන් ම ව්‍යවහාරයට පැමිණි ම යි, **තත්සම, තද්භව, නිෂ්පන්න සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ප්‍රකෘතිහුම මෙහි ලැබෙත්.** අසි = (ඛඩ්ග)

අඤ්ජන = අඳුන්, අඤ්ජිත්වා = ඇඳැ
අවතීණ්ණ = අවතිණ්ණ එරැණු
ආලොක ආලොක = අලු
ආවුණ්ණිත ඇවිණි

ඔළු (සීසි) යනාදියයි.

සිඟුරු, හිඟුරු, ඉඟුරු යනාදි හකාර ලොපයෙන් ප්‍රාණාක්ෂරය ශෙෂවන පාඨ යන්හා විය හැකි සඞ්කරත්වය නිරවුල් කැරගැනීම පිණිස ප්‍රාණාක්ෂරය පිළිබඳ මෙම විශෙෂය මනාව දත යුත්තේ වේ.

## 6. සමාන පාඨ.

සං උපසර්ගය මුල්කොටැ සිද්ධවූද අ උපසර්ගය මුල්කොටැ සිද්ධවූද මාතෘ භාෂාමය වචනයන්ගෙන් සිද්ධ හකාරාදිවූද ස්වරාදිවූද **ශබ්ද** කෙනෙක් ස්වභාෂායෙහි ඇත්තාහ.

| පාළි. | සිංහල. | පාළි. | සිංහල. |
|---|---|---|---|
| සංරභ්‍ය | හැරැඹැ | ආරබ්භ | ඇරැඹැ |
| සම්මුඛ | හමු | ආමුඛ | අමු |
| සංකුචිත්වා | හැකිලැ | ආකුඤ්චිත්වා | ඇකිලැ |

මෙහි මාතෘ වචන හා එයින් භින්නවූවාහුද අන්‍යොන්‍ය විසදෘශ වෙති. එසේ කල ඔහු කුමක් හෙයින් සමාන පාඨ වෙත්ද? අර්ථ වශයෙන් කිසි තැනෙකැ ලැබෙන සමානත්වය සැලකීමෙනි. සංරභ්‍ය (හැරැඹැ) යනුත් ආරබ්භ (ඇරැඹැ) යනුත් විසදෘශද විශදෘශාර්ථද ඇතිවෙත්. සංරභ්‍ය (හැරැඹැ) යන පෙර කිරිය කොප කොටැ, ආක්‍රොෂකොටැ, උත්සාහ කොටැ, වෙගය කොටැ යන අර්ථ ඇත්තී වේ. ආරබ්භ (ඇරැඹැ) යනුදු ආරම්භ කොටැ, පටන් ගෙනැ, උපක්‍රම කොටැ, දැඩිකොටැ, උත්සාහ කොටැ වේගය යුහුබුව කොටැ යන අර්ථයන්හි යෙදේ. මෙසේ මොවුන් වචනයෙන් හා අර්ථයෙනුත් විසදෘශවුවද අර්ථ වශයෙන් සමානතාවයද ඇති හෙයින් එය සලකා සමාන පාඨය"යි කියන ලදහ.

**හකාර විනිශ්චයෙහි ඇතුළත් ප්‍රාණාක්ෂර පාඨයෝ භේදත්‍රයකින් යුක්තයහ.** හකාරය ලෝප් වැ ප්‍රාණාක්ෂරය ශේෂවූ එක් කොටසෙකි. "හකාරය හා ප්‍රාණාක්ෂරය" යන්නෙහි නිර්දිෂ්ටවූ පරිදිවූ තවත් භෙදයෙකි. මෙහි කියූ "සමාන පාඨ"ඩ යෙන් ගැනෙණ අනෙක් ප්‍රභෙදයෙකි. හකාරය පිළිබඳ ප්‍රාණාක්ෂර යුත් වචන නිරවුල්වැ අවබොධ කැරැ ගැන්මෙහි මෙකී භෙදත්‍රය පිළිබඳ විශෙෂාව බොධය අතිශයොපකාරි වේ.

## හකාර විනිශ්චයෙහි උපාය.

තත්සමාදි ප්‍රකෘතිය හැඳිනීමෙහි සාමාර්ථ්‍ය ම හකාරය විනිශ්චය කැරැ ගැනීමෙහි ඇති එකම උපාය වේ. එහි අසමර්ථ වූයේ හකාර විනිශ්චයෙහි පොහොසත් නො වේ.

## අනියම විධි හකාරය.

ප්‍රකෘතිය අනුව සලකන කල්හි හකාරයෙන් යුක්තවිය. යුතුම වචනයක් කිසිසේත් ම එසේ නොවන්නේ නම් හෝ හකාරයෙන් යුක්ත නොවිය යුතු වචනයක් කිසිසේත් ම එසේ නොවන්නේ නම් හෝ අනියම විධි හකාරය"යි දන්නා ලැබේ මාගධ හත්‍ථ ශබ්දයෙන් හෝ සංස්කෘත හස්ත ශබ්දයෙන් හෝ බිඳී සිය බසෙහි අතට ව්‍යවහාර විය යුතු ශබ්දය 'හත්, ශබ්දය, වේ. නුමුත් හේ කිසිසේත්ම එසේ නොවැ 'අත් කියා ව්‍යවහාරවේ. මාගධ 'අත්‍ථ, ශබ්දයෙන් හෝ 'අත්‍ථං, යන අව්‍යයෙන් හෝ සංස්කෘත අස්ත ශබ්ද යෙන් හෝ 'අස්තම්, යන අව්‍යයෙන් හෝ බිඳී සිය බසෙහි අවර පර්වතයට බස්නාහිරට ව්‍යවහාර කළයුතු ශබ්දය 'අත්, කියා වේ. එහෙත් කිසිසේත්ම එසේ නොවැ එම ශබ්දය 'හත්, කියා ව්‍යවහාරයි. මේ වනාහි හකාරය පිළිබඳ අනියම් විධියෙකි. ව්‍යවස්ථාවක් නැතිව පැවැත්මෙකි. නෛයායික තර්ක ශාස්ත්‍රඥයෝ "**සාධාරණ නෛකාන්ත හෙත්වා භාස**"ය යි මෙබඳු වූවන්ට නම් කෙරෙත්. සිදත් සඟරා කර්තෘන් වහන්සේ විය බිසර (ව්‍යභිචාර) ය"යි මීට නම් කරන ලදී.

———————

ගෝනගල ආණ්ඩුවේ බාලිකා පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍ය
**ඇන්. ආර්. ද සිල්වා මහත්මිය විසින්**
සම්පාදනය කරණ ලදී.

---

# කෘමි වර්ග.

## සාමාන්‍ය වර්ණනාව.

---

ග්‍රාමීය විද්‍යාව පිළිබඳ පාඩම් කොටසට අයත් "කෘමිවර්ග" යන මාතෘකාව යටතේ සම්පාදනය කරන ලද මේ ලිපියෙන් අදහස් කරන පරමාර්ථය නම් ස්වභාව ධර්ම ශාස්ත්‍රය කෙරෙහි අපේ ඇල්ම හැකිතාක් වර්ධනය කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිඵලයන් අත්කර ගැනීමයි.

අපට නිතර දකින්ට ලැබෙන **මැස්සා, සමනලයා** වැනි සතුන් අපූර්ව ලෙස නොපෙනතත් උන්ගේ පුදුම ජීවිත කථා අසනවිට මවිත නොවී බැරිය. ගෙමිදුල්වල දකින්ට ලැබෙන කුරුමිණියා කෑත සතෙකැයි සිතෙතත් උගේ උත්පත්තියත්, පැටවුන්ට ආහාර සපයන සැටිත්, සාහසික ක්‍රියාත්, අසනවිට පුදුම එලවාමැයි වේයා නම් කවුරුත් පාහේ දන්නා කුඩා සතෙකි. රාශි වශයෙන් එක්වීමෙන් මොවුන් විසින් කරනු ලබන දස්කම් හා ඔවුන්ගේ සමගිබලය අපට විනෝදය ඇතිකරයි. තණපඳුරක සැඟවී සිටගෙන මහත්සේ ශබ්ද කරන පලාගිරවාද තමන්ගේ පාඩුවේ වැඩ සාරන අහිංසක ශොභන සතෙක් වූ, **කුඹලාද,** ලාක්ෂාරස ලබාදෙන ලාක්ෂා කෘමියාද, අපගේ පුදුමයට හේතුවූ සත්තුය. කෘමීන් ස්වල්ප දෙනෙකුන් ගැන සාමාන්‍ය වශයෙන් දක්වන ලද නමුත් සියලුම කෘමීන්ගේ ස්වභාව ගති පැවතුම් ආහාර පැටවුන් ආදිය ගැන විස්තර සලකා බලන කල්හි ඔවුන් ගැන බොහෝ කාරණා ඉගෙණීමට ඇතිබව පෙනේ. කරුණු මෙසේ වුවත් මේ පාඩම් සම්බන්ධ අපේ දැනුම වර්ධනය කර ගැනීමට ඇති එක් පාඩුවක් නම් සිංහල භාෂාවෙන් සම්පාදිත ස්වභාව අධ්‍යයනය පිළිබඳ පොත් දුර්ලභවීමයි. ගොවිකම් දෙපාර්තමේන්තුව මගින් තෙමසකට වරක් පලකරනු ලබන ගොවිකම්

සඟරාවද ඒ. සී. ඊ. හෝල්සිංගර්, මාර්ටින් වික්‍රමසිංහ යන මහතුන් විසින් සම්පාදිත ස්වභාව අධ්‍යයන කථා පිළිබඳ පොත් පඞක්තියද, මේ පාඩුව තරමක් දුරට සංසිඳවීමට හේතුවන බැව් මෙහිදී සිහිපත් කිරීම යොග්‍යයයි හැඟේ. සාමාන්‍ය වර්ණනාව මෙතෙකින් නිමකොට මේ ලිපියේ විස්තර වර්ණනාව පිළිබඳ අදහස් මින්පසු ප්‍රකාශ කරනු ලැබේ. ඒ වනාහි අප පෞද්ගලික අදහස් නොවන බවත් නොයෙක් පොතපතින් කියවා ලබාගත් කරුණු බවත් මෙහිදී සඳහන් කරණු කැමැත්තෙමි. මේ ලිපියට අඩංගුවූ කරුණු සැකෙවින් මෙසේය. එනම්:–


1 කෘමි යන නාමය හැඳින්වීම හා ඔවුන්ගේ සාමාන්‍ය ස්වාභාවික ලක්‍ෂණ, 2 කෘමි ජීවිතය පිළිබඳ අවස්ථා හා ප්‍රභෙද, 3 එක් එක් කෘමීන් පිළිබඳ කථා කියවීමෙන් උපුටා ගත හැකි සාරාංශ, 4 කෘමි වසංගත ඇතිවන ක්‍රම හා ඒවා මැඩලීමේ ගුරුකම්, 5 ජලජකෘමි යන මේවා වෙත්.

**1 කෘමි යන නාමය හැඳින්වීම හා ඔවුන්ගේ සාමාන්‍ය ස්වාභාවික ලක්‍ෂණ හැඳින්වීමේ පළමුවන කොටස.**

සියලුම සත්වයෝ 'කොඳු ඇට ඇති වර්ගය, 'කොඳු ඇට නැති වර්ගයයි. කොටස් දෙකකට බෙදෙත්. කොඳු ඇට නැති සත්ව වර්ග රාශියකි. ඔවුන්ට "කෘමි" යන එකම නාමයක් දියහැකිය. විශෙෂ ලක්‍ෂණ ගැන නොසලකා සාමාන්‍ය ලක්‍ෂණ අනුව කොඳු ඇට නැති සියලු සත්වවර්ග කෘමි ගණයෙහිලා සැලකීම බොහෝ දෙනාගේ සිරිතවූවද කෘමීන්ගේ ස්වාභාවික ලක්‍ෂණ අනුව සලකා බලන කල්හි එසේ සැලකීමට අවකාශ නැත. මොවුන්ගේ සාමාන්‍ය ස්වාභාවික ලක්‍ෂණයක් නම් අන්දම් මාරු කිරීමයි. සමහර කෘමීහු අර්ධ වශයෙන්ද සමහරු සම්පූර්ණයෙන්ද අන්දම් මාරු කෙරෙති. සම්පූර්ණයෙන් අන්දම් මාරු කිරීම පිළිබඳ කෘමී සංඛ්‍යාවට සමනලයාද අර්ධ වශයෙන් අන්දම් මාරු කරන සංඛ්‍යාවට දිමියා හෝ කුනුමිවාද නිදසුන් මෙන් දැක්විය හැක. මේ කරුණු අනුව කෘමීහු නම් අවස්ථා තුනකින් හෝ සතරකින් පෙනී සිටින සත්වයෝ යයි විස්තර කළහැක. නියම අන්දම් මාරුවීමක් ඇති කෘමීන්ගේ ජීවිතය අවස්ථා හතරකටද, අනියම් අන්දම් ඇති කෘමීන්ගේ ජීවිතය අවස්ථා තුනකටද බෙදේ.

**කෘමියෙකුගේ ශාරීරික ලක්ෂණ**

**1. රූපය.**




1. ස්පර්ශේන්ද්‍රිය
2. මුඛකෝෂය
3. සඞ්කීර්ණ ඇස්
4. උරය
5. පියාපත්
6. කකුල්
7. උදරය
8. ආශ්වාස ප්‍රාශ්වාස කරණ සූක්ෂම ඡිද්‍ර

කෘමීන්ගේ විශෙෂ ලක්ෂණ:- කෘමිහු අවස්ථා තුනක් හතරක් හෝ ගත කරති. ඔවුන්ගේ ශරීරය (හිස, උරය, උදරය) යන පැහැදිලි කොටස් තුනකින් යුක්තය. ඒවා පුරුක් සහිතය. මේ හැර උන්ට තවත් උපකරණ රැශියකි.

(1. රූප සටහන බලනු) හිසෙහි ඇති ඒවායින් ආහාර ගනිත්. හිසට අනතුරුව පිහිටි ඒවා දුවන්ටත් පනින්ටත් පිළියෙළවී තිබේ. මොවුන්ට ස්පර්ශේන්ද්‍රිය, දෙකක් තිබේ. කන් නැත්තේය. ස්පර්ශේන්ද්‍රිය වලින් ශබ්දයද ස්පර්ශයද දැනේ. ඉහඳ පණුවා ගුල්ලාගේ පැටවා යන සතුන්ට ගාත් සහ අත් නැත. ඔව්හු ආහාර ගොඩක ජීවත් වෙති. ශරීරයේ පේශි ඇකිලීම නිසා එහා මෙහා යති. බොහෝමයක් කෘමීන්ට අත්හැඳි හතර බැගින් තිබේ. ඒවා උරයේ දෙවැනි තුන්වැනි පුරුක්වල පිහිටා තිබෙත්, මේ අත්හැඳි සෑදී තිබෙන්නේ සිවියකිනි.

**මේ සතුන්ගේ ආශ්වාස ක්‍රමය:-** මොවුන්ට පෙණහැලි හෝ කරමල් නැත. ශරීරය පුරා දැලක් මෙන් පැතිරුණු ශ්වාස වේණු යයි නමලත් නාලවර්ගයක් ඇත්තේය. මේ වේණුවල විවර (කූප) ශරීරය දෙඅංශයෙහි පිහිටියේය. මේ ශ්වාසපුටවලින් ශ්වාසවේණු ඔස්සේ යන වාතයෙන් මොවුන්ට වුවමනා අම්ල කර ලැබේ.

**ඇස්:-** මේ සතුන්ගේ ඇස්වල නිර්මාණය විස්මය ජනකය මේ ඇස්වල පැති ගණනක් ඇතිහෙයින් ඒවාට සඞ්කීර්ණ ඇස් යයි ව්‍යවහාර කරනු ලැබේ. සහශ්‍රාක්ෂි යන නම කෘමීන්ට අන්වර්ථ වශයෙන් යෙදෙන්වට හේතුවත් මේ විස්මය ජනක ඇස්ය.

## 2. කෘමි ජීවිතය පිළිබඳ අවස්ථා හා ප්‍රභේද ගැන දෙවෙනි කොටස.

i බීජයක් වශයෙන් ක්‍රියා රහිත අවස්ථාව, ii පිළවෙකුමෙන් සිටින අවස්ථාව, iii කොෂවාසී අවස්ථාව, iv සම්පූර්ණයෙන් මව්පියන්ගේ රූපය වැනි අවස්ථාව යයි කෘමීන්ගේ ජීවිතය අවස්ථා හතරකි.

මේ සතෙකු බිත්තරයෙන් එළියට ආ තැන්සිට මව්පියන්ගේ රූපයට සමවනතෙක් සිදුවන වැඩීමට "අන්දම් මාරුවීම" යයි කියනු ලැබේ. බිත්තරය ගැසී එළියට ආවිගස **'පිළවා'**යන්නද ඉන්පසු අවස්ථාව කොෂස්ථයා යන්නද අවසාන වශයෙන් මව්පියන්ගේ නාමයද මේ සතුන්ට යෙදේ.

නිදසුන්:- සමනල පිළවුන්ට **දළඹු** යන්නද කුරුමිණි පිළවුන්ට **කම්බිපණු** යන්නද මැසිපිළවුන්ට **ඉහඳපණු** යන්නද ව්‍යවහාර වන්නාවූ මේ වර්ගීය නියම අන්දම් මාරුවීමක් ඇති කෘමීහුය.

**කැරපොත්තන්** වැනි සමහර කෘමි බිත්තරයෙන් එළියට එන්නේ මව්පියන්ගේ ස්වරූපයෙනි. මොවුන්ට කොෂවාසී අවස්ථාවක් නැත. එහෙයින් ඔව්හු **'අනියම් අන්දම්'** ඇති කෘමීහු වෙත්. මේ සතුන් **අවස්ථා අනුව ප්‍රභේද කරන කල්හි**

1 සම්පූර්ණයෙන් අන්දම් මාරුකරන කෘමීහුය අඩ වශයෙන් අන්දම් මාරුකරණ කෘමීහු යයි කොටස් දෙකකටද

**2 ස්වාභාවික ලක්ෂණයන්ට අනුව ප්‍රභේද කරන කල්හි**

1 උරා බොන නාලයක් සහිත කෘමි ii හපන හකු සහිත කෘමීහු යයි කොටස් දෙකකටද

**3 පියාපත් පිළිවෙලවීමේ අන්දමට කොටස් කරන කල්හි**


(අ) කොරපොතු සහිත පිහාටුවලින් යුත් කෘමි (සමනල වර්ග)
(ආ) ආරක්ෂක පියාපත් සහිත කෘමි (කුරුමිණි වර්ග)
(ඉ) පියාපත් දෙකින් යුත් කෘමි (මැසි, මදුරුවර්ග)
(ඊ) සෘජු පියාපත් සහිත කෘමි (පළගැටි, පළාපණු)
(උ) ජාලාකාර පියාපත් සහිත කෘමි (කිම් කුණ්ඩා)
(ඌ) සාමාගමික කෘමි (මීමැසි, වේ ආදීහු)
(ඍ) මෘදු ශරීරයකින් යුත් පියාපත් නැති කෘමි (කාවා) යයි කොටස් හතකටද වෙන්කළ හැක.

## එක් එක් වර්ගයේ කෘමීන් පිළිබඳ කථා කියවීමෙන් උපුටාගත හැකි සාරාංශ යන තෙවැනි කොටස.

**සමනලයා:-** කෘමීන් අතුරෙන් ශොභනවූ මේ සත්තු දෙවර්ගයක් වෙත්. මින් එක් වර්ගයකට අන්ධකාරයෙහි හැසිරෙන සමනල වර්ග හෝ මොත් වර්ගයයිද අනික් වර්ගයට දිවාකාලයෙහි හැසිරෙන සමනලයෝ හෙවත් "බටර්ෆ්ලයි" යන්නද ව්‍යවහාරයි. බටර්ෆ්ලයි වර්ගයේ වූවන්ද මොත් වර්ගයේ වූවන්ද හැඳින ගැනීමට ප්‍රයෝජනවත් වන එක් කාරණයක් නම් බටර්ෆ්ලයි වර්ගයේ වූවන්ට ඇති දිග සපර්ශ කුන්තල ජෝඩුවේ තුඩු ගැට සහිතය. අනික් වර්ගයේ වූවන්ගේ සපර්ශ කුන්තල ජෝඩුවේ ගැටනැත. තවත් කාරණයක් නම් මොත් වර්ගයේ වූවෙක් කොළයක වාඩිවූවිට අත්හැඳි පාත්කොට පැතලි අතට තබාගනී. බටර්ෆ්ලයි සමනලයා වාඩිවූවිට අත්හැඳි කෙළින් එක්කොට තබාගනී.


අන්දම් මාරුකිරීම පිළිබඳ නියම සවරූපවත් මේ කෘමි වර්ගයේ ගැණු සතා ඉදිරියට තම කුඩා පැටවුන්ට ආහාර වශයෙන් ප්‍රයෝජනවත් වියහැකි රට එරඬු, මූරුංගා, වරා, ආදී යම්කිසි ගසක කොළවල යට පැත්තේ බිත්තර ලන්නීය. දින කීපයකට පසු මේ බිත්තර ගැසී ඉන් කුඩා පිළුවි (දලඹුවෝ) එළියට එති. මේ දලඹුවාගේ හිසේ සිට වල්ගයට ඇති 'බූව' නිසා උගේ ආරක්ෂාව සිදුවේ මේ දලඹුවෝ ඉතා කෑදරලෙස කෑමකමින් වැඩෙත්. නමුත් උන්ගේ සම් නොවැඩෙත්. මේ අතර දලඹුවා හම ඉවත් කරයි. ඒ වෙනුවට ඇතුළත සිවියක් සෑදේ. මෙසේ කීපවරක් හම ඉවත් කරමින් වැඩුන දළඹුවා ගසේ රිකිල්ලකට බඩගා ගොස් උගේ හිසේ ඇති ආශය දෙකින් උනන ලාටු වැනි සෙවෙල ද්‍රවයකින් නූල්කැට කොෂයක් සාදාගෙන ඒ තුළට වී කොෂයෙන් රිකිල්ලට බැඳී සිටී. ඌ මේ අවස්ථාවේදී සෙලවීමක්වත් ආහාර ගැනීමක්වත් නොමැතිව ගත කරන් බැවින් **'රූකඩයා'** යන නම ලබයි. රූකඩයක්මෙන් සිටියත් සමනල සවරූපය ගැනීමට වුවමනා අවයවයන්ගේ වෙනස් බව සිදුවන අවස්ථාව මෙයයි. මේ මාරුවෙන් පසු දැන් **රූකඩයා** අත්හැඳි ඇති හොඬය සහ සිහින් කකුල් ඇති **සමනලයාවී** පියාඹා යයි. මේ සතාගේ දලඹු අවස්ථාව පැළෑටීන්ට අනතුරුය සහිත නමුත් **සමනල අවස්ථාව** ගස්වල ගෙඩි හටගැනීමේ හේතුව වන පරාග පොෂණය සිදුකරයි. එය 2 වෙනි 3 වෙනි රූප සටහන් වලින් පෙනේ,

2 රූපය.



බටර්ප්ලයි වගීගේ සමනලයා.

3 රූපය.



මොත් වගීයේ සමනලයා.

**ඒරි පටපනුවා**:-මේ නමින් අඳුන්වනු ලබන කෘමියාද මේ සමනල වගීයට අයත් සතෙකි. උණ පටනූල් සම්පාදනයකොට දෙන බැවින් මිනිසුන්ට ප්‍රයෝජනවත්ය.


**ලාකෂා කෘමියා**:-ලඞකාවේ කෝන්, මසන්, කරඳ යන ගස් වගීයන්හි බෝකළ හැකිවූ මේ කෘමියා තමා ජීවත් වන්නාවූ යම්කිසි ගහක යුෂ උරා බී ලාකෂා නම් ද්‍රව්‍ය පිට කරයි. සූකෂම දර්ශක කන්නාඩියකින් බැලූකල මේ සතුන් පිළිබඳ කරුණු ඉතා හොඳින් දැනගත හැක. මේ කෘමියා වසන ගස්වල ලාකෂා බීජ තට්ටු වශයෙන් බැඳී තැන්පත් වේ. මේ කෝටු කැබලි කපා ගසේ ලාරිකිලිවල සපයීවන ලෙස පට්ටා වගීයකින් බැන්ද කල කෘමීහු ගසේ අතුවල තැන්පත්වෙති. අතුවල තැන්පත්වූ කෘමීහු ගසේ පොෂ්‍යය ලබමින් ලාකෂා පිටකරන කල්හි ඔව්හු එයින් වැසෙත්. එකල ලාකෂා තට්ටුවෙන් පිටට පැමිණ තිබෙන කෙශාකාර නාලයන්ගේ මගින් ආශ්වාස ප්‍රශ්වාස කරමින් සිට ටික කලකට පසු පිරිමි සතා එතැනින් පිටවී යයි. නමුත් ගැණු සතා එහිම නැවතී බිත්තර දමන්නීය. ඒවායේ රතුපාට කුඩා පණුවෝ ඇතිවෙත්. එය අස්වැන්න කපා ගැනීමට සුදුසු කාලය වේ. එනම් කෘමි පැටවුන් පිටවීමට සති දෙකකට කලින්ය. මේ කෘමියා විසින් පිටකරනු ලබන ලාකෂා නම් ද්‍රව්‍ය වකීයෙන් ඇති ප්‍රයෝජන බොහෝයි.

ඉන් සමහරක් නම්:

i ඇලවීමේ ලාකඩ කැබලි සෑදීම, ii කඩුම්ටි සවිකිරීම, iii වාර්නිස් වගී හා සායම් වගී, කල්පවත්වා ගැනීමේ තීන්ත සෑදීම, iv මුද්‍රණ තීන්ත වගී සෑදීම සහ තවත් අනෙකවිධ

ප්‍රයෝජනයෝයි ඉන්දියා වාසීන් විසින් ලබන ප්‍රයෝජන මීට වඩා බොහෝය. ඉන්දියාවේ මේ සතෙකුගේ වැඩීම ඇතිවන කාලය වශයෙන් සොයා දැනගෙන තිබෙන්නේ නිරිතදිග මෝසම් සුළං කාලයයි. නමුත් ලංකාවෙහි ඊසාන දිග, නිරිත දිග මෝසම් සුළංකාල දෙක්හිම බෝ කළ හැකි බැව් කෘමි විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රඥයින්ගේ මතයයි.

**ලේඩිබර්ඩ් කෘමියා**:–සාමාන්‍යයෙන් ඉබ්බෙකුගේ හැඩහුරු



කම ඇති මේ කෘමියා පැලෑටි උකුණන්ගෙන් ගහනවූ බෝංචි පැලවලද, පතෝල, කරවිල, වම්බටු ආදී එළවලු වර්ගයන්හි කොළ වලද, බොහෝ සෙයින් සිටී. ශරීරය කළු හෝ රතු පුල්ලි වලින් ගැවසි මොව්හු දීප්තිමත් පෙනීමක් ඇති සත්තුය අපේ එළවලු විනාශ කරන පැලෑටි උකුණන් හා පණුවන් කා දැමීමෙන් භොග වැවීම සම්බන්ධයෙන් මේ සතා අපට උපකාර වේ.

**මැසි වර්ග**:–මේ නාමයෙන් අඳුන්වනු ලබන කෘමින්ගෙන් වැඩි වශයෙන් සැලකිය යුතු සමහරෙකු ගැන පමණක් කරුණු දක්වනු ලැබේ

**මීමැස්**:–සමාගාමීභාව හැසිරෙන මොවුන් විසින් සාදනු ලබන පුදුමාකාර **'මීය'** වනාහි අංග සම්පූර්ණවූ නගරයක් වැනිය, නගරයකට රජෙක් අවශ්‍යවූවාක්මෙන් මොවුන්ටද ප්‍රධානවූ **මී මැසි රැජිණියක්** ඇත. යම්කිසි ගල්ලෙනක හෝ ගස් බෙනයක සාද ගන්නාවූ මේ රාජධානියෙහි වැඩකරුවෝ, මුරකරුවෝ. සොල්දාදුවෝ, රැකීරක්ෂා සොයන්නෝ, ආදීහු ඇත්තාහ. මී මැසි රැජිණිය තමා වෙනුවෙන් තනා තිබෙන විශෙෂ කාමරයක වසන්නීය. එහි සිටින සියලුම මී මැස්සෝ රැජිණියගේ අණට එකවරම කීකරු වෙත්. මීයක් අසලින් යන කල්හි අපට විෂ සහිත දළින් ඇන තුවාල කරන්නෝ නම් මුරකරුවෝය. අන්‍ය මැසි රැළකට පහර දෙන්ට වූවොත් සොල්දාදුවෝ ඒ සඳහා යෙදෙත්. ඔව්හු එක් ස්ථානයක් හැර අන්‍ය ස්ථානයකට යාමේදී රජ මැස්සිය අනුව යති. ඇය ගොස් හිඳ ගන්නා තැනක අනික් මැස්සෝද හිඳ ගනිත් එසේ ගොස් විසීමට අමුතු

වාසස්ථානයක් සපයන්නී නම් මේ රජ මැස්සියයි. සමහර අව ස්ථාවන්හිදී මීමැස්සෝ රජ මැස්සිය හා සමග අමනාපව අතික් රැජිණියක් සූදානම් කරත්. රජ මැස්සී මේ බව දැනගත් කල්හි ඔවුන් සමග සමගිවන්නීය. සමහරවිට මැස්සෝ එසේ සමගි නොවී පිළියෙල කරගත් රජ මැස්සියත් සමග එතැනින් පිටත්ව අන්‍ය ස්ථානයක් කරා යෙති. ගස්වල ගෙඩි හටගැනීමේ හේතුව වන පරාගපෝෂණය සිඩකිරීම මොවුන් විසින් කරනු ලබන බලවත් මෙහෙයකි. තවත් මී පැණි හා මී ඉටි ලැබීමද නිසා මොව්හු අපට ඉතා ප්‍රයෝජනවත් වන්නාහ.

**උල් මැස්සා**:=බොහෝ සවස්වී ගියවිට පියාසර කරන්නාවූ ලක්ෂණ කුඩා සතුන් වගයක් අපට නොයෙක් විට දකින්ට ලැබේ. විශාලවූ ඉතා තුනී විනිවිද පෙනෙන කොළ පාටටහුරු පියාපත් ඇති මේ මැසිවර්ගයේ සතුන්ගේ බිත්තර ලෑම පුදුම එලවයි. ඔව්හු එක් එක් බිජුව අඟල් බාගයක් පමණවූ හීන් නටුවක් උඩ ලති. දෙඩම් කොළවල යට පැත්තේ බොහෝවිට මේ බිජු දකින්ට ලැබේ. මේවා ගැසී ගියවිට පිළව් එළියට එති. මේ කෘමියා අපේ හොගවලට අලාභහානි පමුණුවන සමහර කෘමීන්ගේ ස්වාභාවික සතුරෙකි.

**කොකම් මැස්සා**:-ගොවීන්ට බොහෝ හානිකරන විනාශ දායක කෘමියෙකි. උදේ සවස දෙක්හිම ගොයම් ගස්වලට පැමිණ දළු හෝ කරල් කෑමෙහි යෙදෙන මේ සතා නියංකාලට තෙත් ස්ථානවලට පැමිණ සැඟවී සිට වැසි කාලය පැමිණිවිට නැවතත් ගොවීන්ට හානිකරන්ට පටන්ගනී. ගොයම් කොළ වල හෝ උෟට ආහාරවන වෙනත් තෘණ වර්ගයේ පඳුරුවල බිත්තර දමයි. මේවා දින හතරේ සිට නවය දක්වා අතර කාල යෙහිදී ගැසී පිළව් එළියට එති මව්පියන්ගේ ස්වරූපය ගැනී මට පෙර පස්වරක් හෝ හයවරක් හැව දමති. කොළපාටට හුරු මේ කෘමියාගේ ශරීරයේ සියුම් නපුරු ගඳක් තිබේ. මේ සතා ගොවියාට අනතුරුය කරන බැවින් සමහරු මන්ත්‍ර ගුරුකම් කරති. සමහරු මොවුන් වඳ කිරීමට කොහොල්ලෑ ගානලද කුළු රිටිවල බැඳ ගොයම් ගස් උඩින් අදිති. ගොයම් ගස් උඩ දැල් එලා ඇදීමෙන් මැස්සන් ඇල්ලිය හැක. මේ වනාහි හොඳ ප්‍රතිඵල ලැබියහැකි උපක්‍රමයක් බැව් දැනගෙන තිබේ. **පුල්ලි හයේ වග කුරුමිණියා** මේ මැස්සාගේ හතුරෙකි. (උෟට සම හරු පද්දුයයි කියති.) මේ සතා හැර ගොයමට අනතුරුය කරන තවත් සත්තු සිටිත්. ඔවුන්ගෙන් පැමිණෙන අනතුරු

සත් පැලය ලපටි කාලයේදී සිදුවේ. ගොඩවෙල්ලූ ආදී සමහර පණුවෝ කොළකා දැමීමෙන්ද කඳපණු ආදීහු කඳ හැරීමෙන්ද ගොයම් පැලයට අනතුරු කරත්.

**ගෙමැස්සා**:-නිතරම ගෙවල්, කඩපිල්, ආදියෙහිද පිලුන්වූ ආහාර බඳුන්හිද අපිරිසිදු වතුර දමන ස්ථානයන්හිද වසන මේ සතා බොහෝවිට බෝවෙන රෝග පතුරුවා හැරීමෙහි සමතෙකි

**මදුරු වර්ග**:-වර්ග රැශියක් නමුත් සියල්ලන්ගේම ජීවිත එකාකාරයි. සියුම් සිවිවලින් පිළියෙලවූ අත්තටු දෙකකින් යුත් මේ සෘමීහු ශීත ප්‍රදෙශවල හැර අන් සෑම ප්‍රදෙශයන්හිම පැතිර සිටිත්.

මැලේරියා උණ බෝකරන **'ඇනෝෆිලිස්'** මදුරුවාද මධ්‍යම අමෙරිකාවේ පවතින උණරෙගයක්වූ **'කහඋණ'** බෝ කිරීම ගැන සමත්වූ **'ව්‍යාඝ්‍ර මදුරුවාද'** ගස්බෙන, දිය හබරලගස් කොළ වැටි පල්වෙන පොකුණු යනාදියෙහි වරකට 25—75 **දක්වා බිත්තර දමමින් 'ඩෙංගු'** උණ බෝකරන **'ස්ටැගෝමියා'** මදුරුවාද මනුෂ්‍යයාට උපද්‍රව කරන ප්‍රධාන වර්ගයෝයි. මේ ස්ටැගෝමියා මදුරුවාගේ බිත්තර සාමාන්‍ය මදුරුවාගේ බිත්තර මෙන් නොව කෙළවරින් කෙළවරට සම්බන්ධයි. **'අකිංසකාකුලස් මදුරුවා'** වරකට බිත්තර 100–120 දක්වා දමන නමුත් එකම රෝගයක්වත් බෝ නොකරයි. මනුෂ්‍ය රුධිරය උරාබීම නම් මේ කොයි මදුරුවාටත් සාධාරණවූ ක්‍රියා කලාපයකි.

**වේ වර්ග**:=හුඹස් ගොඩනගා ඒවාට වුවමනා දේ සපයන වේයෝ විශෙෂ කොටස් දෙකකට බෙදෙත්. එනම්:- i ගොඩනැගිලි විනාශ කරන්නෝද, ii ගස් කොළන් විනාශ කරන්නෝද වෙත්.

ගස් කොළන් විනාශ කරන වේයන්ගෙන් **'කෝප්ටොටර්මීස්'** නම් වර්ගය මුල්වල මාර්ගයෙන් පැලෑටිවලට අනතුරු කරත්. මේ වර්ගයේ වේයන්ගෙන් පොල්ගසට සිදුවන අනතුර ඉතා බලවත්ය. මේ සත්තු කොතරම් රහස් අන්දමින් පොල්ගසට අනතුරු සිදුකරත් දැයි කිවහොත් ගස් මැරෙනතුරු දැනගන්ට නොලැබේ. මොවුන්ගෙන් සිදුවන උපද්‍රව මැඩලීමේ දුෂ්කරතාවය නම් උන්ගේ කූඩු තිබෙන ස්ථාන සොයා ගැනීමේ අපහසුවයි.


**"කැලොටර්මීස්"** නම් වර්ගය උත්. ආශ්‍රය කරන වෘක්ෂ යන්හි අරටුවල කූඩු සාදත්. මොව්හු ගස්වල දිරායන අතු ආදියේ අරටු ලඟින් ගස තුළට පැමිණෙත්. මොවුන් වඳ කිරීමට දැනගෙන තිබෙන ඉතා හොඳ ක්‍රමය නම් ඔවුන්ගේ කූඩුවලට **'පැරිස් ග්‍රීන්' කුඩු** සවල්පයක් ඉසීමයි. මේ කාරුණු සල කා බලන කල්හි වේයා පස පෙරළාදීම් වශයෙන් පමණක් ගොවියාට ප්‍රයෝජනවත් වූ නමුත් ලඞකාවේ බෝගවර්ග වලට උපද්‍රව කරන්නන්ගේ ප්‍රධානියා වෙයි.

**කුරුමිණි වර්ග:**-මොව්හු ගස් කුරුමිණි, ගොම කුරුමිණි, චීවල්ස් කුරුමිණි, වර්ග්ලිග් කුරුමිණි ආදී වශයෙන් රාශියක් වූ නමුත් එකම ගොත්‍රයකි. මෙහි දැක්වූවන්ගෙන් **ගොම කුරුමිණියා** කාටත් පාහේ නිතර දකින්ට ලැබෙන සතෙකි. මේ සතාගේ ස්පර්ශ කුන්තල කොටය, හිරමන තලයක් වැනි දැති සහිත හොස්සෙහි තුඩෙන් ඈන ගොම පිඩු කඩාගෙන අනික් කකුල් වලින් ගුළිකොට සාදාගන්නා ගොම බෝලය උගේ ආහාරයයි. මේ ගොම බෝලය සම්බන්ධව කාරුණු සවල්පයක් මෙහිදී කියනු කැමැත්තෙමි. කුරුමිණියා මේ ආහාරය ඉතා මහන්සියෙන් සාදා පෙරළාගෙන ගොස් සුදුසු තැනක වළක් සාරා එහි කෑම බෝලයත් සමග ඇතුල්ව සති දෙකක් පමණ ගතවනතුරු රෑදවල් දෙකේම හිඳගෙන එය කන්නේය. මේ සතා ගොම බෝලය පෙරළන්නේ සමතලා පාරකම නොවේ. කන්දක් උඩට වුවත් උඟ එය කොයි ක්‍රමයකින් වේවා පෙරළාගෙන යයි. මෙසේ පෙරළාගෙන යනවිට කකුල් ලිස්සීමෙන් හෝ වෙනයම් අන්දමකින් හෝ බෝලය ආපසු පහළට පෙරළුනොත් උඟ එය අතහැර ඉවත යන්නේද නැත. උඟට කන්දක් උඩකින් යන්ට උනිනම් නැවත නැවතත් කන්ද උඩටම බෝලය පෙරළන්නේය. **'උත්සාහශ ජයගනී'** කීවාක්මෙන් කුරුමිණියාගේ උත්සාහයද නිෂ්ඵල නොවේ. මේ දකින ළමයින් ටද මේ කුඩා සතාගේ උත්සාහය යස පාඩමක් වෙයි. මේ සතා වෙහෙසෙන තෙක් කන්දක් උඩට බොලය පෙරළීමට තැත්කොට නොහැකි වූවොත් අනික් මාර්ගයකින් යන බව නොයෙක් විට දක්නට ලැබේ. ගොම කුරුමිණියාගේ කූඩුවත් දිය ලබුගෙඩියක හැඩහුරුකම ඇති ගොම බෝලයකි. නමුත් පෙර කියන ලද වටකුරු කෑම බෝලය නොවේ. උඟ මනුෂ්‍යයාට අනතරායකාරී සතෙකු නොවෙනු පමණක්නොව එක් අතකින් මනුෂ්‍යයාට ප්‍රයෝජනවත් සතෙකි. ඒ ප්‍රයෝජනය නම් ගෙමිදුල්වල එකතුවන කුණු කසල ගුළිකොට ගෙන යාමයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ගොම කුරුමිණියා මෙසේ නමුත් ගස් කුරුමිණියා මීට හාත් පසින් වෙනස්ය. මේ සතා බාලකාලයේදී එනම් කඳ පණුවා කාලයේදී ඇස්නැති, කන්නෑසෙන, ගඳ, සුවඳ නොදැනෙන එකෙක් නමුත් වටදහයක් දෙළහක් මහතැති කොස්ගසක් හෝ දෙල් ගසක් හෝ සති ගණනකින් විනාශ කරන්ට පුළුවන්වූවෙකි. මේ සතාගේ හොස්සෙහි අවගාර දෙකක් මෙන්වූ අවයවයෙන් ලීය හාරාගෙන ඇතුලට වැදී ඉඳ නොයෙක් නොයෙක් අතට කා ගෙන යාමෙන් අවුල්වූ පාරවල් ගසතුල සෑදේ. ටිකින් ටික ගස තුල වැඩෙන මේ කඳපණුවා කුරුමිණියෙක්වී ගසෙන් පිටවී යාමට අවුරුදු තුණක් පමණ කල්ගත වෙයි. තමා ගසෙන් පිටවන්නේ කුරුමිණියා වීමෙන් පසුව නම් "කුඩා කාල සිදුරෙන් ඇතුල්වූ මම වැඩී කුරුමිණියෙක්වී කෙසේ පිටවෙම් දැයි" කල්පනා කළාක් මෙන්ද කිසි සංඥවක් නැතුවා මෙන්ද සිටී. මේ කඳපණුවා මෙතැන්හිදී නුවණැත්තෙකුලෙස ක්‍රියා කරයි.

5. රූපය.



ගස් කුරුමිණියා.


ඒ ගැන කරුණු සවල්පයක් මෙහිදී ප්‍රකාශ කරනු ලැබේ. ගසේ කඳමැද දක්වා හාරාගෙන ගොස් එහි වාසය කරන මේ පණුවා කඳේ පොත්ත දක්වා අළුත් සිදුරක් සාදයි. මේ වනාහි අනතුරය අවස්ථාවකට මුහුණ පෑමකි. පොත්ත දක්වා ඇවිත් සිටින සඳපණුවෙක් **කොට්ටෝරුවෙකුගේ** ප්‍රිය ජනක ආහාරයකි. මේ අනතුර ගැන කම්බිපණුවා නොසැලකුයේ මන්ද? මතු අනාගතයේදී ළඟ කුරුමිණියාවූ පසු ගසෙන් පිටවීම පිණිසයි. මේ සිදුර සාදා නොගත්තොත් කඳපණු අවස්ථාවේදී සාහසික ක්‍රියාකාල ඔහුට කුරුමිණි අවස්ථාවේදී ගසතුළම මිය යන්ට සිදුවේ.

**වීවල්ස් කුරුමිණියා:-** ඉතා කුඩාය. ධාන්‍යවල හෝ පැලෑටි වල සිදුරු සාදා, ඒවායේ බිත්තර දමයි.

**වර්ග්ලිග් කුරුමිණියා:-** කුඩා සිදුරුවල වැඩෙන මොවුන්ගේ තුඩ ඉතා දිග නිසා පහසුවෙන් ඇඳින ගතහැක. මොව්හුද කුඩා සිදුරුවල වැඩෙති


මේ හැර අපට තවත් විශෙෂයෙන් දැනගත යුතුවූ **කුරුමිණි** දෙවර්ගයක් සිටිත්. කොසෙල් පොල් යන දෙවර්ගයට **අනතුරුය** පමුණුවන මේ දෙදෙනා නම් කළුකුරුමිණියා හා රතු **කුරුමිණි** යාය. 6 වෙනි 7 වෙනි රූප සටහන් වලින් පෙනේ.

6. රූපය.



රයිනො සිරස් හෙවත්
**කළුකුරුමිණියා.**

7. රූපය.



රෙඩ් බීට්ල් හෙවත්
**රතු කුරුමිණියා.**

අවශෙෂ කුරුමිණියන්ට වඩා සථූල ශරීරයකින් යුත් **හිසේ** අගක් ඇති කළු කුරුමිණියාගේ පාදෙක පලල්වූ **කෙඳිවලින්** යුක්තය. එය යමක් හෑරීමේදී යටට යාම සඳහා රෙඩු **ඉවත්** කරනු පිණිස ප්‍රයෝජනයි. තාලවර්ගයේ ගස්වල බඩෙන් **වෑස්** සෙන යුෂ, මල්, කොළ හා දළු ආහාර කොට ගන්නාවූ මේ **කෘමියා** ගොම ගොඩක හෝ කසල ගොඩක හෝ බිත්තර දමයි **රතු** කුරුමිණියාගේ බිත්තර දැමීම ප්‍රාණවත් වෘක්ෂ ග්‍රන්ථන අතරේය-හින්වූ සුදු පාටට හුරු මේ බිත්තර දින හතරකදි හෝ **පහකදී** පුපුරා පිළව් එළියට එති. පොල්ගසක් වුවත් විනාශ **කරන්ට** හැකි මේ පිළව් වෘක්ෂ ග්‍රන්ථන අතරේ ජීවත්වන්නෝ මාස **තුන** හතරක් ගියකල පොල්ගසේ කෙඳිවලින් කොෂය සාදාගෙන **සිට** සති දෙකකට පසු රතු කුරුමිණියෙක් බවට පැමිණ **කොෂයෙන්** පිටවේ. උරා බොන්ට පිළිවන් තුඩක් ඇති මේ කුරුමිණි **වර්ගයේ** ගෑණු සතාගේ තුඩ සිහින්ය. පිරිමි සතාගේ තුඩ මහතය.

**කුඹල් මැස්සා:–** තමන්ගේ පාඩුවේ වැඩකරන **අහිංසක** **සතෙක්වූ** මොහු මැටි හෝ මඩ අනා ගෙයක් සාදන බැවින් **කුඹලා** යන නම ලබයි. ඌ මේ ගෙය උණුසුම් තැනකම සාදයි. **සමහරවිට** ඌ එය ලිප ළඟම දුමේ ලීයක වුවත් සෑදීමට හය **නොවේ.**

මූංඇට තරම් පස්ගුළි ගෙනයමින් සාදන මේගෙය කුකුළු බිත්තර පළුවක් වැනි හැඩයකින් යුක්තය. සමහර කුඹල් කූඩුවල කාමර දහසයක් පමණද සමහරක එක් කාමරයක් පමණද ඇත. කුඹලා අහිංසක සතෙකු වුවත් උගේ පැටව් මස්කා ජීවත්වන්නන් බැවින් උඟ අපේ මිදුලේ හෝ ගෙවල්වල වසන කුඩා මකුළුවන් කැරැ පොතු පැටවුන් හා දලබුවන්ද අල්වා කූඩුවේ කාමරවල පුරවයි. ප්‍රථමයෙන් උඟ මකුළුවෙකු කූඩුවේ තබා ඊට උඩින් බිත්තරයක් දමා නැවතද මකුළුවන් පුරවයි. පැටවා එළියට ආපසු කාමරයක ඇති මකුළුවන් සියල්ලම කාදමයි. දින අටකින් දහයකින් පමණ මේ පැටවා සුදු සිනිඳු සේදනූල් කැට උරයක් (කොපුවක්) සාදාගනී ටික දිනකට පසු උඟ ඒ කොපුවෙන් එළියටවී පියාඹන් නේය

**රැබදුල්ලා:**– රාත්‍රි කාලයේදී තණ පඳුරු අතරේ ඇවිදින ශරීරය පිටිපස ආලෝකයක් ඇති කුඩා සතෙක්වූ රැ බදුල්ලාට ගොම්බෙල්ලන් මූර්ඡාකරවන විෂගතියක් ඇත්තේය. උගේ දළවලින් උඟ ගොලුබෙල්ලන්ට ඇන විෂ වගීයක් ශරීරගත කරයි. නමුත් උගෙන් මිනිසුන්ට අනතුරක් නැත. සම්පූර්ණයෙන් වැඩුන පසු පිරිමි සතාට පිහාටුත් පිහාටු වැසෙන කොපු දෙකකුත් ලැබෙන නමුත් ගැණු සතාට පිහාටු නොලැබේ. මේ සතාගේ ආරක්ෂාව පිණිස පාට කීපයකින් යුත් ලක්ෂණ හමක් තිබේ. දත් හෝ නිය නැති මේ කෘමියා මස්කා ජීවත්වන්නෙකි. උගේ ප්‍රධාන ආහාරය නම් ගොලුබෙල්ලෝයි. මේ සතා තමාගේ ඉතා සිහින්වූ තියුණු දළින් ගොලුබෙල්ලාට විද විෂ පතුරුවා උගේ ශරීරය ද්‍රවකොට එය උරාබොයි. මේ අන්දමින් බලනකල රැබදුල්ලා ගොලුබෙල්ලාගේ පරම සතුරෙකි. රැබදුල්ලාගේ ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ යන්ත්‍රය නිසා උගේ ශරීරය අග එක්තරා ආලොකයක් තිබේ. මේ කෘමියාගේ ශරීරයේ අග පිහිටි සුදුහුණු වැනි ද්‍රව්‍යයට වාතය ගැටීමෙන් මේ ආලොකය උපදී පිරිමි සතාට ආලොකය එකවරම නිවාගත හැකි නමුත් ගැණු සතාට එසේ කළ නොහැක.

**හීටෝප්ටිරික්ස්:**– (තේවලට වගහන ඉල් පණුවා) තේ ගස්වලට වගහන කෘමීන් හැටියට ලංකාවේ බොහෝ කලකසිට දනගෙන තිබෙන මේ සතා තේකොළ පමණක් නොව වගාකරනු ලබන අන්‍ය පැලෑටිවලද කොළ කන්නේය. අන්දම් මාරුකරන අනික් කෘමීන්ට මෙන් මොවුන්ටද අවස්ථා හතරකි. අවසාන අවස්ථාව එනම් සම්පූර්ණ අවස්ථාව ගැණු පිරිමි යන දෙපක්ෂයේ හැටියට මහතෙන්ද, පාටින්ද වෙනස්වේ. ගැණුසතා දුඹුරුපාටට හුරු කහපාටය. ඉස්සරහ අත්හැඳිවල හරහට කළු ඉරක් තිබේ.

**ජීවිත කථාව:-** තේ පඳුරේ මැදහරියේ තිබෙන මෝරනලද කොළවල උඩපැත්තේ ලනලද බිජු දසදිනකින් පමණ බිදීගිය පසු රිදීපාටට හුරු කුඩාදලඹු පැටව් කොළවල යටපැත්තටවී හිඳිති. හැවදැම්මාට පසු මොව්හු තේ දළු අතරට පැමිණ කොළදෙකක් හෝ වැඩි ගණනක් යාකොට මැද ආවරණයක් කරගෙන දවල් දවස එහි සැඟවී හිඳ රාත්‍රි කාලයේදී පිටතටවිත් කොළකෑමට පටන් ගනිත්. මේ පණුවෝ තේකොළ එතනින් මෙතනින් කෑමෙන් තේ ගසට බොහෝ අනතුරුය කරත්. දළුවද නරක් කරත්. සති හතරකින් හෝ පහකින් දලඹු අවස්ථාව පසුකර .සම්පූර්ණව වැඩී ඉහත සඳහන් කරනලද කොළකොෂ බැඳගෙන සතියකට පසු කාවෝ (සමනළයෝ) පිටවෙත් මේ සමනලයා සතියක් කල් ජීවත්ව සිට මැරියයි මොවුන් වඳකිරීමට නම් කහපාටවූද, කළුපුල්ලි ඇතිවූද බිත්තර ගොඩවල් පමණක් එකතුකොට පුළුස්සා දැමිය යුතුයි. දිලිසෙන සුදු බිත්තරවල දලඹුවන් නැති බැවින් ඒවා විනාශ කිරීමෙන් පලක් නැත

මේ සතුන් විසින් අනතුරුය කරනලද ගස්වල ගණන සුවල්පය නම් තුවාලවූ කොළ පමණක් කඩා එවලේම පුළුස්සා දැමිය යුතුයි. ඉඩමේ විශාලලෙස මේ කෘමි වසංගතය පැතිර තිබේනම් තේ පඳුරු අතු කොටවෙන්ට මුදුනෙන් කපාදමා ඒ කපනලද අතු රිකිලි එවෙලේම පුළුස්සා දැමිය යුතුයි.

**කෙසෙල් ගස් ගුල්ලා:-**

සියලුම වර්ගවල කෙසෙල්ගස්වලට අනතුරුයකරන කුරුමිණි යෙක්වූ මේ වර්ගයේ ගැණු සතා කෙසෙල් පැලවල දලුගොබේ (කරටිය) තුළ කුඩා සිදුරුසාදා එහි බිත්තර දමයි. දින පහකින් හෝ හයකින් බිජුවෙන් පිටවන පණුවා ගොබයතුළ පහළට කාගන ගොස් පිටින්එන අනතුරුය කාරී කුහුඹින්ගේ ගමන නැවැත්වීමට තමා විදගන ආ කුහරය තණකොළවලින් වසාදමයි. පණුවා ලොකුවන අතරම මේ කුහරයද ලොකුවෙවී යන නිසා ගස වැඩීමට වුවමනා රසය ගහදිගේ යාම නැතිවීමෙන් පැලය වේලී මැරියයි. මේ පණුවා ගසතුළම ඉඳීමෙන් කුරුමිණි අවස්ථාවට පැමිණෙන නමුත් පියාඹා නොයයි. ලඹ මාස පහේ සිට අට දක්වා ජීවත් වේ. දවල් කාලයේ සැඟවී සිටින මොව්හු රාත්‍රියේදී කෑම සොයා යති.

**බෝවීයාම හා අනතරාය කිරීම වැලැක්වීම:-**

I කෙසෙල් සිටවනලද පරන ඉඩම් හොඳකාර සීසා (පස පෙරළා) කෙසෙල් මුල් හා කඳන් අස්කිරීමද, නැවත පැල සිටවීමට පෙර පස දිරීමට කල් ඇරීම, එක්කෝ අන්‍ය බෝග වර්ගයක් සිටවීමද කළ යුතුය.

II අළුතෙන් පැල සිටවීමේදී ගුල්ලෝ සිටිත්ද යනු හොඳින් සොයාබලා සිටුවීම යුතුය. කෘමින් ඉන්නා කෙසෙල් පැල කෑලිවලට කපා පුලුස්සා දැමිය යුතුයි.

III කෙසෙල් පැල මුල්වලින් උදුරාගත්කල මුල් ළඟම තිබෙන්ට හැරියේ නම් මුල්වල ඉන්නා කුරුමිණියන් හා ගුල්ලන් පැලය තුළට වදින්ට පුළුවන් බැවින් උදුරාගත් පැල රැයක්වත් එසේ තිබෙන්ට නැරිය යුතුයි.

IV පරණ කෙසෙල්කඳන් හා මුල් වත්තේ තිබෙන්ට ඇරීමෙන් කුරුමිණියන්ගේ බෝවීම ශීඝ්‍රවන හෙයින් එසේ නොතිබන්ට වග බලාගත යුතුයි.

**4 කෘමි වසංගත ඇතිවන ක්‍රම හා ඒවා මැඩලීමේ ගුරුකම්:-**

1 කැලෑ එළිකිරීම
2 කෘමින්ගේ සතුරන් විනාශ කිරීම.
3 විශාල ප්‍රදෙශයක එකම වර්ගයේ පැලෑටි වැවීම.
4 එකවර්ෂිජීවි පැල වැවීම.
5 අක්‍රමවත්ලෙස ගොවිතැන් කිරීම
6 කෘමීන් පිටරටින් ගෙන්වීම
7 පැලෑටීන් වැඩීමේ ශක්තිය උනන්දු නොකිරීම යනමේවා කෘමි වසංගත ඇතිවීමේ හේතුවෙත්.

**විනාශ දායක කෘමීන් වඳ කිරීමේ ගුරුකම්:-**

මනුෂ්‍යයාට ප්‍රයොජනය ඇති පැලෑටීන්ට කෘමීන්ගෙන් සිදුවන අනතුරු බොහෝ බැවින් ඒවා මැඩලීමේ ක්‍රම අවශ්‍යයෙන් දැනගත යුතුව තිබේ. මීට කෘෂිකාර්මික ක්‍රම සහ යාන්ත්‍රික ක්‍රම ඇත්තේය. අතින් අල්ලා දැමීමෙන්ද, ගිනිගොඩවල් ගැසීමෙන්ද, දැල්වල මාගීයෙන්ද, දුම් ගැස්වීමෙන්ද මොවුන් විනාශකළ හැකිය.

යුෂ උරබොන වර්ගය නැති කිරීමට විෂබීජ නාශක ඖෂධ වනී යෙදිය යුතුයි. පැලෑටි උකුණන්ට කාර්බලික් යෙදීම යහපති. මෘදු සමක් ඇති කෘමීන්ට කසායක් සාදාගෙන ඔවුන් ඇඟ තැවරෙන සේ විදිය යුතුයි.

**ඒ සාදාගන්නා ක්‍රමය:-** දුම්කොළ නැටි රාත්තලකට වතුර ගැලොමක් වත්කොට තම්බා යුෂය ගෙන බාර්සෝප් රාත්තල් කාලක් දමා කලවම් කොට බෝතලයකට වත්කොට තබා ගැනීමෙනි.

නවත් භූමිතෙල් සහ සබන් මිශ්‍රණයද මේ ගැන යහපත්ය. එනම්:- සබන් රාත්තල් බාගයක් ගෙන වතුර ගැලොමකට දමා උණුකොට ඊටපසු භූමිතෙල් ගැලොම් දෙකක් දමා කිරි පාටවූ පසු පැලෑටියේ ශක්තියට අනුව 1ට 10-20 දක්වා වතුරයොදා ඉසීම කටයුතුයි. කොළවලට ඉසිනකල 1 ට 40-60 දක්වා වතුරයෙදීම සෑහේ. මෙයින් කුඩා කෘමීන්ගේ ආශ්වාස සිදුරු වැසේ.

**සපාකන කෘමීන් වඳකිරීමේ ගුරුකම්:-**

'පාෂාණම්' රාත්තල් 1-4 දක්වා ගෙන වතුර ගැලොම් 50 කට දියකොට කෘමීන්ගේ ශක්තියට අනුව අඩුවැඩි කොට කොළවලට ඉසිය යුතුයි.

පලගැටි, දලබුවන් වැනි සතුන්ට 'පාෂාණම්' ස්වල්පයක්ද සීනිද ගෙන වතුරේ දියකොට පරළු සමග මිශ්‍රකොට ඝන නෙත් දෙයක් සාදා කොළවල තන්හි තන්හි තැබීම කළයුතුයි. **'පැරිස්ග්‍රීන්'** රාත්තලක් වතුර ගැලොම් 50 ට යොදා සාදාගත් මිශ්‍රණයද මේ සඳහා යොග්‍ය වේ.

ගෙන්දගම් කුඩු ඇඟතැවිරෙන්ට ඉසීමෙන්ද, කෘමියා මත්භාව යට පැමිණ විනාශ වන්නේය. ගෙන්දගම් කුඩු සියුම් රෙදි කැබෙල්ලක බැඳ කෘමියාගේ ශරීරයට වැටෙන්ට සෙලවිය යුතුයි. මේවා ඉසීම ඉරපායන්ට ප්‍රථමයෙන්ද වෂීාවට අසුනොවනසේද කළොත් ප්‍රයෝජන වේ.

**5. ජලජ කෘමි:-**

ගොඩ වාසයකරන කෘමීන්ගෙන් පිටත්වූ ජලයෙහි වාසය කරන අන්‍යකෘමීන් ස්වල්පදෙනෙකු ගැනද, මෙහිදී සාරාංශ දක්වනු ලැබේ. දිය කුරුම්ණියා, මඩරුල්ලා, දියහිරියා, යනාදී වශයෙන් ව්‍යවහාර කරනු ලබන මේ කෘමීහු ජලජ කෘමීහු යන නාමයෙන් හඳුන්වනු ලබත්.


**දිය කුරුම්ණියා:-** මේ සතාගේ පණු අවස්ථාව **'දිකරල්ලා'** නමින් හඳුන්වනු ලැබේ. උගේපාද කළු කුරුම්ණියාගේ පාදවලට වඩා කොටයි. පස්සා පාද හතරෙහිවූ ලෝමවැනි පැතලි කොටස පිනීමට උපකාර වේ. පිහාටු ඝන බැවින් පියාඹන්ට නොහැකිය. පිහිනීමෙහි අතිදක්ෂවූ මේ කෘමියා ඇවිදීමෙහිද දක්ෂයෙකි. උග

ජලය පත්ලේ බඩගායයි. මේ කෘමියාගේ පැටවුන්ගේ ශරීරයේ සට පාර්ශ්වයෙහි සියුම් ලෝම වැනි කෙඳි ඇති බැවින් ඔවුන් පහසු වෙන් හඳුනා ගතහැක.

**මඩරැල්ලා**:– අඟල් තුනක් හෝ හතරක් පමණ දිගැති මේ කෘමියාගේ ගාත්‍රාදෙකක් අඹුමෙන් පිළියෙලවී තිබේ. බොහෝ සෙයින් මඩෙහි ජීවත්වන බැවින් උගට මේ නම යෙදී තිබේ.

**දිය කිරියා**:– ජලය මතුපිට මදුරුවකු මෙන් ඒ මේ අත පියාසර කරන මේ සතාගේ පණු අවස්ථාව සාමාන්‍ය මදුරුවන්ගේ පණු අවස්ථාවට සමානයි. 8. 9. 10. රූපවලින් පෙනේ.

8. රූපය.




**දිය කුරුමිණියා**

9. රූපය.



**මඩරැල්ලා.**

10. රූපය.



**දියකිරියා.**

**නිගමනය.**

යම් රටක ගොවිකර්මාන්තය මනාසේ කෙරෙයි නම් එරට වැස්සෝ දිළිඳුවූවෝ නොවෙත්. අප පාඨශාලාවන්හි සාමාන්‍ය යෙන් උගන්වනු ලබන ග්‍රාමීය විද්‍යාව පිළිබඳ පාඩම්වලින් සම්පූර්ණ

පරමාණියකට පැමිණෙන්ට නම් ඒවා නිසිපරිදිම ශිෂ්‍යයන්ට පුහුණු කිරීම සෑහේ. කෘමිවර්ග සම්බන්ධ මේ ලිපියෙන් අදහස්කරන පරමාර්ථයත් අපේ පැලෑටින්ට උපද්‍රව කරන කෘමිවර්ගයන් සහ ඔවුන්ගේ වැඩීමට අදාළවන කරුණුත් දැන ඒවා විනාශ කිරීමත්, අපට ප්‍රයෝජනවත් කෘමිවර්ගයන්ගේ වැඩීම වර්ධනය වනාකාර කටයුතු කිරීමත් වේ.

සෑම පාඩමක් පිළිබඳ කරුණු ශිෂ්‍යයන්ගේ නිරීක්ෂණයට හා පරීක්ෂණයට භාජන කරවා ඒවා සම්බන්ධ මනා දැනීමක් තම ශිෂ්‍ය සින්ට ඇතිකිරීම සියලු ආචාර්යවරයන්ගේම යුතුකමක් හෙයින් මේ පාඩම්වලින් සෑහෙන ප්‍රතිඵල ලබාදීමට උත්සාහ කරනලෙස ඉල්ලමින් ලිපිය මෙයින් අවසන් කරමි.

දෙද්දුව ආණ්ඩුවේ බාලිකා පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍ය
**ඩී. කේ. ජ්. වික්‍රමාරච්චි මහත්මිය විසින්**
සම්පාදනය කරන ලදී.

# ක්‍රීඩා මාර්ගයෙන් ඉගැන්වීම.

මෙහි ඉගැන්වීම යනුවෙන් අදහස්කරනු ලබන්නේ පාඨශාලා පිළිබඳ අධ්‍යාපනයයි. මෙම අධ්‍යාපනය ඊට මහෝපකාරීවූ අධ්‍යාපන උපක්‍රම රැශියක්පිට රඳා පවතී.

මවිසින් මේ මාතෘකාවෙන් ඉදිරිපත්කළ ක්‍රීඩා මාර්ගයෙන් ඉගැන්වීමද, එයින් එක් උපක්‍රමයක් බව සැලකිය යුතුයි. මෙහි ක්‍රීඩා යනුවෙන් ශාරීරික, ක්‍රීඩාම පමණක් නොව ශාරීරික මානසික, වාචික පිළිබඳ ක්‍රීඩාත්‍රයම බව මෙහිදී මතක්කරනු කැමැත්තෙමි. මෙය අප අතර බොහෝ අමතක කොට හරිනලද කාරණයකි. කොතරම් අමතකකොට තිබේද යතහොත් අවශ්‍ය ස්ථානයන්හිදී පවා එය ක්‍රියාවෙහි නොයොදනු ලැබේ. කාලයක්තුළ එසේ අමතකවීම නිසා වර්තමන්කල අපට මෙය අභිනව ඉගැන්වීම් ක්‍රමයක් හැටියට වැටහේ. එම නිසාම මෙය ක්‍රියාවෙහි යෙදීම මහත් කරදරයක් මෙන්ද, සලකති.

පාඨශාලාවකට ඇතුල්වන්නාවූ ශිෂ්‍යා පාඨශාලා ජීවිතය සම්බන්ධයෙන් ප්‍රථම බාලාවස්ථාව, ද්විතීය බාලාවස්ථාව, ප්‍රථම ළමා කාලය, අන්තිම ළමාකාලය යයි අවස්ථා සතරකට බෙදිය හැකිය.

මෙ අවස්ථා සතරෙහිම ළමයින්ට පාඨශාලාවේදී උගන්වන සියලුම පාඩම් ක්‍රීඩා මාර්ගයෙන්ම ඉගැන්විය යුතුයයි. වර්තමන්කල අධ්‍යාපන ශාස්ත්‍රඥයෝ කියති. ක්‍රීඩා මාර්ගයෙන් තොරව ඉගැන්වීමෙන් ළමයා ලබන දැනීම අසම්පූර්ණවූවකි. මේ ගැන අත්හදා බලා පලපුරුදු ගුරුවරු මෙහි සත්‍යතාව දනිති. මෙය කළ නොහැකි වැඩකැයි සමහර ආචාර්‍ය්‍යවරුන්ට සිතන්ට පුළුවන. එය වැරදි අදහසක් බව මෙය අත්හදා බැලූ වහාම වැටහී යනවා ඇත.

මවිසින් මෙහි ප්‍රථම බාලවස්ථාව යනුවෙන් නම් කරන ලද්දෑහු පහළ බාලාංශයේ ළමෝ වෙති. මෙකල ළමයින්ගේ සංඥාව බලවත්ය. ඔව්හු යම් යම් දේ සිතා බලා කිරීමට අසමත්හුය.

නිතර සවච්ඡයෙන්ද, ක්‍රීඩායෙන්ද, කාලය ගත කිරීමට කැමැත්තෝය. සවභාවය විසින් ළමයින්ට ගිම්කර දී තිබෙන මේ ක්‍රියාකාරීත්වයට අවහිර පැමිණෙන සේ ඉගැන්වීම කිසිම අධ්‍යාපන ශාස්ත්‍රඥයෙක් බලාපොරොත්තු නොවේ. බාලාවස්ථාවෙහි වූවන් වෙත වැඩ පැවරීමෙන් සවභාවයට විරුඬලෙස බාලකාලය ගත කරන්ට ඔවුන්ට සිදු වේ. එසේ කල බාලයා වෙත තිබෙන සවාභාවික ගුණයෝ අසම්පූර්ණව වැඩෙති. නොහොත් සම්පූර්ණයෙන් අතුරුදන්වෙති. එබැවින් මේ අවස්ථාව මතු පැමිණෙන වැඩ පිළිවෙළකට ළමයින් සූදානම් කිරීම විනා එබඳු දෙයක ආරම්භය නොවන බවද ඔවුන්ගේ ඉන්ද්‍රියයන් දියුණුවන අවස්ථාව මෙය බැව්ද සලකා සපර්ශ, චක්ඛු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිහ්වා, යන පඤ්චෙන්ද්‍රිය යන්ගේ විශෙෂ දියුණුවක් ඇති කිරීම උවමනායි පාඨශාලාවේ දී ඔවුන්ගේ වැඩවල පරමාර්ථයද විය යුතුයි

දැනීම ලබාගැනීමේ ප්‍රධාන මාර්ගය පොතේ පාඩමක් කියවීම හා ගල්ලෑල්ලේ යමක් ලිවීම යයිද ඇතැම් ගුරුවරයන්ගේද බොහෝ මව්පියන්ගේද, විශ්වාසයයි. මෙයම සත්‍ය කිරීමට ගුරුවරයා තවත් රුකුල් දුනහොත් සවභාවික ලොකයෙන් දැනීම ලබාගැනීමට තිබෙන ශතසහස්‍ර ක්‍රමයෝ බාලයන්ගෙන් ඈත්වෙති. කියවීමෙහි හා ලිවීමෙහිම පමණක් යෙදීමෙන් ළමයින්ගේ සියලු අභිවෘඬිය සැලසෙන්නේ යයිද ඇතැම් මව්පියන්ගේ අදහස ඇතත් බාලාවස්ථාවෙහි සවභාවය බාලාවස්ථාව හා නොගැටී නිඃසාරව පසුවීම අනාගත දියුණුවට බාධාවකි.


මේ කාලයේදී ශිෂ්‍යයන්ගෙන් ක්‍රමවත් වැඩ පිළිවෙළක් බලාපොරොත්තුවීම ප්‍රඥ ගොචර නොවේ. ඒ නිසා ශිෂ්‍යයා ක්‍රමවත් වැඩ පිළිවෙළකට සූදානම් කරනුවස් පාඨශාලාවේදී සියලුම පාඩම් ක්‍රීඩාවන් වශයෙන් ඉගැන්විය යුතුයි. කිසිම පාඩමක් ක්‍රීඩාවෙන් තුරන්කළ යුතු නොවේ. එසේ ක්‍රීඩා මගින් ඉගැන්වීමට පිළියෙල කළ පාඩම් මාලාවක් නිදර්ශන වශයෙන් මෙහි පහත දැක්වේ.

ක්‍රීඩාව :– බෝල සෙල්ලම

ප්‍රමාණය:– පහළ බාලාංශය.

ඉන් ගුරුවරයා උගන්වන පාඩම්.


## 1. පාඩම:- ගණන් කිරීම.




පළමුවෙන් ගුරුවරුයා පඞ්ක්තිය වටේට තබා තමා මැද සිටගෙන ළමයින්ට බෝලය වීසිකරමින් ඔවුන් බෝලය අල්ලන වාරගණන එක, දෙක, තුන, යනාදී වශයෙන් ළමයින් ලවා ගණන් කරවිය යුතුයි. මෙහිදී ළමයින් නොදැනුවත්වම ඔවුන්ට ගණන් කිරීම පුරුදු වේ.

---

## 2 පාඩම :- ගණන් විග්‍රහය.




ඊළඟට ගුරුවරයා ළමයින් පෙළට තබා ඉදිරියට බෝලය වීසිකළ යුතුයි. එවිට ළමෝ බෝලය ඇහිදීමට දුවත් එකිනෙක ළමයා ඇහිදින වාර ගණන ගණන් කරමින් බෝලය ඇහිදීමට සැලැස්විය යුතුයි. මෙසේ කීප වාරයක් කළපසු ගුරුවරයා ඔවුන් ඉදිරියට ගොස් ලීලාවතී ගෙනා වාර ගණන කීයද?!යනාදී

වශයෙන් ප්‍රශ්නකළ යුතුයි. ඔවුන්ගෙන් ලැබෙන නිවැරදි උත්තර ගෙන ඒවා එකතුකොට කීමට සැලැස්විය යුතුයි. මේ විධියට මෙසින් එකතුකිරීම, අඩුකිරීම, පිළිබඳ ගණන් විග්‍රහයන් ළමයින්ට පුරුදු වේ. (මේ අවසථාවේදී ගුරුවරයාට ඈණ ලෑල්ලද පාවිච්චිකළ හැක.)

---

### 3. පාඩම :- කථාන්තර.

අපි මිදුලේ බෝල සෙල්ලම් කළා, සෙකෝලෙ හාමිනේලාද බෝල සෙල්ලම බලාසිටියා. සෙකෝලෙ මහත්වරුද බෝල සෙල්ලම බලාසිටියා, අපි බෝල සෙල්ලම් කළා, අපි හෙටත් බෝල සෙල්ලමට එනවා.

---


### 4. පාඩම :- කළුලෑල්ලේ කියවීම.

## අපි බෝල සෙල්ලම් කළා.

---

### 5. පාඩම :- ගල්ලෑල්ලේ ලිවීම.

කළුලෑල්ල



බෝලය.

---

### 6. පාඩම :- කවි.

ප්‍රීති බෝ ප්‍රීති බෝ—යන්ට යමු මෙදා
බාල මෙඅපි ළමයි සැවොම බෝල සෙල්ලමේ, බෝල සෙල්ලමේ.

මවිසින් මෙහිදී පෙන්වන ලද්දේ එකම ක්‍රීඩාවෙන් පාඩම් කීපයක් උගන්වාගෙන යාහැකි පිළිවෙළය. පාඩම් අවසානය දක්වා ක්‍රීඩාවේ ප්‍රීතිය ළමයින් තුළ තිබෙන බැවින් ඔව්හු නොදැනු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල

වත්වම ක්‍රීඩාභිලාෂයෙන් ප්‍රීතියෙන් වැඩෙහි යෙදෙත්. ගුරුවර යාටද පහසුවෙන් ප්‍රීති සහගත සිතින් ළමයින්ට දැනීම දීමේ අදහස ඉටුකරගත හැකිය.

ඊළඟට විතීය බාලාවස්ථාව යනුවෙන් අදහස් කරන්නෝ ඉහළ බාලංශයේ ළමෝ වෙති. මෙහිදීද පහළ බාලාංශයේදී මෙන්ම සියලුම පාඩම් ක්‍රීඩා මාර්ගයෙන් ඉගැන්වීමට පිළියෙල කරගත යුතුයි. නමුත් ඒ ඒ සියලු පාඩම්වලදීම පහළ බාලාංශයේ ළමයින්ට වඩා උසස් දැනීමක් ඇතිකළ යුතු බව ගුරුවරයා සිත්හි තබාගත යුතුයි

දැන් ඊළඟට ඇත්තේ ප්‍රථම ළමාකාලයයි. මෙයින් අදහස් කරනු ලබන්නෝ පාඨශාලාවල දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි, පස්වෙනි, යන ප්‍රමාණවල ළමෝ වෙති. මේ කාලයෙහිදීද සියලුම පාඩම් ක්‍රීඩා මාර්ගයෙන් ඉගැන්වීම ප්‍රඥා ගෝචරයි. ගුරුවරයා පාඩම් ඉගැන්වීමට කලින් මේ ගැන ප්‍රයත්නයක් දරන්නේ නම් අවස්ථානු කූල පරිදි කිසි අපහසුවක් නැතුව සියලුම පාඩම් ක්‍රීඩා මාර්ගයෙන් ඉගැන්වීමට යොදාගත හැක. මෙකී පන්තිවලට සුදුසුසේ පිළියෙලකළ පාඩම් සම්බන්ධ නිදර්ශන කීපයක් මෙහිදීද දක්වනු ලැබේ.

---

### 1. ක්‍රීඩාව :- බඩු වෙන්දේසියක්.

ගුරුවරයා බඩු කීපයක් මේසය උඩ තබා ළමයින්ගෙන් කෙනෙක් වෙන්දේසිකාරයා විධියට තෝරාගත යුතුයි. ගණන් තබන්නන් වශයෙන් එක්කෙනෙක් හෝ දෙන්නෙක් ඉදිරිපත් කළයුතුයි. ඊටපසු වෙන්දේසි කාරයා ලවා වෙන්දේසිය පිළිබඳ නීති කියවීමට සැලැස්විය යුතුයි. බඩු විකිණීමේදී විකිණෙන බඩුවලට ගණන් තබන්නන් ලවා බඩුගත් එකිනෙක අයට වෙන වෙනම බිල් සෑදවිය යුතුයි. බඩු ගත් අය ලවාද තම තමන් ගත් බඩුවලට වෙන වෙනම බිල් සාදාගැනීමට සැලැස්විය යුතුයි. ගණන් තබන්නන් සෑදූ බිල් තමන් සෑදූ බිල්වලට හරිද කියා පරීක්ෂාකර බලා තමන් ගත් බඩුවලට යායුතු එම මුදල ගෙවා ගෙවූ බවට බිල්වල අත්සන් තබවාගෙන තම තමාට අයිති බඩු ගන්ට සැලැස්විය යුතුයි.

2. ක්‍රීඩාව :- නිධානයක් සෙවීම.
ප්‍රමාණය :- IV වෙනි ප්‍රමාණය.
පාඩම :- භූගෝල ශාස්ත්‍රය.

* පාඨශාලාවක ගුරුවරයෙක් අසල ගමක ගල්ලෙනක සඟවා තිබෙන නිධානයක් පිළිබඳ කථාවක් ශිෂ්‍යයන්ට කීවේය. ඒ ගැන ඇලුම්කල ශිෂ්‍යයෝ කණ්ඩායමක් සෑදී එය සොයන්ට නිශ්චයකර ගත්තෝය. ළමෝ පාසැලෙන් පිටත්ව ප්‍රසිඩපාර දිගේ ආරොග්‍ය ශාලාවක් පසුවනතුරු ගමන්කොට පොලීසිය ලඟ හන්දියට පැමිණියෝය. ඔව්හු එතැනින් නැගෙනහිර දෙසට ගමන්කොට තැපැල් කන්තෝරුව හා පල්ලිය පසු කළෝය. ඉන් ටිකක් ඈතට ගොස් දුම්රිය පාර මහපාර හරහා යන තැනකට ඔව්හු පැමිණියාහ. එතැනින් අඩිපාරක් විහිදෙයි. ඔව්හු ඉන් පිටත්ව පාලමෙන් එගොඩව පොල්වත්තක් පසුකොට පැට්‍රෝල් විකුණන තැනකට ආවෝය එතැනදී ඔව්හු කොටස් දෙකකට බෙදී එක් කාණ්ඩයක් කරත්තපාර දිගේ එක් ගල්විහාරය කට යන්ටද, අනික් අය උතුරුදෙසට යාමටද, නිශ්චය කර ගත්තෝය කරත්ත පාරදිගේ ගිය අය දගැබක් පසුකළ පසු ඒ මාර්ගය වගුරු බිමකදී කෙළවරවන බව දුටුවෝය. එය පසුකල ඔව්හු තේ වවා තිබෙන ප්‍රපාතාකාර කඳු බෑවුමක් පසුකොට ගල්විහාරයට ළඟාවූහ. එහිදී කිසිවක් සොයාගත නොහැකිව කඳුවැටිය දිග ගමන්කොට උතුරුදෙසට ගොස් පහසු පල්ලමක් දිගේ බැස මහපාරට අවුත් බටහිරට හැරී ගියෝය. පාරේදී පන්සලක් පසුකල ඔවුන්ට තව මංසන්ධියක් හමුවිය. ඔව්හු තව දුරට යන කල පාරේ පසක ජලාශයක්ද අනික් පැත්තේ වෙල් යායක්ද, දුටුවෝය මෙසේ ගිය ඔව්හු පාලමකින් එතරව දුම්රිය පාරක් හරහා ගොස් බෙහෙත් ශාලාවක් අසලට ආහ. එතනින් නිරිතට හැරුණු ඔවුන්ට රබර් වත්තක් දිගේ ගොස් නව ගල්විහාරයකට පැමිණෙන්ට පුළුවන්විය. එහිදී ඔවුන්ට නිධානය සොයාගෙන සිටින අනික් කාණ්ඩය හමුවිය. ඒ වනාහි පුරාණ චිත්‍රකම් හා කැටයම් සමූහයකි

මොවුන් ගමන්කල මාර්ගය සලකුණු කරවිය යුතුයි.

මේ ක්‍රමයෙන් වැඩවලට ළමෝ ඉතා ප්‍රීතියෙන් පෙළඹෙති. මෙසේ උගත්දේ බලවත්ලෙස සිතේ තහවුරු වේ.

---

* මෙහි සටහන්කර තිබුන සිතියම හැරදමන්ට විය.

ඊළඟට අනතිම ළමා කාලය යනුවෙන් අඟවනු ලබන්නෝ පාඨශාලාවල හය, හත, අට, යන ප්‍රමාණවල ළමෝ වෙති. මේ ප්‍රමාණවලදී ඉහතකී ප්‍රමාණවලට වඩා වෙනස්ව මෙම ඉගැන්වීම කළ යුතුයි. මෙතාක් දක්වන ලද ප්‍රමාණවල දී උගන්වන දෙය සිත්හි තහවුරු කිරීම් වස් ඉගැන්වීමේදී සියලුම පාඩම් ක්‍රීඩා මාර්ගයට හරවා ඉගැන්විය යුතු බැව් කියන ලදී. එහෙත් මෙම ප්‍රමාණවලදී කළයුතු වෙනස නම් ළමයින් තමන් උගත්දේ සවිරව සිත්හි තහවුරු වීමට සහ දියුණුවීමටත් ඔවුන් උගත් පාඩම් ඔවුන් ලවාම ක්‍රීඩා මාර්ගයෙන් දක්වීමට මග සැලැස්වීමයි. මීට නිදර්ශන වශයෙන් මේ පඩක්ති සඳහා පිළියෙල කළ පාඩම්, කීප යක්ද මෙහිදී ඉදිරිපත් කරනු ලැබේ.

1. ක්‍රීඩාව :- උමංදාවේ පුත්‍ර ප්‍රශනය ක්‍රීඩාවෙන් දක්වීම.
ප්‍රමාණය:- VI වෙනි ප්‍රමාණය.
පාඩම :- සාහිත්‍යය.


මෙහිදී ළමයින් විසින් තනිවම කියවා ඉගෙණගත් මේ පාඩම ක්‍රීඩා මාර්ගයෙන් දක්වීමට ගුරුවරයා අනුබල දියයුතුයි. මෙවැනි තන්හිදී සැලකියයුතු විශෙෂ කාරණයක් නම් ළමයින් නිදහස් ලෙස ක්‍රීඩාවේ යෙදෙනත් ගුරුවරයාගේ පාලනය ඇතිවිය යුතු බවයි. මෙහිදී යක්‍ෂණිය වෙනුවටද මැණියන් වෙනුවටද, මහෞෂධ පඬිතුමා ආදීන් වෙනුවටද ළමෝ සිටිති. දරුවා වෙනුවට බෝනික්කෙක් පාවිච්චි කිරීමට සැලැස්විය යුතුයි. ඊළඟට ළමෝ මව වතුර නෑ විධියත් යක්‍ෂණිය දරුවා ගෙනගිය විධියත් මව පස්සෙන් එළවාගෙන ගිය විධියත් දක්වීම් ආදී ක්‍රියාවල යෙදෙති. මෙසේ අනතිම දක්වාම ඔව්හු මේ පාඩම ක්‍රීඩාවෙන් දක්වති. නිතරම ගුරුවරයා ඔවුන් කරන අඩුපාඩු සම්පූර්ණ කරවිය යුතුයි. එයින් පාඩම හොඳින් සිත්හි තහවුරු වේ.

2. ක්‍රීඩාව :- සිට්ටු ඇදීම.
ප්‍රමාණය :- VI හෝ VII වෙනි ප්‍රමාණය.
පාඩම :- වාක්‍යරචනාව.

ගුරුවරයා ළමයින් එකිනෙකාට කුඩා කඩදාසි කෑබලි දෙක බැගින් බෙදා දියයුතුයි. ඉන් එකක නම තමන්ගේ නමද අනිකේ තමා කථා කිරීමට කැමති මාතෘකාවක නමක්ද, ලියන්ට සලස්වා ළමයින් දෙදෙනෙක් ලවා මාතෘකා වෙනමත් නම් වෙන මත් එකතු කිරීමට සැලැස්විය යුතුයි. ඒ ළමයි දෙදෙනා ලවාම ගුරුවරයා ඉදිරිපිටදී ගොඩවල් දෙකෙහි කඩදාසි වෙන වෙනම කලවම් කිරීමට සැලැස්විය යුතුයි. ගුරුවරයා එක් අතකින් මාතෘකා ලියූ කොළයක්ද, අනික් අතින් නම් ලියූ කොළයක්ද

ගෙන එම නම අයිති ළමයාට එම මාතෘකාව යටතේ විනාඩි කීපයක් කථා කිරීමට සැලැස්විය යුතුයි. නැවතත් මෙසේම කළ යුතුයි. මෙයින් වාක්‍ය රචනාව දියුණු වේ.

3. ක්‍රීඩාව :- බතල කොටුවක පැලට යාම.
ප්‍රමාණය :- Vii වෙනි ප්‍රමාණය.
පාඩම :- භාෂාව (ව්‍යාකරණ)




මෙහිදී පැල වෙනුවට මිදුලේ කොටුවක් ඇඳීමට සලස්වා ප්‍රථමා විභක්තිය යයි නම තබා ඊට ඈතින් එක ළඟ බතල කොටුව හවුල් කාරයන් දෙදෙනාගේ ගෙවල් වෙනුවට කොටු දෙකක් අඳින්ට සලස්වා ඉන් එක කොටුවකට කර්මවිභක්ති යයිද එහි සිටින ළමයාට කර්මයයිද නම් තබා එක ළමයෙක්ද, අනික් කොටුවට කර්තෘ විභක්ති යයිද එහි සිටින ළමයාට කර්තෘයයිද නම් තබා තව ළමයෙක්ද, සිටින්ට සලස්වා බතල කොටුවේ සිට හවුල්කාරයන් දෙදෙනාගේ ගෙවල් දක්වා පාරක් අන්දවා එම පාරට ක්‍රියාව යයි නම් කොට කර්මය නමැති ළමයාට පැලට යන්ට සැලැස්විය යුතුයි. පැල දෙදෙනෙකුට සිටීමට ඉඩනැති බැවින් අනික් හවුල්කාරයාවූ කර්තෘ කර්තෘ විභක්තියවූ සවකීය ගෙදරම සිටිනවා ඇත. කර්මය නොයන වේලාවට කර්තෘ නමැති ගෙයි ළමයා යනවා ඇත. එවිට කර්මය කර්ම විභක්තියවූ සවකීය ගෙදර සිටිනවා ඇත. මෙයින් ළමයින්ට කර්තෘ ප්‍රථමා විභක්තියට ගියවිට කර්මය කර්ම විභක්තියෙහිම බවද කර්මය ප්‍රථමා විභක්තියට ගියවිට කර්තෘ කර්තෘ විභක්තියෙහිම සිටින බවද ආදී වශයෙන් උක්තානුක්ත විධිය ගැන හොඳ දැනීමක් සිතෙහි තැන්පත් වේ.

4. ක්‍රීඩාව :- ප්‍රහේලිකාවක් සම්පූර්ණ කිරීම.
ප්‍රමාණය :- කනිෂ්ඨ.
පාඩම :- භූගෝල ශාස්ත්‍රය (ලංකාව)

මෙහි පහත පෙනෙන ප්‍රහේලිකාව ලඞ්කා භූගොල ශාස්ත්‍රය වෙනුවෙන් උගත් කාරුණු ඇසුරු කොට සෑදූ එකකි. ළමයින්ට මේ එකිනෙක කොලයක් බැගින් බෙදාදී සම්පූර්ණ කිරීමට සැලැස්විය යුතුයි.

---

## ප්‍රහෙලිකාව.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 දු | න් | හි | ද | ■ | 2 කො | 3 කෝ | වා | ■ | 4 කො | ප් | ප | 5 ර |
| ම් | ■ | ■ | ■ | 6 පි | ■ | පි | ■ | 7 හ | ■ | ■ | ■ | ජ |
| කො | ■ | ■ | ■ | 8 දු | රු | ■ | 9 බො | කු | ■ | ■ | ■ | ර |
| 10 ළ | නු | පැ | දු | රු | ■ | 11 හි | ■ | 12 රු | හු | ණු | ර | ට |
| ■ | ■ | ■ | ■ | ■ | 13 පා | නී | 14 මි | ■ | ■ | ■ | ■ | ■ |
| ■ | 15 වා | රු | ය | ■ | න | දු | හි | ■ | 16 ත | ල් | 17 රු | ■ |
| 18 කැ | ළ | ණි | වැ | ලි | දු | ම් | රි | ය | මා | ර් | ග | ය |
| ■ | 19 වේ | වැ | ල | ■ | ර | ක | ග | ■ | 20 ගා | ල් | ල | ■ |
| ■ | ■ | ■ | ■ | ■ | ය | න් | ම | ■ | ■ | ■ | ■ | ■ |
| 21 ක | ත | ර | ග | 22 ම | ■ | ද | ■ | 23 මැ | ද | ප | ලා | 24 ත |
| ලා | ■ | ■ | ■ | 25 හ | ල් | ■ | 26 දෙ | ණි | ■ | ■ | ■ | ල |
| වැ | ■ | ■ | ■ | ල් | ■ | 27 මු | ■ | ක් | ■ | ■ | ■ | වි |
| 28 ව | ට | ව | ල | ■ | 29 උ | කු | රු | ■ | 30 ස | ම | න | ල |

**හරහට.**

1. ප්‍රසිද්ධ දිය ඇල්ලක්, 2. දුම්බර ප්‍රසිද්ධ වැව්ල්ලක්, 4. වයඹ පළාතේ ප්‍රධාන වෙළඳ ද්‍රව්‍ය, 8. ඉන්දියාවෙන් ගෙනෙන කුළුබඩු වක්, 9. ගොඩට කාවැදුණුවරා, 10 පොල්කෙඳිවලින් තනන දෙයක්, 12. ලංකාවේ පුරාණ බෙදීමක්, 15. අඩිවීදය හා සමාන ජලකොටඨාසය, 16. ද්‍රවිඩයන්ගේ මද්‍යපානය, 18 ඉතාදිග පටු දුම්රිය මග, 19. කර්මාන්ත පිණිස ගන්නා වැලක්, 20. දකුණු පලාතේ නැව්තොටක්, 21. දකුණු පලාතේ, ප්‍රසිද්ධ දේවාලයක්, 23. ලංකාවේ කඳුවැඩි පළාත, 25. දුම්මල ලැබෙන ගස්වර්ගයක්, 26. පහත් බිම්, 28 දියබලයෙන් විදුලිය උපදවන්ට යන තැන, 29. තල්ගස් බහුල පළාත, 30. ලංකාවේ වැදගත් කන්ද.

**පහලට.**

1. යාපනේ ප්‍රධාන වැව්ල්ල, 3. දියුණුකළ හැකි වැව්ල්ලක් 5. පුරාණ ලංකාවේ විශාල බෙදීම, 6. ගව ආහාරයක්, 7. තාලවර්ගයේ ගස්වලින් උපදවන කෑමක්, 11, දකුණු පළාතේ කන්දක්, 13. චිත්‍ර දුම්රිය මගේ කෙළවරක්, 14. ප්‍රධාන දුම්රිය මගේ පළමුවන ගල්ගෙය, 15. දකුණු පළාතේ ප්‍රසිද්ධ ගඟක් 17. දුම්රිය මග කෙළවරක්, 21. යොධ ඇළ පටන්ගන්නා වැව, 22. ප්‍රසිද්ධ හිරගෙයක්, 23. වටිනා ඛනිජ වර්ගයක්, 24. රෝමානු ආගමේ ප්‍රසිද්ධ මඞ්ගල්‍ය පවත්වන දෙවස්ථානයක් පිහිටිගම, 27. මන්නාරම් වරායෙන් ලැබෙන අගනා දෙයක්.

මෙවැනි ක්‍රීඩාවලින් ළමයින් උගත්දේ මනාසේ සිතෙහි තහවුරුවීම සහ දියුණුවීම සිදුවන බව හොඳින් පැහැදිලි වේ.

මවිසින් පාඨශාලාවක සියලුම පාඩම් ක්‍රීඩා මගින් උගන්වන අයුරු මෙහි දක්වූයේ නොවේ. මෙහි ඉදිරිපත් කරණ ලද්දේ ක්‍රීඩා මාර්ගයෙන් උගන්වන පාඩම්වලිනුත් ඒ උගන්වන ආකාරයෙනුත් සවල්පයක් වේ.

යම්කිසි ගුරුවරයෙක් ශිෂ්‍යයන්ගේ සියලුම පාඩම් ක්‍රීඩා මාර්ගයෙන් ඉගැන්වීම පිළිවෙල කරගන්නේ නම් එය සියලුම ඉගැන්වීම් ක්‍රමවලට වඩා ප්‍රියජනක එකක්වන බව නොඅනුමානයි.

මෙම ලිපිය මතභෙද ඇතිවීමට හේතුවිය හැකියි. සාකච්ඡා කිරීමෙන් යහපත් තීරණයන් ඇතිකර ගන්නේයයිද මගේ අදහසයි.

දෙසැම්බර් මාසයේ මූලහරියේදී ආණ්ඩුවේ ගුරුවරුන් පුහුණු කරන ශාස්ත්‍ර ශාලාවේදී පැවැත්වූ ගුරුවරුන්ගේ සාකච්ඡාවන්ද මගේමෙ ලිපිය සම්පාදනයට උපකාරවූ බව සතුති පූර්වකවැ අවසාන වශයෙන් සඳහන් කරමි.

---

වැලිතර ආණ්ඩුවේ බාලිකා පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍යිනී
**ජී. ඒ. රාජපක්ෂ මහත්මිය විසින්**
සම්පාදනය කරන ලදී.

---

# සිංහල කාව්‍ය ශාස්ත්‍රය.

අප මාතෘකාවෙන් ගම්‍යවනුයේ, "සිංහල කාව්‍ය ශාස්ත්‍රයයි." සිංහලයන්ගේ මාතෘභාෂා තොමෝ සිංහල නම් වන්නීය.

කාව්‍ය යනුයෙන් කවීන්ගේ කෘති ගැනෙත්. 'කාවෙඃකම්' 'කවීනාං කෘතම් කාව්‍යම්' යනාදී නයිති.

අප පැරණි සිංහල වියරණයවූ "සිදත් සඟරාවෙ"හි ගත්කරනුයේ, ගත්කරු-කිවි, යනුයෙන් කවීන්ගේ ලක්ෂණ දක්වන ලද්දේ වෙත්. ගත්කරනුයේ ග්‍රන්ථකරන තැනැත්තේ, ගත්කරු, ග්‍රන්ථකාරකයි. කිවි පණ්ඩිතය, යනු එයින් වාච්‍යවේ. මෙනයින් ග්‍රන්ථයෝම කාව්‍ය නම්වූහ.

වැලිදු-සිංහල භාෂාමය ග්‍රන්ථ හෙවත් "කාව්‍ය පිළිබඳ ශාස්ත්‍රය" "සිංහල කාව්‍ය ශාස්ත්‍රය"යි දතයුතු.

එක් අයුරකින් කාව්‍යයෝ ද්විවිධ වෙත්. මහා කාව්‍ය සහ ඛණ්ඩ කාව්‍ය යනුවෙනි. ඔව්හු තුමූ අන් අයුරකින් ත්‍රිවිධ වන්නාහ. "ගද්‍ය" "පද්‍ය" සහ "මිශ්‍ර" හෙවත් "චම්පූ" යනුයෙන.

"සිංහල කාව්‍ය ශාස්ත්‍රය" කවරක් අවලම්බනය කොටගෙන වීද යනු ආධුනිකයන් විසින් වෙසෙසා දතමනාය, සංස්කෘත කාව්‍යශාස්ත්‍ර න්‍යායයෝම සිංහල කවීන් විසින් අනුගමනය කරන ලදහුය යනු, සුධීන්ගේ පිළිගැන්ම වෙයි. මාගධි කාව්‍යන්‍යායයෝ සංස්කෘත කාව්‍ය න්‍යායයන්ට සාම්‍යය ඇත්තෝ බුධ සාමයික පුරාතන සිංහල විදග්ධයෝ ඒ න්‍යායයන්ද ප්‍රභූතියෙන් ගත්හු. ඒ මතුද නොව ඔව්හු

මගද සකු ඇ බණ
සමවූ බස නසම නම්
බිදුනෝ තබව නම් වී
විමසා දනු එහි පියෝ ~~~ යි.

දැක්වෙන මතය සම්භාව්‍ය වශයෙන් සැලකූහ. මාගධ සංස්කෘතාදිවූ ශබ්දයන්ට සාම්‍ය ඇති ශබ්දයෝ තත්සම යයිද, ඔවුන්ගෙන් භින්නවූවෝ තද්භවයයිද ගත්තානුය යන තාක්, සිදත් සඟරුවෙහිවූ මෙම නයෙන් හැගේ.

“සිංහල කාව්‍ය ශාස්ත්‍රය” හදාරන්නවුන් විසින් සිංහල ව්‍යාකරණ ඡන්දෝලඞ්කාර, දශප්‍රාණ, දශමහා දෝෂාදීවූ හැමෙකක්ම ප්‍රගුණ කරගත යුතු සිංහල කාව්‍ය ඉතිහාසය පිළිබඳ පරිඥනයද කවිත්වය පිණිස වුවමනාය.

පුරාතනයෙහි සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ කීපයක්ම තිබුන බවට නොඑක් සාධක වෙත්. ඔවුනතුරෙන් ශෙෂවූයේ “සිදත් සඟරුව පමණෙක. “සිදත් සඟරුව” ප්‍රගුණ කර ගැන්ම සිංහල ව්‍යාකරණ ඥණය ඔප්නගා ගැන්මෙකි.

අලඞ්කාර ග්‍රන්ථයක පරිවර්තනයක් පමණෙකැයි සලසා ගත යුතුවූ අලඞ්කාර ශාස්ත්‍රාඞ්ගය දැක්වෙන එකම කාව්‍යයෙක් අපට ඇති. හේ සියබස් ලකරය මේද අප අභාග්‍යයෙකි.

සිංහල භාෂාවෙන් දශප්‍රාණ, දශමහා දෝෂාදිය දක්වන ග්‍රන්ථයෝද දුලබවෙත්. ‘දශමහාදෝෂය’ නම්වූ නූතන ග්‍රන්ථය මෙතන්හි අමතක නොකළයුතු

භාෂාවක සාලඞ්කාරික කාව්‍යයෝ එ භාෂාවගේ සාහිත්‍ය යයි ගැනෙත්. මෙනයින් සිංහල කාව්‍යයෝම “සිංහල සාහිත්‍යය”යි ගතයුතු. සිංහල කාව්‍ය ශාස්ත්‍ර ඥනය පිණිස ඒ මේ සිංහල සාහිත්‍යය මැනවින් හැදෑරිය යුතුය. ඒ හැදෑරීමේදී විපරිණාම ධර්මයේ ඡායාරූපයවූ ඒ පිළිබඳ ඉතිහාසය වෙසෙසා දතයුත්තේය. එ දැනගත් තැනැත්තේ ශ්‍රෙෂ්ඨ කවිත්වයෙහි පිහිටියේ වේ.

මෙ කියන ලද සියල්ල සිංහල කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ හැඟීම් ඇතියවුන්ට අවිෂය නොවේ. දැන් අන් අයුරකිනි.

වර්ණ සංස්ථාන ආභරණාදී සියල්ලෙන් මනා දැකුම් ඇති ශරීරය හුදු කැලමලෙකින් ශ්‍රී සූන්‍යවේද? එමෙන්ම ගුණාලඞ්කාරාදියෙන් හොබනා කාව්‍යමය ශරීරයෙහිදු, මඳවූ දෝෂයෙන් පවා කාව්‍යශ්‍රී සූන්‍යවෙයි

මේ කාව්‍ය ශරීරය යනු කවරේද? කවීහු විසින් කැමැතිවන ලද අර්ථයෙක්හි පිහිටුවූන ලදවූ ශබ්ද පඞ්ක්තිය.

කාව්‍යයෝ තුමූ මහා කාව්‍ය, මුක්තක, කුලක, කොෂ සහ සංඝාත යනු යෙනුදු විශෙෂ වෙත්.

මහා කාව්‍ය යනුයෙන් සගී වශයෙන් බඳනා ලද්දම අදහස් කරන ලද්දේ යම්සේද එසේම මුක්ත කාව්‍ය යනුයෙන් විදග්ධයන්ගේ ප්‍රීත්‍යුත්කර්ෂය පිණිසවූ අන්‍යයක් හා සම්බන්ධත්වය නොමැති එකම ශ්ලෝකයක් අදහස් කරන ලදය. එකම ක්‍රියාවක් අපෙක්ෂා කරන්නේ යමෙක්ද හේ කුලක නම්.

උනුනුන් අපෙක්ෂා නොකරන (සම්බන්ධත්වය නොමැති) පද සමූහය කොෂ නම් වේ.

සංඛ්‍යාකාලාදි එක් අර්ථයක් එකම වෘත්තයකින් වර්ණනා කෙරේද, හේ සංඝාත කාව්‍යය යි.

ගද්‍ය පද්‍ය විශෙෂයද මෙතන්හි දතමනාමය.

වෘත බන්ධනයෙන් හරනා ලදවූ හෙවත් ඡන්දස් රහිතවූ වාක්‍යය ගද්‍ය නම්.

වෘත නියමය ඇති පද කොනෙකුන්ගේ සමාහාරය පද්‍ය නම් වේ.

පද්‍ය කාව්‍යයන්ගේ අනෙක් විභෙදයෙක්ද වෙයි. අක්ෂර ගණනින් බඳනා ලද ශ්ලෝකාදිය වෘත්ත පද්‍යාත්මක යයිද, මාත්‍රා ගණනින් බෙදන ලද්ද ජාතිපද්‍යාත්මක යයිද යන නයින් වේ.

## කවීන් විසින් වෙසෙසා කළයුතු දශමහා දෝෂයෝ.

---

(1) අපාර්ථ, (2) ව්‍යර්ථ, (3) එකාර්ථ, (4) සංශය, (5) අපක්‍රම, (6) ශබ්දහීන, (7) යතිභ්‍රෂ්ට, (8) භින්නවෘත්ත, (9) විසන්ධි සහ (10) විරොධ යන මොහු වෙත්.

ඔහු විසින් හළයුතු විරොධිහු ෂඩ් විධවෙත්. උහුනම් (1) දෙශවිරොධි, (2) කාලවිරොධි, (3) කලාවිරොධි, (4) ලොකවිරොධි, (5) න්‍යාය විරෙධි සහ (6) ආගම විරෙධිද වෙති.

දැන් කාව්‍ය විශෙෂ සංක්ෂෙපයක් දක්වමි. කාව්‍යයෝ එක් අයුරකින් ද්විවිධයහයිද, අන් අයුරකින් ත්‍රිවිධයහයිද, පළමු සඳහන් කෙළෙමි. ඔවුන්ගේ ආදියෙහිවූ මහා කාව්‍ය සංඛ්‍යාවෙහි ගැනෙණ, එකම කාව්‍යයෙක් අපට ඇති හේ "කාව්‍යශෙඛර" නම.

ගී, සැහැලි, එලි සහිත සතර පදසහ සොළෝ ආදියෙන් යුක්ත සෙසු හැම සිංහල රචනාවක්ම පමණ නොව, ගද්‍යමයවූ හැම සිංහල රචනාවක් මත් ඛණ්ඩ කාව්‍ය සංඛ්‍යාවෙහි ගැනෙත්. සගීවශයෙන් නොවූ හෙයිනැයි පළමුකී නයින් සලකාගතයුතු.

"ගද්‍ය" "පද්‍ය" දෙකින් මිශ්‍රවූවෝ-මිශ්‍ර කාව්‍ය හෙවත් ,,චම්පූ" සඞ්ඛ්‍යාවෙහි වන්නාහ. මෙහෙයින් සිංහල සන්දේශ කාව්‍යයෝ පවා මිශ්‍ර කාව්‍යයෝයි.

ත්‍රිවිධ කාව්‍ය පිළිබඳවූ මේ සංක්‍ෂෙප සිංහල සාහිත්‍යය පිළිබඳ හැඟීමක් ගෙනදෙන්නේ වේ. ඒසාහිත්‍ය ඉතිහාසය දෙසද බලමු.

සිංහල වර්‍ණමාලාව ආදියෙහිම පැවති තත්‍වයද, ඉන්පසු කාලාතික්‍රමණයෙන් වෙනස්වූ අයුරුද සෙල්ලිපි හේතුකොටගෙන අපට මැනවින් ප්‍රත්‍යක්‍ෂ වේ. මේ සෙල්ලිපි පරම්පරාව සිංහලවූ අප භාග්‍යයෙක. දඹදිව විනා මෙබඳු සෙල්ලිපි පරම්පරාවෙක් අන්කිසිත් රටෙක නැති පුරා වස්තුවක් උපදනා අනුමිතිය ඉතිහාසය විසින් ප්‍රත්‍යක්‍ෂබවට පෙරලනු ලැබේ. අප ශිලාලිපි පරම්පරාව එයට සාධකයෙකි. සිංහල කාව්‍ය ශාස්ත්‍රඥනය අපෙක්‍ෂාකරන තැනැත්තෝ අප ඉදිරියෙහි අතීත සිංහල වර්‍ණ ඥනය මවා දක්වන සෙල්ලිපි උගත යුත්තෝමය.

අක්‍ෂර ප්‍රභෙද නම්වූ ශික්‍ෂාව හා නිරුක්තියද, නිඝණ්ඩුද වර්‍ණ පද බන්ධන පද්‍යඡ්ඡාදිය හා ඡන්දෝලඞ්කාරාදියද, වෙසෙසා පරිශීල නය කළ හෙතෙමේ ව්‍යාකරණාර්ථ වශයෙන් භාෂා පරිඥනය ඇත්තේ වෙයි.

සිංහල සාහිත්‍යෙතිහාසය පිළිබඳ ඒ ඒ සමයයන් දෙස බලන හේතෙමේ, තම සමයානු රූපවූ රචනා කර්මයෙහි යෙදෙන්නේයි. කවියෙකු කෙරෙහි පිහිටිය යුතු මෙ අඞ්ගසම්පත්තිය ඇති තැනැත් තෙකු විසින්ම ප්‍රභූතිබයෙන් බබලන ගද්‍ය කාව්‍යයක් හෝ පද්‍යකාව්‍ය යක් නිපදවිය යුතු.

මම මෙහි සිංහල සාහිත්‍යෙතිහාසයෙන් බිඳක් පමණක් ගෙණ දක්වනු කැමැත්තෙමි. කාලය සලකා ගෙනය.

ආදියෙහිම නිපදවන ලද සිංහල කාව්‍යයන්ගෙන් අපට ශෙෂව ඇත්තේ ඉතා ටිකෙක. එළු දළදාවංශය ආදියයි.

සියබස් ලකරද ඒශෙෂයෙහි වේ. දඹදෙනි සමයයේ නිපදවන ලද කාව්‍යයෝ අතිශය ප්‍රභූතබයෙන් යුක්තව බබලන්නාහයි සුධීන් ගේ පිළිගැන්මයි. සිංහල කාව්‍යයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨයයි ගැනෙන කව් සිළුමිණ එසමයෙහි නිපදවන ලද්දෙක. පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේ ගද්‍යසම්ප්‍රදාය සලකමු. යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි යනාදී වශයෙනි.

මෙහිවූ ප්‍රසාදවාහක ගුණය වෙසෙසින් සැලකිය යුතු. ගැඹුරු සංස්කෘත පද කැටිකොට ගද්‍යතනාලීම භාෂාපටුත්වය ඇතියෝ අභිමත නොකළෝ. හේ නිරුක්ති ශාස්ත්‍රය දත්තවූන්ට අභිමතවී.

මෙසමයයෙහි විසූ කවියෝ නිරුක්ති ශාස්ත්‍රඥයෝ වූහ. මෙසමයයෙන් පසු ක්‍රමයෙන් ඒ ශාස්ත්‍රඥානය පිරිහෙන්ට වන් බව පෙනේ.

කෝට්ටේ සමයයෙහි නිපදවන ලද කාව්‍යශෙඛරය නම්වූ එකම සිංහල මහා කාව්‍යයත් අනෙක් ඛණ්ඩ කාව්‍යයෝත් උසස් කෘතිහු වෙත්.

සෙංකඩගල සමයෙහි නිපදවන ලද කාව්‍යයෝ නිරුක්ති අතින් පබුඩවක් නොමැත්තෝය.

ඉතික්බිති පහළවූ බොහෝ ඛණ්ඩ කාව්‍යයෝ වත්මන් සමය ආදියෙහි බිහිවූවෝ වෙත්. ඔව්හු තෙරුවන් මාලාව, ප්‍රාතිහාර්‍ය ශතකය, සියබස් මල්දම, කව් මුතුහර, කව්දීපනීය, කව්මිණි කොඩල, මකරධ්වජය ආදිහුය මොවුන්ගෙන් පසු ගඞ්ගාරොහන වර්ණනාව සහ එහිවූ රචනාවක් නිසා ඇතිවූ වාදයද හෙළදිව් අභිධානවතාදියද ආධුනික ජනතාවට විපුලාර්ථයක් සැලසූ.

මෙසමය පිළිබඳව කිවයුත්තෙක් ඇත. ඒ වනාහි සංස්කෘත රචනා අනුව හෙළු සොළෝ රචනා කිරීම් ඇතිවූ බවය. ආදියෙහිම ගී රචනාවෙන් ඇරඹුණු සිංහල පද්‍යරචනා රීතිය, අනරෙක අවසන් එලිසහිත චතුෂ්පාදාදියටද පෙරළී යළිත් සොළෝ රචනාවටද පෙරළුණු අයුරුවේය.

තවත් කියයුත්තක් ඇත. ඒ වනාහි නාට්‍යයන්ද කාව්‍ය සඞ්ඛ්‍යාවෙහි එනම් මිශ්‍ර කාව්‍ය සඞ්ඛ්‍යාවෙහි ගැනෙන බවය.

නාට්‍යයෝ විවිධවෙත්. රූපක සහ උපරූපක නමිනි. ඔව්හුද යළිත් භෙදවෙත්. නාට්‍යයක් රචනා කිරීමේදී කවිගණයෙහිමවූ චිත්‍රඥයා සහ ගීතඥයා සියැස් හමුයෙහි තබාගතයුතු. චිත්‍රඥයා වනාහි ස්වභාවධර්ම සෞන්දර්‍යය මවා දක්වන තැනැත්තේය. ගීතඥයා සවන් හා එහෙයින්ම සතතුදු පිනවන තැනැත්තේ වේ.

මේ ලිපිය මගින් කාව්‍ය ශාස්ත්‍රය ශීඝ්‍රකොට ගෙන ඒ පිළිබඳ මාරමක් ගසා පෙන්වනුවිනා ඉන් වැඩියක් අපෙක්ෂා නොකෙළෙමි. කාව්‍ය ශාස්ත්‍රය කොතරම් විශාල සාරවන්නේද; ගැඹුරතර වන්නේද, එය රටක හා ජාතියක සිළුටුදම් පරපුරක් ඇතිකර ලීමට කොතරම් ඉවහල් වන්නේද සහ අවශ්‍ය වන්නේද යනාදිය පිළිබඳ හැඟීමක් මගේ මේ කෙටි ලිපියෙන් ඇතිවේනම් මම එතෙකින් තෘප්තියට පැමිණෙන්නෙමි.

ආදියෙහිම ගී බන්ධනයක්, ඉනික්බිති එලිසහිතවූ සහ රහිතවූ සතර පදදී බන්ධනයන්, වත්මන්හි එසියල්ල හා සොලෝ බන්ධනයන්වූ හයිද මෙතන්හි සැලකුවමනාය.

එමෙන්ම ඡන්දස් ශාස්ත්‍රඥත්‍වය පිණිස අපට එළු සඳැස් ලකුණ නම්වූ ග්‍රන්ථය ඇතැයිද සැලකිය යුතු.

කව් ලකුණු මිණ ආදී පැරණි ග්‍රන්ථහැර මෑතක පහලවූ හෙලදිව් අබිදනවතද කාව්‍ය ශාස්ත්‍රාභි ලාෂීන්ට ප්‍රතිෂ්ඨා පිණිස වෙත්. ගුරුළු ගොමීන්ගේ කෘති දෙසටද කාව්‍ය ශාස්ත්‍රාභිලාෂීන්ගේ මනැස් වෙසෙසින් යොමුවිය යුතු කාලයවනැයි සිතමි. නිරුක්ති ශාස්ත්‍රානුකූලවූ වාක් සම්ප්‍රදායට ඔව්හු ප්‍රතිෂ්ඨා පිණිස වන්නෝමය. ඒ රීතීන්ගෙන් බැහැරව රචනා කරනු ලබන ගද්‍යයෝ බිය කරුය. ප්‍රතිෂ්ඨා රහිතද වන්නෝයි.

කාව්‍ය ශාස්ත්‍ර ශීෂියෙන් යුක්තවූ ලිපියක් වශයෙන් නම් මේ ලිපිය ඉතා ලුහුඬුය. පිටු සියගණනකි නමුදු ඒ ශීෂියෙන් ලියයුතු කරුණු ඇත්තාහ. කාලසීමාව හා සංක්‍ෂෙප වියයුතු බව් යනාදිය සලකාගත් මම මේ ලිපියෙන් කාව්‍ය ශාස්ත්‍රාභිලාෂීන්ට ඒ ශාස්ත්‍රය පිළිබඳ හැඟීම් මාත්‍රයක් ගෙනදී ඔවුන්ගේ මනැස් එදෙසට යොමුකරවා ලන අදහස පමණක් ඇත්තීවිමි එහෙයින් මෙහිලා ප්‍රභූතවයෙක් නම් නැති.

අවසන් වශයෙන් 12 වෙනි ශතවෂියේ නිර්මිත ගල්පොත සෙල්ලිපියේ දක්නට ලැබෙන කවක් ඉදිරිපත් කරමි. හේ මෙසේය:–

දහම් නමේ මේ මුළුලොසගන්නෙ යැ
සිතා දෙලො සැපත් අදරැති කරන්නෙ යැ
මතුවන රජවිරුන් මෙසේ අයද නෙ යැ
කාලිඟු ලකි(න්)දු නිසක රජ ගුණ නන්ද නෙ යැ

දූන් වනාහි විසිවන ශතවෂියයි.

ඔර්ලෝසුවක කටුව පෙරළා කරකැවීමෙක් නැති. භාෂාවන් පිළිබඳ ධර්මතාවද එසේමය.

මෙපමණකින් මම සභාවට මගේ සමාචාරය පවත්වමි.

ගෝනගල ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේ උපාචාර්ය
**ආර්. ඒ. ඩී. සිරිසේන මහතා**
විසින් සම්පාදනය කරන ලදී.

# ලක්දිව පුරාතන ජලකර්මාන්තය.

## ජලය.

මනුෂ්‍ය තිරශ්චීනාදී සත්ත්වයන්ගේ පමණක් නොව වෘක්ෂලතාදීන්ගේද සම්භවයටත් වර්ධනයටත් පරම ප්‍රත්‍යයවූ ජලය වනාහි ලොකයාගේද පැවත්මට ඉවහල්වූ ප්‍රධාන වස්තු සතරෙන් එකකි. ආසියා මහාද්වීපයේම හටගන්නා යම් ද්‍රව්‍යයක් නොමැතිව යුරෝපාදි අනික් දිවයින්වලද ඒ දිවයින්වල හටගන්නා යම් ද්‍රව්‍යයක් නොමැතිව ආසියාවේද යමෙකුට ජීවත්විය හැකිය. බිම් අඹුරු ටික නැත්නම් යුරෝපීයයාට ජීවත්වීම දුෂ්කර වුවද අපට නම් එය කොහෙත්ම වුවමනා නොවේ පූර්වාපර ධාන්‍යවර්ග නැතිව ජීවත්වීම අපට දුෂ්කර වුවද අන්‍ය බොහෝ ජාතීන්ට ඒවායේ වගක්වත් නැත්තේය. **මේ මෙසේ වුවත් ජලය නැති කාන්තාරවල** ජීවත්වීම නොහැකිය. ද්‍රව ධාතුහුගේ අනුග්‍රහය නැතහොත් මේ ලොකය තනිකර මුඩු බිමකි. නා නා වර්ණ වෘක්ෂ ලතාදීන්ගේ පැවැත්මක් නම් නොවිය හැකිය. ජීවත්වීම සඳහා පමණක් නොව ඇතම් සාමයිකයන්ගේ සිරිත් විරිත් සඳහාද ජලය අත්‍යාවශ්‍යකය. සමහර ලබ්ධිකයන් ස්වකීය ආගමික ප්‍රතිපත්තියක් වශයෙන්ම දවසකට තෙවරක් ජලාවගාහණය (දියට බැස පවිත්‍රවීම) කරණ බවද මුස්ලිම් භක්තිකයන්ගේ සියලුම පල්ලිවල ප්‍රමුඛස්ථානයෙක්හි ජලාශයක් සපයා ආගමික සිරිත් පැවැත්වීමේදී නිතරම උදකසුද්ධිය අපෙක්ෂා කරන බවද ප්‍රසිද්ධය. මේ වූ කලී සාමයික විධානයන්ට අනුව ජලයෙන් ප්‍රයෝජන ලබන ආකාරය දක්වීමට නිදර්ශනයෝයි. අප්‍රිකාව, ඕස්ත්‍රේලියාව ආදී ඇතම් මහා ද්වීපයන්හි විශාල ප්‍රදෙශයන් ජනවාසයෙන් තොරව කාන්තාර බවට පැමිණීමේ ප්‍රධාන හේතුව ජල දුර්ලභතාවම යයි සලකනු ලැබේ. රටක් සුභික්ෂවීමටත් සුඛිතවීමටත් සමප්‍රමාණයේ පවත්නා ජලය පමණ අන් කිසිවක් උපකාර නොවේමය.

දඹදිව ඇතම් ප්‍රදෙශයන්ට සුදුසු පමණ ජල ලාභය නැති හෙයින් ප්‍රවේසමින් ජලය පාවිච්චි කළයුතුව තිබේ. ඔවුන්ගේ කෘෂිකර්මය සඳහා ජලය ලබාගැනීමේදී නොයෙක් අවුල් වියවුල් ඇතිකර ගනිති. යුද කොලහල පවා කරති. අන්‍යයන් තබා ශාක්‍යයන් පවා ජලය කරණකොට හටගත් හෙදයකදී කොලිතයන් හා බිහිසුණු යුද පැමිණි බවත් ශාක්‍ය සිංහවූ බුදුරජාණන් විසින් එය වලක්වනලද බවත් ග්‍රන්ථාරූඪය. මෙසේ ජල යෙහි අගය වෙසෙසින් දත් දඹදිව් වැස්සෝ ජලය නවත්වා ගැනීමට වැව්ද ඉවත්කොට හැරීමට සොරොව්ද තැනීම ආරම්භ කළහ. සියලු දෙයම දඹදිවින් ලැබීමේ පුරුද්දට යටත්වූ ලාඞ්කිකයන් මේ ජලකර්මාන්ත විධියද දඹදිවින්ම අභ්‍යාස කර ගන්නා ලද බව සිතිය හැකිය. මෙසේ දඹදිව පුවත සඳහන් කරන්ට අවශ්‍යවූයේ දඹදිව් වැස්සන්ගේම ජල කර්මාන්ත විධිය ලඞ්කාවටද පැමිණි බව සඳහන් කිරීමටය. එහෙත් දඹදිව වැව් ගැනයමක් මෙහි සඳහන් නොකරමි.

ශ්‍රී ලඞ්කා විපයෙහි රාජ්‍ය ශ්‍රී අනුභව කළාවූ සෛංහලීය නරශ්‍රෙෂ්ඨයන් එක්සිය පණස් හදෙනා අතුරෙන් කීපදෙනෙකුන්ගේ කාලයන්හිදී ලඞ්කා රාජ්‍යය ඉතා සමෘද්ධිමත් භාවයෙන්ද ධන සම්පත්තියෙන්ද යුක්ත විය. ලඞ්කාවේ උතුරු කෙළවරේ සිට දකුණු කෙළවර දක්වා භූමිය සාරවත් භාවයෙන්ද දර්ශනීය භාවයෙන්ද යුක්ත වූවාය. වනයෙන් වැසීගිය පෙංදෙස් වනාහි බඳනාලද වැව්වල ජලයෙන් වර්ධනයවූ නීලවර්ණ ගොයමින් යුත් සමභූමින් කෙරෙන් උස්ව නැගී සිටියාහුය. වර්ෂ සැතැප්ම දසදහසකටත් වැඩි මානයක ගොවිකම දියුණුවී පැවැත්තේය. විශාලවූ කෙත්වතු සමූහයෙන් චක්ෂුර් පථය ඉක්ම සිටියාහුය. මේ සියල්ලටම ප්‍රධාන හේතුව වූයේ එවකට මනා අනුමින් කරවන ලද ජල කර්මාන්තයයි.

## ප්‍රථම ජල කර්මාන්තය.

---

බුඩ වර්ෂ 107 දී ලඞ්කා රාජ්‍ය පදප්‍රාප්තවූ පණ්ඩුකාභය රජතුමන් විසින් කරවනලද අබය වැව ප්‍රථම ජලකර්මාන්තය වශයෙන් දැක්විය යුතුව තිබේ. මෙය දැනට අනුරාධපුරයේ රුවන්මැලි මහසෑයෙන් පශ්චිම දිශාභාගයේ දක්නට ලැබේ. මෙහි විශාලත්වය අක්කර 255 ක් පමණ වේ. අබය වැව යන නාමය වෙනුවට ද්‍රවිඩ නාමයක් වූ බසවක්කුලම යන නම දැන් මීට

ව්‍යවහාර කරණු ලැබේ. පුරාවස්තු පරීක්ෂක මණ්ඩලයේද ඉතිහාසය ගරු කරන්නන්ගේද කල්පනාවට මෙය භාජනවිය යුත්තකි. මීට වර්ෂ 48 කට පමණ පෙර ආණ්ඩුව විසින් රු: 60705. 73 ක වියදමින් ප්‍රකෘතිමත් කරවනු ලැබූ මේ වැවේ ජලය පිටත හැරීමට එක් සොරොව්වක් පිළියෙල කරවනලදී. පණ්ඩුකාභය රජතුමන් විසින්ම කරවන ලද නුවර වැව අනුරාධපුර ශුඹ නුවර සිට මිහින්තලයට යන මාර්ගයෙහි සැතැප්ම දෙකකට ඈතින් පිහිටා තිබේ. මෙහි විශාලත්වය අක්කර 2960 කි. මෙහි උතුරු දිශාවේ එක් සොරොව්වක්ද බටහිර දිශාවේ සොරොව් දෙකක්ද ඇත්තාහ. 1893 දී ආණ්ඩුව විසින් රු: 51472 ක වියදමින් සොරොව් තුන ප්‍රතිසංස්කරණය කරවන ලදී. උතුරු සොරොව්වේ ගල් ලෑල්ලක වර්ෂ 1887 සහ ගෝර්ඩන් උතුමාණන් වහන්සේගේ නාමයද නුවර වැවේ උස්වූ (ජල) මට්ටමේ සොරොව්ව අලුත් වැඩියා කරන ලදී. යන්නද ඉංග්‍රීසි අක්ෂරයෙන් සටහන්කර තිබේ. දැනට අනුරාධපුර ධූම රථ ස්ථානයේ සියලු කටයුතු සඳහා වුවමනා කරන ජලය මෙම වැවෙන් ජල නළ මගින් සපයනු ලැබේ.

## තිසාවැව.

---

බුඩ වර්ෂ 235 දී රජ පැමිණි දෙවානම් පියතිස්ස මිහිපතිතුමන් විසින් කරවන ලද මේ වැව ඉසුරුමුනි විහාරයෙන් බස්නාහිර දිශාවේ පිහිටියේය. මෙය අක්කර 396 ක් විශාලය. නැගෙනහිර දිශාවේ සොරොව් දෙකක් ඇත්තාහ. වර්ෂ 2210 ක් මුළුල්ලෙහි පැවතෙන මේ ජලාශයේ සොරොව් සහ වැකන් දත් මෑතදී ආණ්ඩුව විසින් ප්‍රකෘතිමත් කරවන ලද්දාහ.

බුඩ වර්ෂ 523 දී රාජ්‍ය පදප්‍රාප්ත භාතිකාභය රජ තෙමේ පණ්ඩුකාභය රජු විසින් කරවනලද අබාවැවේ ජලය යන්ත්‍ර මාර්ගයෙන් නගාගෙන රත්නමාලී මහා චෛත්‍ය රාජයා තෙමමින් ජල පූජාවක් අත්‍යාලඩකාරයෙන් සිදු කොළේය. මෙම ජල යන්ත්‍රය වර්තමානයෙහි දක්නට ලැබෙන ජල යන්ත්‍රයන්ට වඩා විෂමය ජනකාකාරයෙන් නිපදවන ලද්දක් වියයුතුයි. මෙබඳු ජල යන්ත්‍රයක් මෙකල දකින්ට නැත්තේය යනු ඇතම් ඓතිහාසිකයන්ගේ මතයයි. බුඩ වර්ෂ 608 දී රජ පැමිණි වසභ රජතුමන් විසින් වැව් කීපයක් කරවන ලදහ. මේවා රජතුමාගේ ආයුවර්ධනය සඳහාම කාරාපිතය. රජතෙම හෝරා පාඨයන්

ගෙන් ආයු ප්‍රමාණය විචාළ කල්හි දොළොස් හවුරුද්දක් යයි කියන ලදුව භයවී සඞ්ඝයා රැස්කරවා ආයු වැඩීමට කුමක් කටයුතු දැයි විචාළේය සඞ්ඝයා වහන්සේ අනතරා විමොක්‍ෂය ඇත්තේ යයි කියා නරශ්‍රෙෂ්ඨයාණෙනි; පෙරහන්කඩ දානය ආවාස දානය, ගිලන් වැටුප් දානය, ජීර්ණාවාස ප්‍රතිසංසකරණය සහ රට සුභික්‍ෂකරවීමේ කාර්‍ය්‍යද කටයුතු බව කීසේක. රජ තෙමේ මැනවැයි ඒ සියල්ල කෙළේය. එය වැසියාටද ප්‍රයෝජනවිය. රට සුභික්‍ෂවනු සඳහා මයෙත් වැව, රජුපුල් වැව, කොලබැගම් වැව, මාතිකවිටි වැව, මාගම වැව් දෙක, කෝහාල වැව, කෝලිවාස වැව, ඇම්බිම් වැව, වාතමඟන වැව, අබිවඩ මන් වැව යන එකොළොස් වැව් හා දොළොස් මොවු ඇලක්ද කරවන ලදහ.

බුඩ වර්‍ෂ 818 දී රජ පැමිණි පින්පව් රැශියක් කළාවූ මහ සෙන් රජතුමන් විසින් ජලකර්මාන්තය සඳහා සොළොස් වැව් කරවන ලදහ. එනම්, මින්නේරි, ජල්ලූර, ඛානු, මාමිණියා, කෝකවාත, මොනර, පරක, කුම්බාලක, වාහත, රත්මල්කඩ, තිසවැ, වෙලාවිටි, මාගල්, සීරු, මහාදර ගල්ලක, කළුපහන් යන වැව් වෙත්. ඉන් මින්නේරිය වැව සැලකිය යුතු එකකි. මෙය හබරණ සන්ධියේ සිට හැතැප්ම 15 කට පමණ දුරින් පිහිටියේය. වර්‍ෂ 1608 දී රජ පැමිණි මහා විජයබාහු නිරිඳුතුමන් සමයෙහි වැවට ජලය ගලා පැමිණිය යුතු තලවතු ඔයේ බැමි බිඳීගොස් තිබුණු බැවින් මෙම ඇල බඳවා මින්නේරි වැව ජලයෙන් පිරවිය. මහා පරාක්‍රමබාහු රජු විසින්ද මෙය ප්‍රකෘතිමත් කරවන ලදී. ඒ රජු විසින් මින්නේරිය වැවෙන් දකුණු දිශාවට ජලය යැවීම සඳහා කාලින්දී නම් මාතිකාවක් කරවනලදී. දැනට මෙම වැවේ විශාලත්වය අක්කර 5400 කි. සොරොව් තුනකි. මෙහි ජරාවාස ආණ්ඩුව විසින් ප්‍රකෘතිමත් කරවන ලදී.

## කලාවැව.

වර්‍ෂ 1003 දී රජ පැමිණි ධාතුසේන මිහිපතිතුමන් විසින් මේ වැව බන්දවන ලදී. මෙය උතුරු මධ්‍යම පළාතේ දක්‍ෂිණ දිශාවේ පිහිටියේය. මීට බෙලිගමු, දඹුලු, මිරිස්ගෝනි යන ඔයවල් තුනකින් ජලය ලැබේ. පූර්වකාලයේ අඹන් ගඟේ වතුර හැණිමට ඇලක් බැඳ තිබුණේය. වැකන්දේ දුර ප්‍රමාණය සැතැප්ම 5½ කි. වැවේ විශාලත්වය අක්කර 4425 කි. සොරොව් හතරකි.මීට වර්‍ෂ 43 කට පෙරදී ආණ්ඩුව විසින් රු: 396,687. 11 ක

වියදමින් අලුත් වැඩියා කරවනලදී. කලාවැවේ ජලය තිසා වැවට ගැනීම සඳහා කනවන ලද ඇල යෝධ ඇල නමින් ප්‍රකටය මෙහි දිග සැතැප්ම 53 කි. මේ ඇලද ආණ්ඩුව මගින් අලුත් වැඩියා කරවන ලදී.

## පුරාතන ජලකර්මාන්තයේ සමෘද්ධිමත් කාලය.

ජල කර්මාන්තයේ සමෘද්ධිමත් කාල පරිච්ඡේදය වශයෙන් බුඩ වර්ෂ 1702 දී රජ පැමිණි මහාපරාක්‍රමබාහු රජතුමාගේ කාලය විශෙෂයෙන් සඳහන් කටයුතුයි. මෙම රජතුමන් විසින් පහත සඳහන් ජනහිත ආඥාවෝ ලක්දිව පතළ කරනු ලැබූහ.

I හැමට පළමුකොට බෙහෙවින් ධාන්‍ය රැස්කිරීම කටයුත්තේය.

II මැණික් රන් ආදී වස්තූන් හටගන්නා ආකර බිම්හැර සෙසු තන්හි කෙත් මොනවට පැවැත්ම කටයුතුය.

III වැස්සෙන් හටගත් ජලය මදකුත් ලොකොපකාරයෙන් වෙන්ව කිසිකලෙකත් මුහුදට යන්ට නොදිය යුතුය

රජතුමා පුරාණ වැව් සහ ජලමාර්ගයනුත් ප්‍රතිසංසකරණය කරවීමෙහිද ජල පහසුව නොමැති සෑම තන්හිම ජලය ලැබෙන පරිදි කටයුතු කරවීමෙහිද නියුක්ත වීය. පරාක්‍රම සමුද්‍රය නම් ලක් දෙවෙනි මුහුදක් වැනිවූ මහවැව කරවා කර ගහ මහත්වූ ගල්හෙයකින් අහුරා එහි ජලය ආකාශ ගංගා නමැති මාතිකාවකින් එම වැවට පැමිණ විය. අනර්ඝ රාජ ප්‍රාසාදයක් වැනි ද්වීපතක් වැවේ මධ්‍ය භාගයේ කරවීය. ගලින් කරන ලද දුර්ගීමවූ ශත හසත ප්‍රණාලිකාවක් ඇත්තාවූ පරාක්‍රම තඩාග නම්වූ මහවැවද මිහිඳුතලා එකාහවාපි පරාක්‍රම සාගර තොටුබද ගඟුල්හැලී යන වැව්ද තවත් නොයෙක් තන්හි එක්දහස් සාරසියඑක් සැත්තෑවක් කුඩා වැව්ද කරවූයේය. එසේම නරපතිතුමා තුන්සියයක් පමණ වැව්වල එපමණම ශෛලමයවූ ප්‍රණාලිකාවන් කරවූයේය. බිඳුණාවූ බොහෝවූ පුරාණ වැව්ද බැන්දවීය. මින්නේරිය මහවැවද මහාදූරගල්ලක සුමන්තිස් දූරතිස්ස කලා බමුණුගම්, නෙරළු, මහවැම්, රෙහෙර, ගිරිතලා, කිඹුල්හෙබ් කණු පදි, කටිගම්, පත්පහන්, මහණණ, මහනම්මන වඩුන්නා, මාදූන්නෑ, කණගම් වීර වලස් සූරමාන, පහන්ගම්, කළුවැල්, කාහල්ලී, අභගම්, ගිලිපත්කඩමදගු යන වැව්ද

ජීර්ණවූ තවත් වැව්ද ප්‍රකෘතිමත් කරවූයේය. තවද නටුවාවූ සාරසිය සැටසතක් කුඩා වැව්ද ප්‍රතිසංසකරණය කරවීය. නොයෙක් වැව්වල එක්දහස් තුන්සිය අනූපසක් බිඳුනු තැන් දන්නාවූ රජතෙම ඒවා ස්ථිරලෙස බැන්දවිය. පරාක්‍රම සමුද්‍ර නම් වැවට මකරනම් මුඛයෙන් නික්මුණාවූ ගම්භීර නම් මාතිකාවක් කරවිය. ඒ මුඛයෙන්ම මහමේවනයට අභිමුඛවම නික්මුණාවූ හේමවතී නම් මහා මාතිකාවක්ද කරවිය. එම පරාක්‍රම සමුද්‍ර නම් වැව මාලිනී පුෂ්ප නම් ප්‍රණාලිකාවෙන් නික්මුණාවූ නීලවාහිනී යයි ප්‍රසිද්ධවූ මාතිකාවක්ද එසේම කීලාකරු සපාන නමවූ ප්‍රණාලියෙන් නික්මුණාවූ සලලවතී නම් මාතිකාවක්ද වෙතුවතී නමින් ප්‍රසිද්ධවූ ප්‍රණාලියෙන් බැස ගියාවූ වෙතුවතී නම් මහා මාතිකාවක්ද දක්ෂිණ ප්‍රණාලිකාවෙන් බැස ගියාවූ තුඟභද්‍රා නම් මාතිකාවක්ද මඞගල නම් ප්‍රණාලිකාවෙන් බැස ගියාවූ මඞගල ගංගා නම් මාතිකාවක්ද චණ්ඩි නම් දෙර ප්‍රණාලිකාවෙන් නික්මුණාවූ චම්පා නම් මාතිකාවක්ද තෝය වැවෙන් නික්ම පූර්ණවඩ්ඪණ නම් වැවට ගියාවූ සරස්වතී නම් මාතිකාවක්ද ඒ වැව පශ්චිම දිගින් නික්මුණාවූ වෛණුමතී නම් මාතිකාවක්ද පූන් වඩුන්නා වැවෙන් පශ්චිම දිශාභිමුඛව ගියාවූ යමුනා නම් මාතිකාවක්ද උතුරට අභිමුඛව නික්ම ගියාවූ සරභූ නම් මාතිකාවක්ද ලඞකොෂ්ඨකය මැදින් ගියාවූ චන්ද්‍රභාගා නම් මාතිකාවක්ද ජේතවන විහාරාන්තයෙන් නික්ම ගියාවූ නර්මදා නම් මාතිකාවක්ද එම වැව උතුරට අභිමුඛව එසේම නික්ම ගියාවූ නෙරඤ්ජරා නම් මාතිකාවක්ද අනවතප්ත නම් වැවෙන් නික්ම ගියාවූ භාගිරථී නම් මාතිකාවක්ද එයින්ම දකුණු දිගට අභිමුඛව නික්ම ගියාවූ ආවතී ගංගා නම් මාතිකාවක්ද අම්බාල වැවෙන් උතුරු දිගට ගියාවූ තම්බපණ්ණී නම් මාතිකාවක්ද මහවැලිගඟින් පශ්චිම දිගට අභිමුඛව ගියාවූ බොහෝකල් දුර්භික්ෂ නසන්නාවූ අචිරවතී නම් මාතිකාවක්ද එයින් නික්ම නැගෙණහිරට අභිමුඛව ගියාවූ ගොමතී නම් මාතිකාවක්ද උතුරු දිගට අභිමුඛව නික්මුණාවූ මලාපහරිණී නම් මාතිකාවක්ද අචිරවතියෙන් නැගෙණහිරට අභිමුඛව ගියාවූ යතරුඹ නම්වූද නිබ්බින්ද නම්වූද ධවල නම්වූද සීද නම්වූද මාතිකාය මින්නේරි මහාවැව දක්ෂිණ වාරිමාර්ගයෙන් දකුණු දිගට අභිමුඛව ගියාවූ කාලිඤ්ඤ නම් මාතිකාවක්ද එසේම ගිරිතලා නම් වැවෙන් කඳුරුවඩමන් තඩාගයම ගියාවූ කාවේරි නම් මාතිකාවක්ද කඳුරුවඩමන් වැවෙන් බැස අරිමද්ද විජය නමට ගියාවූ සෝමවතී

නම් මාතිකාවක්ද ඒ මහීපාල තෙම කරගහින් නික්ම පරාක්‍රම සාගර නම් වැවට ප්‍රවිෂ්ටවූ ගොදාවරී නම් මාතිකාවක්ද කරවූයේය.

රජතෙම කලාවැවෙන් නික්ම අනුරාධ පුරයට ගියාවූ නටුවාවූ ජය ගංගා නම් මාතිකාව ද කුඩා මාතිකාවන් පන්සිය සූතිසක් ද නටුවාවූ මාතිකා තුන්දහස් තුන්සියයක්ද ප්‍රකෘතිමත් කරවූයේය. ක්‍රි: වර්ෂ 179 දී අන්තිම වරට සිංහලේ රජදරුවන් විසින් බන්දවන ලද වැව ශ්‍රීවික්‍රම රාජසිංහ රජතෙමේ බැන්දවූයේය. ඒ කාලයේදී රාජ්‍යය සංක්‍ෂොභ බොහෝ වියවුල් ඇතිවූහ. වැසියාගේ ශුභ සිද්ධිය සඳහා වැඩිපුර වැඩකිරීමට රජතුමාට අවකාශ නොමැතිවිය. පුරාතනයේදී ජලකර්මාන්තය විශෙෂයෙන් කරවන ලද්දේ වර්ෂාවෙන් හීන ප්‍රදෙශයන්වන උතුරු උතුරු, මැද යන පළාත්වල සහ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව යන ප්‍රදෙශවලය. මෙම ප්‍රදෙශයන්හි වැව් බැන්දවීම නිසා එක් සෘතුවකදී පමණක් ලබන සුළු වර්ෂා පතනය ඒ ප්‍රදෙශවාසීන්ට ගොවිතැන් කටයුතු කරගැනීමට ප්‍රයෝජන විය. එක් එක් සෘතුවල වැසිඑල වැඩියෙන් ඇති බස්නාහිර මධ්‍යම පළාත්වල කෘෂිකර්මාන්තය වියලි ප්‍රදෙශයන්හි පමණ සාරවත් නොවීය. නියම කාලයට සමහරවිට වැස්ස නැතිවීමත් වැසිඑල වුවමනා ප්‍රමාණයට වඩා අධිකවීමත් නිසා ගොවිකර්මාන්තයට පහර වදින වාරද බොහෝය. වියලි ප්‍රදෙශයන්හි ජලය සුරක්‍ෂිත කිරීම නිසා පුරාතනයේදී අනුරාධපුරය, පොළොන්නරුව ආදී නගර සිංහල රජදරුවන් කීප දෙනෙකුගේ රාජධානි වශයෙන් පැවතුනේය. රාජධානිවල පශ්වාද් භූමි ජනාකීර්ණවූහ. ඊට හේතුවූයේ ඒ ප්‍රදෙශවල මනුෂ්‍යයන්ගේ ජීවිතාරක්‍ෂාව සඳහා ආහාරය ප්‍රයෝජන වූයේම වැව් ජලය සුරක්‍ෂිත කොට තැබීමෙන් විපුල ප්‍රයෝජන ගැනීමයි.

ලංකාවීපය උතුම් ඉංග්‍රීසි ආන්ඩුවට අයත්වූ පසු වැඩි වශයෙන් කරවන ලද්දේ සිංහල නරපතිතුමන් විසින් කරවන ලද මහාසාගර වැනි වැව් ප්‍රකෘතිමත් කරවීමයි. මෑතදී විශාල වියදම කින් අවට ප්‍රදෙශයෙහි අක්කර දහස් ගණනක් වැඩකළහැකි කොග්ගල්ලේ වැව බන්දවා තිබේ.

## පුරාතන ජලකර්මාන්ත ගැන උතුමන්ගේ අදහස්.

---

වර්ෂ 1877 ජනවාරි මස ශ්‍රීමත් විලියම් ග්‍රෑගරි ආන්ඩුකාර තුමා එංගලන්තයේ මහලේකම් තුමා වෙත ලංකාවේ වැව් ගැන යවනලද ලියුමක මෙසේ කියා තිබේ. මේ වැඩ වනාහි පණ්ඩිතවූද

ජනහිතවූද විධිවිධාන පිට රාජ්‍යානු ශාසනා කිරීමේ ප්‍රතිඵල වෙති. සිංහල රජවරුන්ගේ ප්‍රධාන අදහසවූයේ ජලය නිත්‍ය වශයෙන් සුලභ කිරීමයි. වර්තමාන කාලයෙහි රාජ්‍යානුශාසනා කරන්නාවූ උතුමන්ගේ පරමාර්ථයද එයම වියයුතුයි.

වර්ෂ 1881 දී **ඩික්සන් දිසාපති තුමන්** විසින් ලංකාවට ඔප්පු කරන ලද වාර්තාවක මෙසේ ලියා තිබේ. සිංහල රජවරුන්ගේ විශාරද දැනීමෙන් සහ එසමයෙහි විසූ උසස් කර්මාන්තකාරයන්ගේ දක්ෂ කම්තුත් ගංගාවල ජලය ලැබීමට සකස් කරන ලද්දාවූ දර්ශනීය වැව් වලටද ඇලවලටද එම ජලය නැවතත් හැරවීම උතුම් කාර්ය්‍යයකි.

ලෝකයේ නොයෙක් රටවල සතර වරක් සංචාරණය කළාවූ "ජී. **බිශෑලෝ**" නමැති ඇමෙරිකානු පඬිතුමා වර්ෂ 1910 දී මෙසේ කියා තිබේ. යුරෝපයෙහි යම්කිසි ශීලාචාර කමක් ඇති වන්ට ශතවර්ෂ ගණනකට පෙර උසස් ආර්ය්‍යවර්ගයා විසින් නිපදවන ලද දේවල් යුරෝපීය වර්ගයාට බලාපුදුමයට පත්වන්ට සිදුවී තිබේ, ලක්දිව ගොවිතැන සඳහා ජලය සැපයීමටකර තිබෙන වැව් කර්මාන්තය ගැන පරීක්ෂාකර බැලීමෙන් පුරාතනයන් අතරේ පැවති වැව් බැඳීමේ ශාස්ත්‍රය විෂමය ජනකබව කිය යුතුයි. පෙරවිසූ සිංහල ඉජිනේරුවන්ගේ වැඩ ඉංග්‍රීසි ජර්මන්, අමෙරිකාන් සහ ප්‍රංශ ජාතීන් විසින් වර්ෂ 1880 දී කපන්ට පටන්ගෙන 1910 දී නිමවනලද සැතැප්ම 47 ක් දික්වූ රුපියල් තිස් තුන් කෝටියක් වියදම්වූ පැනමා ඇල බැඳීමේ වැඩට සංසන්දනය කර බලන කල්හි අපේ වැඩය පෙරවිසූ සිංහල ඉජිනේරුවන්ට ළමයෙකුගේ ක්‍රීඩාවක් මෙන් වැටහී යනවා ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය